අ.පො.ස. (උ.පෙළ) විභාගය

# ඇගයීම් වාර්තාව

# 2024

23

# දේශපාලන විද්‍යාව

Curriculum
Assessment
&
Evaluation
Teaching
Learning
N E T S

පර්යේෂණ හා සංවර්ධන අංශය
ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව

# අ.පො.ස (උ.පෙළ) විභාගය - 2024

## ඇගයීම් වාර්තාව

# 23 - දේශපාලන විද්‍යාව

පර්යේෂණ හා සංවර්ධන ශාඛාව
ජාතික ඇගයීම් හා පරීක්ෂණ සේවාව,
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව.

**සියලු ම හිමිකම් ඇවිරිණි.**

**අ.පො.ස.(උ.පෙළ) විභාගය - 2024**

**ඇගයීම් වාර්තාව - දේශපාලන විද්‍යාව**

| | | |
|---|---|---|
| උපදේශකත්වය | : | ජ්.කේ.එස් .ඉන්දිකා කුමාරි ලියනගේ<br>විභාග කොමසාරිස් ජනරාල් |
| සැලසුම හා සංවිධානය | : | ඩබ්.එස්. ඩී. වීරසිංහ<br>විභාග කොමසාරිස්<br>පර්යේෂණ හා සංවර්ධන |
| විෂය සම්බන්ධීකරණය | : | ඉෂානි වෙත්තසිංහ<br>නියෝජ්‍ය විභාග කොමසාරිස්<br>පර්යේෂණ හා සංවර්ධන |
| අන්තර්ගතය සංවර්ධනය සඳහා<br>විෂයය පාදක මඟ පෙන්වීම | : | මහාචාර්ය අතුල විතානවසම්<br>පේරාදෙණිය විශ්වවිද්‍යාලය |
| ශාස්ත්‍රීය මඟ පෙන්වීම | : | ඩබ්.එස්. ඩී. වීරසිංහ<br>විභාග කොමසාරිස්<br>පර්යේෂණ හා සංවර්ධන ශාඛාව<br>ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව<br><br>ඉෂානි වෙත්තසිංහ<br>නියෝජ්‍ය විභාග කොමසාරිස්<br>පර්යේෂණ හා සංවර්ධන ශාඛාව<br>ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව |
| අන්තර්ගත සංවර්ධන කමිටුව | : | එල්. ආර්. ආර් සිල්වා<br>නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂක (සමාජ විද්‍යා)<br>අධ්‍යාපන අමාත්‍යාංශය<br><br>එච්.එම්.ඒ සෙනරත් බණ්ඩාර<br>ගුරු උපදේශක<br>කලාප අධ්‍යාපන කාර්යාලය<br>ගලෙන්බිඳුණුවැව |

සී. එම්. අනුර චන්ද්‍රසේකර
ශ්‍රී. ලං. ගු. සේ. I
අ/ වලිසිංහ හරිස්චන්ද්‍ර ජාතික පාසල
අනුරාධපුර

ඩබ්ලිව්. එම්. වයි. සී. වන්නිනායක
ශ්‍රී. ලං. ගු. සේ. 2 I
නික/ ජයන්ති මධ්‍ය මහා විද්‍යාලය
නිකවැරටිය

එච්. ඒ. එස්. සාරංග හෙට්ටිආරච්චි
ශ්‍රී. ලං. ගු. සේ. 2 II
ර/ අනුර මහා විද්‍යාලය
ගැටහැත්ත

ආර්. එම්. රූපසිංහ
ශ්‍රී. ලං. ගු. සේ. I
ගම්/බණ්ඩාරනායක විද්‍යාලය
ගම්පහ

ඩබ්. සුදත් සුනිමල්
ශ්‍රී. ලං. ගු. සේ. I
ගා/මහාමායා බාලිකා මහා විද්‍යාලය
හික්කඩුව

ලේඛන සහාය : ඒ. එල්. කේ. චතුරාණි
කළමනාකරණ සේවා නිලධාරී

පරිගණක පිටු සැකසුම : ආර්. ඒ. එන්. එම්. පෙරේරා
දත්ත සටහන් ක්‍රියාකරු

පිටකවර සැකසුම : ඒ. එල්. කේ. චතුරාණි
කළමනාකරණ සේවා නිලධාරි

## විභාග කොමසාරිස් ජනරාල්ගේ පණිවිඩය

අ.පො.ස. (උසස් පෙළ) විභාගයේ 2024 වර්ෂයේ දේශපාලන විද්‍යා විෂයයට අදාළව මෙම ඇගයීම් වාර්තාව සම්පාදනය කර ඇත්තේ අපේක්ෂකයන්ගේ සාධනය පිළිබඳ දත්තමය හා විශ්ලේෂණාත්මක අවබෝධයක් ලබා දීම, ඔවුන්ගේ ශක්තීන් හා දුර්වලතා හඳුනා ගැනීම සහ එම අනාවරණයන් පදනම් කරගෙන ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය මෙන්ම පාසල් අධ්‍යාපනයේ ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීම සඳහා යෝජනා ඉදිරිපත් කිරීමේ අරමුණ පෙරදැරිව ය.

මෙම වාර්තාවේ, විෂය නිර්දේශයේ අපේක්ෂිත ඉගෙනුම් නිපුණතා හා ඉගෙනුම් ඵල අනුව අපේක්ෂකයන්ගේ සාධනය විස්තරාත්මකව විශ්ලේෂණය කර ඇත. ඒ අනුව එක් එක් පරීක්ෂණ අයිතමය සම්බන්ධයෙන් අපේක්ෂකයන්ගේ ප්‍රතිචාර, ශක්තීන් හා දුර්වලතා මෙන් ම වැඩිදියුණු කළ යුතු ක්ෂේත්‍ර හඳුනාගෙන ඒ සඳහා සුදුසු අධ්‍යාපන යෝජනා ඉදිරිපත් කර ඇත.

මෙම වාර්තාව ගුරුවරුන්, පාසල් පරිපාලකයන්, විෂයමාලා සංවර්ධකයන්, අධ්‍යාපන ප්‍රතිපත්ති සම්පාදකයන්, සිසුන් සහ දෙමාපියන් ඇතුළු අධ්‍යාපන පද්ධතියේ සියලු ම පාර්ශ්වකරුවන් සඳහා වැදගත් ලේඛනයකි. වාර්තාවේ අන්තර්ගත, විශ්ලේෂණ මඟින් ගුරුවරුන්ට ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දුර්වලතා නිවැරදිව හඳුනාගෙන ඉලක්කගත ඉගැන්වීම් ක්‍රමෝපායන් සැලසුම් කිරීමට හැකි වන අතර, සිසුන්ට තම ඉගෙනුම් අවශ්‍යතා හඳුනාගෙන ඒ අනුව සූදානම් වීමට මඟ පෙන්වයි. එමෙන් ම විෂයමාලා සංශෝධනය, ගුරු වෘත්තීය සංවර්ධනය, සම්පත් වෙන් කිරීම සහ දත්ත මත පදනම් වූ අධ්‍යාපනික තීරණ ගැනීම සඳහා ද මෙම වාර්තාව ඉවහල් වනු ඇත.

මෙම වාර්තාවෙන් උපරිම ප්‍රයෝජන ලබා ගැනීම සඳහා, අපේක්ෂකයන්ගේ සාධන දත්ත සමඟ එක් එක් පරීක්ෂණ අයිතමයට අදාළ විශ්ලේෂණ, නිරීක්ෂණ සහ නිර්දේශ ඒකාබද්ධව අධ්‍යයනය කිරීම අත්‍යවශ්‍ය වේ. එමඟින් සිසුන් මුහුණ දෙන සංකල්පමය දුර්වලතා සහ ඉගෙනුම් අවශ්‍යතා නිවැරදිව හඳුනාගෙන ඒ සඳහා සුදුසු මැදිහත්වීම් සැලසුම් කළ හැකි වනු ඇත. තවද, මෙම වාර්තාව ඉදිරි වසරවල අපේක්ෂකයන්ගේ සාධනය සංසන්දනාත්මකව විශ්ලේෂණය කිරීම සඳහා දත්ත පදනමක් ලෙස ද භාවිත කළ හැකිය.

අධ්‍යාපනයේ ගුණාත්මකභාවය ඉහළ නැංවීම සඳහා දත්ත මත පදනම් වූ තීරණ ගැනීම අත්‍යවශ්‍ය වන බැවින්, මෙම වාර්තාවේ ඉදිරිපත් කර ඇති අනාවරණයන් සහ නිර්දේශ ප්‍රතිපත්ති සම්පාදකයන්, අධ්‍යාපන පරිපාලකයන්, ගුරුවරුන් සහ සිසුන් විසින් ප්‍රායෝගිකව භාවිතයට ගෙන ඉගෙනුම් - ඉගැන්වීම් ක්‍රියාවලිය තවදුරටත් ශක්තිමත් කිරීමට දායක කර ගනු ඇතැයි මම විශ්වාස කරමි.

අවසාන වශයෙන්, මෙම ඇගයීම් වාර්තාව සම්පාදනය කිරීම සඳහා කැපවීමෙන් දායක වූ සියලු ම සම්පත්දායකයන්ට සහ විභාග දෙපාර්තමේන්තුවේ පර්යේෂණ හා සංවර්ධන ශාඛාවේ නිලධාරීන්ට මාගේ හෘදයංගම ස්තුතිය පුද කරමි. විශේෂයෙන් ම විද්‍යාත්මක ප්‍රවේශයකින් මෙම වාර්තාව සම්පාදනය කිරීම සඳහා ඔවුන් දැක්වූ වෘත්තීමය දායකත්වය ඉතා අගය කොට සලකමි.

ඒ. කේ. එස්. ඉන්දිකා කුමාරි ලියනගේ

විභාග කොමසාරිස් ජනරාල්

## සංක්ෂිප්තය

අ.පො.ස. (උසස් පෙළ) විභාගයේ 2024 වර්ෂයේ දේශපාලන විද්‍යා විෂයයට අදාළව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව විසින් සම්පාදනය කරන ලද මෙම ඇගයීම් වාර්තාව, අපේක්ෂකයන්ගේ සාධනය පිළිබඳ විස්තරාත්මක විශ්ලේෂණයක් ඉදිරිපත් කරන ප්‍රකාශනයකි. මෙම වාර්තාව ගුරුවරුන්, විෂයභාර නිලධාරීන්, විෂයමාලා සංවර්ධකයන්, අධ්‍යාපන පරිපාලකයන්, ප්‍රතිපත්ති සම්පාදකයන්, අධ්‍යාපන පර්යේෂකයන්, සිසුන් සහ දෙමාපියන් සඳහා ප්‍රයෝජනවත් ලේඛනයක් ලෙස භාවිත කළ හැකි ය.

මෙම වාර්තාව ප්‍රධාන කොටස් තුනකින් සමන්විත වේ.

**පළමු කොටසෙහි**, දේශපාලන විද්‍යා විෂය සඳහා පෙනී සිටි අපේක්ෂකයන්ගේ සාමාන්‍ය තොරතුරු, මාධ්‍ය හා ස්ත්‍රී පුරුෂභාවය අනුව අපේක්ෂක සංඛ්‍යාව, දිස්ත්‍රික්ක හා අධ්‍යාපන කලාප අනුව සාධනය, ශ්‍රේණි ව්‍යාප්තිය සහ අනෙකුත් සංඛ්‍යාත්මක තොරතුරු ඉදිරිපත් කර ඇත. එමෙන්ම විෂය අරමුණු, ඇගයීම් රාමුව සහ විභාගයේ සමස්ත සාධනය පිළිබඳ විශ්ලේෂණයක් ද ලබා දී ඇත.

**දෙවන කොටසෙහි**, I පත්‍රයට අදාළ විශ්ලේෂණය ඉදිරිපත් කර ඇත. මෙහි I පත්‍රයේ ව්‍යුහය, ප්‍රශ්න සැකැස්ම, ලකුණු ලබාදීමේ පටිපාටිය සහ එක් එක් ප්‍රශ්නයට අපේක්ෂකයන් දැක්වූ ප්‍රතිචාර පිළිබඳ දත්තමය විශ්ලේෂණ ද අන්තර්ගත වේ. තව ද, අයිතමවල පහසුතාව/පහසුතා දර්ශක, විභේදන හැකියාව සහ අපේක්ෂකයන්ගේ සාමාන්‍ය ප්‍රතිචාර රටා ද විග්‍රහ කර ඇත.

**තෙවන කොටසෙහි**, II පත්‍රයට අදාළ විශ්ලේෂණය ඉදිරිපත් කර ඇත. මෙහි එක් එක් ප්‍රශ්නය, එහි කොටස් හා අනුකොටස් සඳහා අපේක්ෂකයන්ගේ සාධනය විස්තරාත්මකව විශ්ලේෂණය කර ඇති අතර, අයිතමවල පහසුතා දර්ශක, නිපුණතා මට්ටම් සහ සංකල්පමය දුර්වලතා හඳුනාගෙන ඇත. එසේම, එම අනාවරණයන් මත පදනම්ව ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය වඩාත් ඵලදායී ලෙස සංවිධානය කිරීම සඳහා සංවර්ධනාත්මක යෝජනා ද ඉදිරිපත් කර ඇත.

මෙම වාර්තාව සකස් කිරීම සඳහා සම්භාව්‍ය පරීක්ෂණ න්‍යාය (Classical Test Theory - CTT) සහ අයිතම ප්‍රතිචාර න්‍යාය (Item Response Theory - IRT) යන විද්‍යාත්මක ප්‍රවේශයන් යොදාගෙන අපේක්ෂකයන්ගේ ප්‍රතිචාර විශ්ලේෂණය කර ලබාගත් දත්ත භාවිත කර ඇත. මීට අමතරව පිළිතුරු පත්‍ර ඇගයීමේ කටයුතුවල නිරත වූ ප්‍රධාන පරීක්ෂකවරුන්, අතිරේක ප්‍රධාන පරීක්ෂකවරුන් සහ සහකාර පරීක්ෂකවරුන් විසින් ඉදිරිපත් කරන ලද නිරීක්ෂණ, අදහස් සහ යෝජනා ද මෙම වාර්තාව සකස් කිරීම සඳහා පාදක කරගෙන ඇත.

මෙම වාර්තාවේ ඇතුළත් විශ්ලේෂණයන් සහ නිර්දේශ, ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය ශක්තිමත් කිරීම, විෂය සාධනය ඉහළ නැංවීම, විෂයමාලා සංවර්ධනය සහ දත්ත මත පදනම් වූ අධ්‍යාපනික තීරණ ගැනීම සඳහා ප්‍රයෝජනවත් වනු ඇතැයි අපේක්ෂා කෙරේ.

පර්යේෂණ හා සංවර්ධන ශාඛාව
ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
පැලවත්ත, බත්තරමුල්ල

# පටුන


1. විෂය අරමුණු හා අපේක්ෂකයන්ගේ සාධනය පිළිබඳ තොරතුරු 01

1.1 විෂය අරමුණු 01

1.2 අපේක්ෂකයන්ගේ විෂය සාධනය පිළිබඳ තොරතුරු 02

1.2.1 දේශපාලන විද්‍යාව විෂය සඳහා පෙනී සිටි අපේක්ෂකයන් සංඛ්‍යාව 02

1.2.2 අපේක්ෂකයන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය 02

1.2.3 පාසල් අපේක්ෂකයන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය - දිස්ත්‍රික්ක අනුව 03

1.2.4 පාසල් අපේක්ෂකයන් ශ්‍රේණි ලබා ගෙන ඇති ආකාරය අධ්‍යාපන කලාප අනුව 04

1.2.5 පන්ති ප්‍රාන්තර අනුව ලකුණු ලබාගෙන ඇති ආකාරය 07

2. ප්‍රශ්න සහ පිළිතුරු සැපයීම පිළිබඳ විශ්ලේෂණය - I පත්‍රය 08

2.1 දේශපාලන විද්‍යාව I පත්‍රයේ ව්‍යුහය 08

2.2 දේශපාලන විද්‍යාව I පත්‍රය 09

2.3 I පත්‍රය සඳහා ලකුණු දීමේ පටිපාටිය 18

2.4 I පත්‍රයේ වරණ තෝරා ඇති ආකාරය 19

2.5 I පත්‍රයේ ප්‍රශ්න සඳහා පහසුතා දර්ශක 21

2.6 I පත්‍රයේ විශ්ලේෂණය 22

2.7 I ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ, නිගමන හා යෝජනා 26

3. ප්‍රශ්න හා පිළිතුරු සැපයීම පිළිබඳ විශ්ලේෂණය - II පත්‍රය 29

3.1 දේශපාලන විද්‍යාව II පත්‍රයේ ව්‍යුහය 29

3.2 II පත්‍රයේ විශ්ලේෂණය 30

3.3 II පත්‍රයේ එක් එක් ප්‍රශ්න සඳහා සුවිශේෂී නිරීක්ෂණ හා නිර්දේශ 33

3.3.1 ප්‍රශ්න අංක 1 සහ අපේක්ෂිත පිළිතුර 33

3.3.2 ප්‍රශ්න අංක 1 සඳහා විශ්ලේෂණය 35

3.3.3 ප්‍රශ්න අංක 2 සහ අපේක්ෂිත පිළිතුර 37

3.3.4 ප්‍රශ්න අංක 2 සඳහා විශ්ලේෂණය 40

3.3.5 ප්‍රශ්න අංක 3 සහ අපේක්ෂිත පිළිතුර 42

3.3.6 ප්‍රශ්න අංක 3 සඳහා විශ්ලේෂණය 46

3.3.7 ප්‍රශ්න අංක 4 සහ අපේක්ෂිත පිළිතුර 48

3.3.8 ප්‍රශ්න අංක 4 සඳහා විශ්ලේෂණය 50

3.3.9 ප්‍රශ්න අංක 5 සහ අපේක්ෂිත පිළිතුර 52

3.3.10 ප්‍රශ්න අංක 5 සඳහා විශ්ලේෂණය 56

3.3.11 ප්‍රශ්න අංක 6 සහ අපේක්ෂිත පිළිතුර 58

3.3.12 ප්‍රශ්න අංක 6 සඳහා විශ්ලේෂණය 59

3.3.13 ප්‍රශ්න අංක 7 සහ අපේක්ෂිත පිළිතුර 61

3.3.14 ප්‍රශ්න අංක 7 සඳහා විශ්ලේෂණය 63

3.3.15 ප්‍රශ්න අංක 8 සහ අපේක්ෂිත පිළිතුර 65

3.3.16 ප්‍රශ්න අංක 8 සඳහා විශ්ලේෂණය 68

3.3.17 ප්‍රශ්න අංක 9 සහ අපේක්ෂිත පිළිතුර 70

3.3.18 ප්‍රශ්න අංක 9 සඳහා විශ්ලේෂණය 73

3.3.19 ප්‍රශ්න අංක 10 සහ අපේක්ෂිත පිළිතුර 75

3.3.20 ප්‍රශ්න අංක 10 සඳහා විශ්ලේෂණය 79

## වගු නාමාවලිය

වගුව 1.1 මාධ්‍ය හා ස්ත්‍රී පුරුෂභාවය අනුව පාසල් හා පෞද්ගලික අපේක්ෂකයන්ගේ ව්‍යාප්තිය 02

වගුව 1.2 ස්ත්‍රී පුරුෂභාවය හා ශ්‍රේණි අනුව පාසල් හා පෞද්ගලික අපේක්ෂකයන්ගේ ව්‍යාප්තිය 02

වගුව 1.3 දිස්ත්‍රික්ක හා ශ්‍රේණි අනුව අපේක්ෂකයන්ගේ ව්‍යාප්තිය 03

වගුව 1.4 අධ්‍යාපන කලාප හා ශ්‍රේණි අනුව අපේක්ෂකයන්ගේ ව්‍යාප්තිය 04

වගුව 1.5 පන්ති ප්‍රාන්තර අනුව අපේක්ෂකයන් ලකුණු ලබා ගෙන ඇති ආකාරය 07

වගුව 2.1 1-A කොටසෙහි ලකුණු දීමේ පටිපාටිය 18

වගුව 2.2 1-A කොටසෙහි එක් එක් ප්‍රශ්නයෙහි වරණ තෝරා ඇති අපේක්ෂකයන් ප්‍රතිශතය 19

වගුව 2.3 1-B කොටසේ ප්‍රශ්න සඳහා අපේක්ෂකයන් ලකුණු ලබා ඇති ආකාරය 20

වගුව 2.4 නිපුණතා අනුව 1 කොටසට අදාළ ප්‍රශ්න අංක 23

## ප්‍රස්තාර නාමාවලිය

ප්‍රස්තාරය 2.1 I පත්‍රයේ ප්‍රශ්න සඳහා පහසුතා දර්ශකය 21
ප්‍රස්තාරය 2.2 I පත්‍රයේ A කොටසෙහි විෂය නිපුණතා අනුව ප්‍රශ්නවල පහසුතා දර්ශක 24
ප්‍රස්තාරය 2.3 I පත්‍රයෙහි B කොටසෙහි විෂය නිපුණතා අනුව ප්‍රශ්නවල පහසුතා දර්ශක 25
ප්‍රස්තාරය 3.1 II පත්‍රයේ ප්‍රශ්න තෝරාගෙන ඇති ආකාරය 30
ප්‍රස්තාරය 3.2 පන්ති ප්‍රාන්තර අනුව එක් එක් ප්‍රශ්නය සඳහා අපේක්ෂකයන්ගේ සාධනය 31
ප්‍රස්තාරය 3.3 II පත්‍රයේ ප්‍රශ්න සඳහා පහසුතා දර්ශක 32
ප්‍රස්තාරය 3.4 ප්‍රශ්න අංක 1 සඳහා අපේක්ෂකයන් ලබාගත් ලකුණුවල ව්‍යාප්තිය 35
ප්‍රස්තාරය 3.5 ප්‍රශ්න අංක 1සඳහා පහසුතා දර්ශකය 35
ප්‍රස්තාරය 3.6 ප්‍රශ්න අංක 2 සඳහා අපේක්ෂකයන් ලබාගත් ලකුණුවල ව්‍යාප්තිය 40
ප්‍රස්තාරය 3.7 ප්‍රශ්න අංක 2 සඳහා පහසුතා දර්ශකය 40
ප්‍රස්තාරය 3.8 ප්‍රශ්න අංක 3 සඳහා අපේක්ෂකයන් ලබාගත් ලකුණුවල ව්‍යාප්තිය 46
ප්‍රස්තාරය 3.9 ප්‍රශ්න අංක 3 සඳහා පහසුතා දර්ශකය 46
ප්‍රස්තාරය 3.10 ප්‍රශ්න අංක 4 සඳහා අපේක්ෂකයන් ලබාගත් ලකුණුවල ව්‍යාප්තිය 50
ප්‍රස්තාරය 3.11 ප්‍රශ්න අංක 4 සඳහා පහසුතා දර්ශකය 50
ප්‍රස්තාරය 3.12 ප්‍රශ්න අංක 5 සඳහා අපේක්ෂකයන් ලබාගත් ලකුණුවල ව්‍යාප්තිය 56
ප්‍රස්තාරය 3.13 ප්‍රශ්න අංක 5 සඳහා පහසුතා දර්ශකය 56
ප්‍රස්තාරය 3.14 ප්‍රශ්න අංක 6 සඳහා අපේක්ෂකයන් ලබාගත් ලකුණුවල ව්‍යාප්තිය 59
ප්‍රස්තාරය 3.15 ප්‍රශ්න අංක 6 සඳහා පහසුතා දර්ශකය 59
ප්‍රස්තාරය 3.16 ප්‍රශ්න අංක 7 සඳහා අපේක්ෂකයන් ලබාගත් ලකුණුවල ව්‍යාප්තිය 63
ප්‍රස්තාරය 3.17 ප්‍රශ්න අංක 7 සඳහා පහසුතා දර්ශකය 63
ප්‍රස්තාරය 3.18 ප්‍රශ්න අංක 8 සඳහා අපේක්ෂකයන් ලබාගත් ලකුණුවල ව්‍යාප්තිය 68
ප්‍රස්තාරය 3.19 ප්‍රශ්න අංක 8 සඳහා පහසුතා දර්ශකය 68
ප්‍රස්තාරය 3.20 ප්‍රශ්න අංක 9 සඳහා අපේක්ෂකයන් ලබාගත් ලකුණුවල ව්‍යාප්තිය 73
ප්‍රස්තාරය 3.21 ප්‍රශ්න අංක 9 සඳහා පහසුතා දර්ශකය 73
ප්‍රස්තාරය 3.22 ප්‍රශ්න අංක 10 සඳහා අපේක්ෂකයන් ලබාගත් ලකුණුවල ව්‍යාප්තිය 79
ප්‍රස්තාරය 3.23 ප්‍රශ්න අංක 10 සඳහා පහසුතා දර්ශකය 79

# I කොටස

## 1. විෂය අරමුණු හා අපේක්ෂකයන්ගේ සාධනය පිළිබඳ තොරතුරු

### 1.1 විෂය අරමුණු

- ශාස්ත්‍රීය විෂයයක් ලෙස දේශපාලන විද්‍යාවේ අන්තර්ගතය, තේමා සහ වැදගත්කම හඳුනා ගැනීම
- තමන් ජීවත්වන පරිසරයේ, සමාජයේ සහ ලෝකයේ දේශපාලන ක්‍රියාවලීන්, දේශපාලන ආයතන සහ දේශපාලන වෙනස්වීම් හඳුනා ගැනීම හා විචාරාත්මක ව තේරුම් ගැනීම
- පුරවැසියන් හැටියට රටේත්, ලෝකයේත් ජීවත් වීමේ දී වැදගත්වන සාධනීය දේශපාලන සාරධර්ම, අරමුණු සහ මූලධර්ම පිළිබඳ ව සවිඥානික වීම
- දේශපාලන විද්‍යා විෂයයයේ ඓතිහාසික සහ සමකාලීන ප්‍රවණතා හඳුනා ගැනීම
- සාධනීය සමාජ, දේශපාලන පරිවර්තන සඳහා පුරවැසියන් ලෙස දායකත්වය ලබා දීමට අවශ්‍ය දැනුම, අවබෝධය සහ හැකියාවන් ලබා ගැනීම

**මූලාශ්‍රය**: දේශපාලන විද්‍යාව විෂය නිර්දේශය 12-13 ශ්‍රේණි, 2017, ජා.අ.ආ.

## 1.2 අපේක්ෂකයන්ගේ විෂය සාධනය පිළිබඳ තොරතුරු

### 1.2.1 විෂය සඳහා පෙනී සිටි අපේක්ෂකයන් සංඛ්‍යාව

**වගුව 1.1**

මාධ්‍ය හා ස්ත්‍රී පුරුෂභාවය අනුව පාසල් හා පෞද්ගලික අපේක්ෂකයන්ගේ ව්‍යාප්තිය

| මාධ්‍යය | පාසල් අපේක්ෂකයන් | | | | | පෞද්ගලික අපේක්ෂකයන් | | | | | මුළු අපේක්ෂකයන් | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | පුරුෂ | | ස්ත්‍රී | | එකතුව | පුරුෂ | | ස්ත්‍රී | | එකතුව | පුරුෂ | | ස්ත්‍රී | | එකතුව |
| | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | |
| සිංහල | 4,847 | 27.13 | 13,016 | 72.87 | 17,863 | 1,337 | 29.00 | 3,274 | 71.00 | 4,611 | 6,184 | 27.52 | 16,290 | 72.48 | 22,474 |
| දෙමළ | 2,249 | 26.90 | 6,112 | 73.10 | 8,361 | 1,124 | 38.69 | 1,781 | 61.31 | 2,905 | 3,373 | 29.94 | 7,893 | 70.06 | 11,266 |
| ඉංග්‍රීසි | 11 | 27.50 | 29 | 72.50 | 40 | 15 | 27.27 | 40 | 72.73 | 55 | 26 | 27.37 | 69 | 72.63 | 95 |
| එකතුව | **7,107** | **27.06** | **19,157** | **72.94** | **26,264** | **2,476** | **32.70** | **5,095** | **67.30** | **7,571** | **9,583** | **28.32** | **24,252** | **71.68** | **33,835** |

**මූලාශ්‍රය :** පර්යේෂණ හා සංවර්ධන දත්ත, 2024, ශ්‍රී.ලං.වි.දෙ.

### 1.2.2 අපේක්ෂකයන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය

**වගුව 1.2**

ස්ත්‍රී පුරුෂභාවය හා ශ්‍රේණි අනුව පාසල් හා පෞද්ගලික අපේක්ෂකයන්ගේ ව්‍යාප්තිය

| ශ්‍රේණිය | පාසල් අපේක්ෂකයන් | | | | | පෞද්ගලික අපේක්ෂකයන් | | | | | මුළු අපේක්ෂකයන් | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | පුරුෂ | | ස්ත්‍රී | | එකතුව | පුරුෂ | | ස්ත්‍රී | | එකතුව | පුරුෂ | | ස්ත්‍රී | | එකතුව |
| | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | |
| **A** | 465 | 6.54 | 2,558 | 13.35 | 3,023 | 86 | 3.47 | 309 | 6.06 | 395 | 551 | 5.75 | 2,867 | 11.82 | 3,418 |
| **B** | 485 | 6.82 | 2,798 | 14.61 | 3,283 | 122 | 4.93 | 424 | 8.32 | 546 | 607 | 6.33 | 3,222 | 13.29 | 3,829 |
| **C** | 1,056 | 14.86 | 4,854 | 25.34 | 5,910 | 323 | 13.05 | 945 | 18.55 | 1,268 | 1,379 | 14.39 | 5,799 | 23.91 | 7,178 |
| **S** | 1,801 | 25.34 | 5,142 | 26.84 | 6,943 | 552 | 22.29 | 1,405 | 27.58 | 1,957 | 2,353 | 24.55 | 6,547 | 27.00 | 8,900 |
| **F** | 3,300 | 46.43 | 3,805 | 19.86 | 7,105 | 1,393 | 56.26 | 2,012 | 39.49 | 3,405 | 4,693 | 48.97 | 5,817 | 23.99 | 10,510 |
| එකතුව | **7,107** | **100.00** | **19,157** | **100.00** | **26,264** | **2,476** | **100.00** | **5,095** | **100.00** | **7,571** | **9,583** | **100.00** | **24,252** | **100.00** | **33,835** |

මූලාශ්‍රය : පර්යේෂණ හා සංවර්ධන දත්ත, 2024, ශ්‍රී.ලං.වි.දෙ.

## 1.2.3 පාසල් අපේක්ෂකයන් ශ්‍රේණි ලබාගෙන ඇති ආකාරය - දිස්ත්‍රික්ක අනුව

### වගුව 1:3

දිස්ත්‍රික්ක හා ශ්‍රේණි අනුව අපේක්ෂකයන්ගේ ව්‍යාප්තිය

| දිස්ත්‍රික්ක | පෙනී සිටි සංඛ්‍යාව | දේශපාලන විද්‍යාව | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | විශිෂ්ට සම්මාන (A) | | අධි සම්මාන (B) | | සම්මාන (C) | | සාමාන්‍ය (S) | | සමත් (A+B+C+S) | | අසමත් (F) | |
| | | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % | සංඛ්‍යාව | % |
| කොළඹ | 1,549 | 230 | 14.85 | 179 | 11.56 | 344 | 22.21 | 422 | 27.24 | 1,175 | 75.86 | 374 | 24.14 |
| ගම්පහ | 1,576 | 221 | 14.02 | 159 | 10.09 | 330 | 20.94 | 424 | 26.90 | 1,134 | 71.95 | 442 | 28.05 |
| කළුතර | 1,325 | 177 | 13.36 | 191 | 14.42 | 291 | 21.96 | 308 | 23.25 | 967 | 72.98 | 358 | 27.02 |
| මහනුවර | 1,583 | 123 | 7.77 | 158 | 9.98 | 324 | 20.47 | 483 | 30.51 | 1,088 | 68.73 | 495 | 31.27 |
| මාතලේ | 584 | 41 | 7.02 | 73 | 12.50 | 100 | 17.12 | 165 | 28.25 | 379 | 64.90 | 205 | 35.10 |
| නුවරඑළිය | 1,750 | 115 | 6.57 | 174 | 9.94 | 441 | 25.20 | 604 | 34.51 | 1,334 | 76.23 | 416 | 23.77 |
| ගාල්ල | 1,735 | 282 | 16.25 | 245 | 14.12 | 355 | 20.46 | 354 | 20.40 | 1,236 | 71.24 | 499 | 28.76 |
| මාතර | 969 | 132 | 13.62 | 127 | 13.11 | 221 | 22.81 | 207 | 21.36 | 687 | 70.90 | 282 | 29.10 |
| හම්බන්තොට | 922 | 205 | 22.23 | 142 | 15.40 | 134 | 14.53 | 182 | 19.74 | 663 | 71.91 | 259 | 28.09 |
| යාපනය | 768 | 89 | 11.59 | 85 | 11.07 | 184 | 23.96 | 217 | 28.26 | 575 | 74.87 | 193 | 25.13 |
| මන්නාරම | 189 | 14 | 7.41 | 25 | 13.23 | 53 | 28.04 | 55 | 29.10 | 147 | 77.78 | 42 | 22.22 |
| වවුනියාව | 209 | 13 | 6.22 | 16 | 7.66 | 44 | 21.05 | 76 | 36.36 | 149 | 71.29 | 60 | 28.71 |
| මුලතිව් | 22 | 0 | 0.00 | 2 | 9.09 | 7 | 31.82 | 7 | 31.82 | 16 | 72.73 | 6 | 27.27 |
| කිලිනොච්චි | 82 | 4 | 4.88 | 5 | 6.10 | 7 | 8.54 | 15 | 18.29 | 31 | 37.80 | 51 | 62.20 |
| මඩකලපුව | 1,253 | 100 | 7.98 | 122 | 9.74 | 294 | 23.46 | 331 | 26.42 | 847 | 67.60 | 406 | 32.40 |
| අම්පාර | 1,493 | 140 | 9.38 | 209 | 14.00 | 343 | 22.97 | 394 | 26.39 | 1,086 | 72.74 | 407 | 27.26 |
| ත්‍රිකුණාමලය | 425 | 31 | 7.29 | 60 | 14.12 | 101 | 23.76 | 115 | 27.06 | 307 | 72.24 | 118 | 27.76 |
| කුරුණෑගල | 2,045 | 241 | 11.78 | 254 | 12.42 | 480 | 23.47 | 559 | 27.33 | 1,534 | 75.01 | 511 | 24.99 |
| පුත්තලම | 1,129 | 152 | 13.46 | 159 | 14.08 | 266 | 23.56 | 302 | 26.75 | 879 | 77.86 | 250 | 22.14 |
| අනුරාධපුරය | 1,132 | 71 | 6.27 | 168 | 14.84 | 268 | 23.67 | 281 | 24.82 | 788 | 69.61 | 344 | 30.39 |
| පොළොන්නරුව | 568 | 69 | 12.15 | 67 | 11.80 | 129 | 22.71 | 142 | 25.00 | 407 | 71.65 | 161 | 28.35 |
| බදුල්ල | 1,681 | 153 | 9.10 | 217 | 12.91 | 403 | 23.97 | 505 | 30.04 | 1,278 | 76.03 | 403 | 23.97 |
| මොණරාගල | 869 | 95 | 10.93 | 102 | 11.74 | 207 | 23.82 | 207 | 23.82 | 611 | 70.31 | 258 | 29.69 |
| රත්නපුරය | 1,680 | 241 | 14.35 | 247 | 14.70 | 388 | 23.10 | 403 | 23.99 | 1,279 | 76.13 | 401 | 23.87 |
| කෑගල්ල | 726 | 84 | 11.57 | 97 | 13.36 | 196 | 27.00 | 185 | 25.48 | 562 | 77.41 | 164 | 22.59 |
| **එකතුව** | **26,264** | **3,023** | **11.51** | **3,283** | **12.50** | **5,910** | **22.50** | **6,943** | **26.44** | **19,159** | **72.95** | **7,105** | **27.05** |

**මූලාශ්‍රය :** පර්යේෂණ හා සංවර්ධන දත්ත, 2024, ශ්‍රී.ලං.වි.දෙ.

## 1.2.4 පාසල් අපේක්ෂකයන් ශ්‍රේණි ලබා ගෙන ඇති ආකාරය - අධ්‍යාපන කලාප අනුව

### වගුව 1.4

අධ්‍යාපන කලාප හා ශ්‍රේණි අනුව අපේක්ෂකයන්ගේ ව්‍යාප්තිය

| අධ්‍යාපන කලාපය | පෙනී සිටි සංඛ්‍යාව | දේශපාලන විද්‍යාව | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | A | | B | | C | | S | | A+B+C+S | | F | |
| | | සංඛ්‍යාව | % | සඛ්‍යාව | % | සඛ්‍යාව | % | සඛ්‍යාව | % | සඛ්‍යාව | % | සඛ්‍යාව | % |
| කොළඹ | 697 | 139 | 19.94 | 95 | 13.63 | 162 | 23.24 | 164 | 23.53 | 560 | 80.34 | 137 | 19.66 |
| හෝමාගම | 208 | 18 | 8.65 | 17 | 8.17 | 46 | 22.12 | 66 | 31.73 | 147 | 70.67 | 61 | 29.33 |
| ශ්‍රී ජයවර්ධනපුර | 336 | 51 | 15.18 | 43 | 12.80 | 80 | 23.81 | 93 | 27.68 | 267 | 79.46 | 69 | 20.54 |
| පිළියන්දල | 308 | 22 | 7.14 | 24 | 7.79 | 56 | 18.18 | 99 | 32.14 | 201 | 65.26 | 107 | 34.74 |
| ගම්පහ | 443 | 119 | 26.86 | 63 | 14.22 | 102 | 23.02 | 87 | 19.64 | 371 | 83.75 | 72 | 16.25 |
| මිනුවන්ගොඩ | 218 | 20 | 9.17 | 26 | 11.93 | 60 | 27.52 | 58 | 26.61 | 164 | 75.23 | 54 | 24.77 |
| මීගමුව | 422 | 34 | 8.06 | 30 | 7.11 | 87 | 20.62 | 131 | 31.04 | 282 | 66.82 | 140 | 33.18 |
| කැළණිය | 493 | 48 | 9.74 | 40 | 8.11 | 81 | 16.43 | 148 | 30.02 | 317 | 64.30 | 176 | 35.70 |
| කළුතර | 548 | 57 | 10.40 | 76 | 13.87 | 116 | 21.17 | 133 | 24.27 | 382 | 69.71 | 166 | 30.29 |
| මතුගම | 378 | 65 | 17.20 | 59 | 15.61 | 82 | 21.69 | 87 | 23.02 | 293 | 77.51 | 85 | 22.49 |
| හොරණ | 399 | 55 | 13.78 | 56 | 14.04 | 93 | 23.31 | 88 | 22.06 | 292 | 73.18 | 107 | 26.82 |
| මහනුවර | 683 | 56 | 8.20 | 71 | 10.40 | 123 | 18.01 | 211 | 30.89 | 461 | 67.50 | 222 | 32.50 |
| දෙනුවර | 101 | 10 | 9.90 | 12 | 11.88 | 10 | 9.90 | 26 | 25.74 | 58 | 57.43 | 43 | 42.57 |
| ගම්පොළ | 270 | 17 | 6.30 | 33 | 12.22 | 67 | 24.81 | 79 | 29.26 | 196 | 72.59 | 74 | 27.41 |
| තෙල්දෙණිය | 219 | 18 | 8.22 | 20 | 9.13 | 56 | 25.57 | 67 | 30.59 | 161 | 73.52 | 58 | 26.48 |
| වත්තේගම | 179 | 9 | 5.03 | 11 | 6.15 | 36 | 20.11 | 60 | 33.52 | 116 | 64.80 | 63 | 35.20 |
| කටුගස්තොට | 131 | 13 | 9.92 | 11 | 8.40 | 32 | 24.43 | 40 | 30.53 | 96 | 73.28 | 35 | 26.72 |
| මාතලේ | 265 | 12 | 4.53 | 23 | 8.68 | 45 | 16.98 | 80 | 30.19 | 160 | 60.38 | 105 | 39.62 |
| ගලේවෙල | 144 | 18 | 12.50 | 26 | 18.06 | 22 | 15.28 | 33 | 22.92 | 99 | 68.75 | 45 | 31.25 |
| නාඋල | 28 | 1 | 3.57 | 3 | 10.71 | 6 | 21.43 | 8 | 28.57 | 18 | 64.29 | 10 | 35.71 |
| විල්ගමුව | 147 | 10 | 6.80 | 21 | 14.29 | 27 | 18.37 | 44 | 29.93 | 102 | 69.39 | 45 | 30.61 |
| නුවරඑළිය | 535 | 16 | 2.99 | 41 | 7.66 | 125 | 23.36 | 202 | 37.76 | 384 | 71.78 | 151 | 28.22 |
| කොත්මලේ | 291 | 32 | 11.00 | 28 | 9.62 | 69 | 23.71 | 92 | 31.62 | 221 | 75.95 | 70 | 24.05 |
| හැටන් | 495 | 38 | 7.68 | 59 | 11.92 | 140 | 28.28 | 163 | 32.93 | 400 | 80.81 | 95 | 19.19 |
| වළපනේ | 238 | 18 | 7.56 | 32 | 13.45 | 69 | 28.99 | 78 | 32.77 | 197 | 82.77 | 41 | 17.23 |
| හඟුරන්කෙත | 191 | 11 | 5.76 | 14 | 7.33 | 38 | 19.90 | 69 | 36.13 | 132 | 69.11 | 59 | 30.89 |
| ගාල්ල | 597 | 124 | 20.77 | 72 | 12.06 | 114 | 19.10 | 130 | 21.78 | 440 | 73.70 | 157 | 26.30 |
| ඇල්පිටිය | 427 | 55 | 12.88 | 47 | 11.01 | 93 | 21.78 | 87 | 20.37 | 282 | 66.04 | 145 | 33.96 |
| අම්බලන්ගොඩ | 415 | 54 | 13.01 | 59 | 14.22 | 79 | 19.04 | 79 | 19.04 | 271 | 65.30 | 144 | 34.70 |
| උඩුගම | 296 | 49 | 16.55 | 67 | 22.64 | 69 | 23.31 | 58 | 19.59 | 243 | 82.09 | 53 | 17.91 |
| මාතර | 357 | 38 | 10.64 | 46 | 12.89 | 71 | 19.89 | 81 | 22.69 | 236 | 66.11 | 121 | 33.89 |
| අකුරැස්ස | 123 | 12 | 9.76 | 17 | 13.82 | 33 | 26.83 | 28 | 22.76 | 90 | 73.17 | 33 | 26.83 |

| | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| මුලටියන(හක්මන) | 160 | 13 | 8.13 | 26 | 16.25 | 36 | 22.50 | 30 | 18.75 | 105 | 65.63 | 55 | 34.38 |
| දෙණියාය (මොරවක) | 329 | 69 | 20.97 | 38 | 11.55 | 81 | 24.62 | 68 | 20.67 | 256 | 77.81 | 73 | 22.19 |
| තංගල්ල | 205 | 55 | 26.83 | 22 | 10.73 | 36 | 17.56 | 39 | 19.02 | 152 | 74.15 | 53 | 25.85 |
| හම්බන්තොට | 480 | 100 | 20.83 | 82 | 17.08 | 64 | 13.33 | 89 | 18.54 | 335 | 69.79 | 145 | 30.21 |
| වලස්මුල්ල | 237 | 50 | 21.10 | 38 | 16.03 | 34 | 14.35 | 54 | 22.78 | 176 | 74.26 | 61 | 25.74 |
| යාපනය | 243 | 24 | 9.88 | 27 | 11.11 | 62 | 25.51 | 63 | 25.93 | 176 | 72.43 | 67 | 27.57 |
| දූපත් | 65 | 2 | 3.08 | 7 | 10.77 | 13 | 20.00 | 24 | 36.92 | 46 | 70.77 | 19 | 29.23 |
| තෙන්මාරච්චි | 83 | 17 | 20.48 | 9 | 10.84 | 19 | 22.89 | 23 | 27.71 | 68 | 81.93 | 15 | 18.07 |
| වලිකාමම් | 326 | 42 | 12.88 | 36 | 11.04 | 76 | 23.31 | 93 | 28.53 | 247 | 75.77 | 79 | 24.23 |
| වඩමාරච්චි | 51 | 4 | 7.84 | 6 | 11.76 | 14 | 27.45 | 14 | 27.45 | 38 | 74.51 | 13 | 25.49 |
| කිලිනොච්චිය (දකුණ) | 63 | 3 | 4.76 | 3 | 4.76 | 6 | 9.52 | 13 | 20.63 | 25 | 39.68 | 38 | 60.32 |
| කිලිනොච්චිය (උතුර) | 19 | 1 | 5.26 | 2 | 10.53 | 1 | 5.26 | 2 | 10.53 | 6 | 31.58 | 13 | 68.42 |
| මන්නාරම | 177 | 14 | 7.91 | 24 | 13.56 | 53 | 29.94 | 51 | 28.81 | 142 | 80.23 | 35 | 19.77 |
| මඩු | 12 | 0 | 0.00 | 1 | 8.33 | 0 | 0.00 | 4 | 33.33 | 5 | 41.67 | 7 | 58.33 |
| වව්නියාව (දකුණ) | 185 | 12 | 6.49 | 15 | 8.11 | 41 | 22.16 | 61 | 32.97 | 129 | 69.73 | 56 | 30.27 |
| වව්නියාව (උතුර) | 24 | 1 | 4.17 | 1 | 4.17 | 3 | 12.50 | 15 | 62.50 | 20 | 83.33 | 4 | 16.67 |
| මුලටියන(හක්මන) | 22 | 0 | 0.00 | 2 | 9.09 | 7 | 31.82 | 7 | 31.82 | 16 | 72.73 | 6 | 27.27 |
| තුනුක්කායි | - | - | - | - | - | - | - | - | - | - | - | - | - |
| මඩකලපුව | 388 | 19 | 4.90 | 29 | 7.47 | 108 | 27.84 | 108 | 27.84 | 264 | 68.04 | 124 | 31.96 |
| කල්කුඩා | 303 | 17 | 5.61 | 21 | 6.93 | 57 | 18.81 | 72 | 23.76 | 167 | 55.12 | 136 | 44.88 |
| පදිරිප්පු | 106 | 10 | 9.43 | 16 | 15.09 | 32 | 30.19 | 24 | 22.64 | 82 | 77.36 | 24 | 22.64 |
| මඩකලපුව (මධ්‍යම) | 328 | 41 | 12.50 | 45 | 13.72 | 65 | 19.82 | 93 | 28.35 | 244 | 74.39 | 84 | 25.61 |
| මඩකලපුව (බටහිර) | 128 | 13 | 10.16 | 11 | 8.59 | 32 | 25.00 | 34 | 26.56 | 90 | 70.31 | 38 | 29.69 |
| අම්පාර | 231 | 22 | 9.52 | 23 | 9.96 | 39 | 16.88 | 68 | 29.44 | 152 | 65.80 | 79 | 34.20 |
| කල්මුණේ | 481 | 57 | 11.85 | 76 | 15.80 | 114 | 23.70 | 117 | 24.32 | 364 | 75.68 | 117 | 24.32 |
| සමන්තුරෙයි | 240 | 18 | 7.50 | 44 | 18.33 | 60 | 25.00 | 61 | 25.42 | 183 | 76.25 | 57 | 23.75 |
| මහඔය | 85 | 11 | 12.94 | 8 | 9.41 | 19 | 22.35 | 24 | 28.24 | 62 | 72.94 | 23 | 27.06 |
| දෙහිඅත්තකණ්ඩිය | 129 | 10 | 7.75 | 12 | 9.30 | 29 | 22.48 | 32 | 24.81 | 83 | 64.34 | 46 | 35.66 |
| අක්කරෙයිපත්තු | 129 | 15 | 11.63 | 32 | 24.81 | 28 | 21.71 | 37 | 28.68 | 112 | 86.82 | 17 | 13.18 |
| තිරුක්කෝවිල් | 198 | 7 | 3.54 | 14 | 7.07 | 54 | 27.27 | 55 | 27.78 | 130 | 65.66 | 68 | 34.34 |
| ත්‍රිකුණාමලය | 35 | 1 | 2.86 | 3 | 8.57 | 6 | 17.14 | 13 | 37.14 | 23 | 65.71 | 12 | 34.29 |
| මුතූර් | 165 | 13 | 7.88 | 27 | 16.36 | 54 | 32.73 | 41 | 24.85 | 135 | 81.82 | 30 | 18.18 |
| කන්තලේ | 97 | 13 | 13.40 | 14 | 14.43 | 11 | 11.34 | 20 | 20.62 | 58 | 59.79 | 39 | 40.21 |
| කින්නියා | 91 | 4 | 4.40 | 11 | 12.09 | 22 | 24.18 | 32 | 35.16 | 69 | 75.82 | 22 | 24.18 |
| ත්‍රිකුණාමලය (උතුර) | 37 | 0 | 0.00 | 5 | 13.51 | 8 | 21.62 | 9 | 24.32 | 22 | 59.46 | 15 | 40.54 |
| කුරුණෑගල | 431 | 42 | 9.74 | 47 | 10.90 | 88 | 20.42 | 125 | 29.00 | 302 | 70.07 | 129 | 29.93 |
| කුලියාපිටිය | 386 | 57 | 14.77 | 55 | 14.25 | 104 | 26.94 | 104 | 26.94 | 320 | 82.90 | 66 | 17.10 |
| නිකවැරටිය | 391 | 55 | 14.07 | 42 | 10.74 | 89 | 22.76 | 102 | 26.09 | 288 | 73.66 | 103 | 26.34 |

| | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| මහව | 448 | 48 | 10.71 | 52 | 11.61 | 115 | 25.67 | 128 | 28.57 | 343 | 76.56 | 105 | 23.44 |
| ගිරිඋල්ල | 230 | 23 | 10.00 | 33 | 14.35 | 47 | 20.43 | 63 | 27.39 | 166 | 72.17 | 64 | 27.83 |
| ඉබ්බාගමුව | 159 | 16 | 10.06 | 25 | 15.72 | 37 | 23.27 | 37 | 23.27 | 115 | 72.33 | 44 | 27.67 |
| පුත්තලම | 703 | 93 | 13.23 | 99 | 14.08 | 171 | 24.32 | 185 | 26.32 | 548 | 77.95 | 155 | 22.05 |
| හලාවත | 426 | 59 | 13.85 | 60 | 14.08 | 95 | 22.30 | 117 | 27.46 | 331 | 77.70 | 95 | 22.30 |
| අනුරාධපුරය | 324 | 17 | 5.25 | 53 | 16.36 | 72 | 22.22 | 66 | 20.37 | 208 | 64.20 | 116 | 35.80 |
| තඹුත්තේගම | 132 | 12 | 9.09 | 19 | 14.39 | 28 | 21.21 | 33 | 25.00 | 92 | 69.70 | 40 | 30.30 |
| කැකිරාව | 203 | 12 | 5.91 | 20 | 9.85 | 59 | 29.06 | 56 | 27.59 | 147 | 72.41 | 56 | 27.59 |
| ගලෙන්බිඳුණුවැව | 234 | 18 | 7.69 | 35 | 14.96 | 53 | 22.65 | 59 | 25.21 | 165 | 70.51 | 69 | 29.49 |
| කැබිතිගොල්ලෑව | 239 | 12 | 5.02 | 41 | 17.15 | 56 | 23.43 | 67 | 28.03 | 176 | 73.64 | 63 | 26.36 |
| පොළොන්නරුව | 204 | 23 | 11.27 | 23 | 11.27 | 58 | 28.43 | 51 | 25.00 | 155 | 75.98 | 49 | 24.02 |
| හිඟුරක්ගොඩ | 199 | 20 | 10.05 | 25 | 12.56 | 39 | 19.60 | 49 | 24.62 | 133 | 66.83 | 66 | 33.17 |
| දිඹුලාගල | 165 | 26 | 15.76 | 19 | 11.52 | 32 | 19.39 | 42 | 25.45 | 119 | 72.12 | 46 | 27.88 |
| බදුල්ල | 400 | 44 | 11.00 | 47 | 11.75 | 93 | 23.25 | 121 | 30.25 | 305 | 76.25 | 95 | 23.75 |
| බණ්ඩාරවෙල | 431 | 38 | 8.82 | 52 | 12.06 | 114 | 26.45 | 129 | 29.93 | 333 | 77.26 | 98 | 22.74 |
| මහියංගණය | 203 | 11 | 5.42 | 22 | 10.84 | 43 | 21.18 | 60 | 29.56 | 136 | 67.00 | 67 | 33.00 |
| වැලිමඩ | 317 | 34 | 10.73 | 56 | 17.67 | 82 | 25.87 | 86 | 27.13 | 258 | 81.39 | 59 | 18.61 |
| පස්සර | 214 | 23 | 10.75 | 29 | 13.55 | 46 | 21.50 | 74 | 34.58 | 172 | 80.37 | 42 | 19.63 |
| වියළුව | 116 | 3 | 2.59 | 11 | 9.48 | 25 | 21.55 | 35 | 30.17 | 74 | 63.79 | 42 | 36.21 |
| මොණරාගල | 269 | 28 | 10.41 | 30 | 11.15 | 70 | 26.02 | 76 | 28.25 | 204 | 75.84 | 65 | 24.16 |
| වැල්ලවාය | 159 | 14 | 8.81 | 16 | 10.06 | 33 | 20.75 | 28 | 17.61 | 91 | 57.23 | 68 | 42.77 |
| බිබිලේ | 254 | 22 | 8.66 | 27 | 10.63 | 76 | 29.92 | 74 | 29.13 | 199 | 78.35 | 55 | 21.65 |
| තණමල්විල | 187 | 31 | 16.58 | 29 | 15.51 | 28 | 14.97 | 29 | 15.51 | 117 | 62.57 | 70 | 37.43 |
| රත්නපුර | 612 | 81 | 13.24 | 90 | 14.71 | 139 | 22.71 | 160 | 26.14 | 470 | 76.80 | 142 | 23.20 |
| බලංගොඩ | 265 | 35 | 13.21 | 39 | 14.72 | 65 | 24.53 | 57 | 21.51 | 196 | 73.96 | 69 | 26.04 |
| නිවිතිගල | 272 | 45 | 16.54 | 33 | 12.13 | 72 | 26.47 | 70 | 25.74 | 220 | 80.88 | 52 | 19.12 |
| ඇඹිලිපිටිය | 531 | 80 | 15.07 | 85 | 16.01 | 112 | 21.09 | 116 | 21.85 | 393 | 74.01 | 138 | 25.99 |
| කෑගල්ල | 260 | 32 | 12.31 | 42 | 16.15 | 67 | 25.77 | 54 | 20.77 | 195 | 75.00 | 65 | 25.00 |
| මාවනැල්ල | 144 | 18 | 12.50 | 17 | 11.81 | 39 | 27.08 | 38 | 26.39 | 112 | 77.78 | 32 | 22.22 |
| දෙහිඕවිට | 322 | 34 | 10.56 | 38 | 11.80 | 90 | 27.95 | 93 | 28.88 | 255 | 79.19 | 67 | 20.81 |
| **එකතුව** | **26,264** | **3,023** | **11.51** | **3,283** | **12.50** | **5,910** | **22.50** | **6,943** | **26.44** | **19,159** | **72.95** | **7,105** | **27.05** |

**මූලාශ්‍රය :** පර්යේෂණ හා සංවර්ධන දත්ත, 2024, ශ්‍රී.ලං.වි.දෙ.

**1.2.5 පන්ති ප්‍රාන්තර අනුව ලකුණු ලබාගෙන ඇති ආකාරය**

වගුව **1.5**

පන්ති ප්‍රාන්තර අනුව අපේක්ෂකයන් ලකුණු ලබා ගෙන ඇති ආකාරය

| පන්ති ප්‍රාන්තර | සංඛ්‍යාතය | සංඛ්‍යාත ප්‍රතිශතය | සමුච්චිත සංඛ්‍යාතය | සමුච්චිත සංඛ්‍යාත ප්‍රතිශතය |
|---|---|---|---|---|
| 91-100 | 8 | 0.02 | 33,835 | 100.00 |
| 81-90 | 482 | 1.42 | 33,827 | 99.98 |
| 71-80 | 2,526 | 7.47 | 33,345 | 98.55 |
| 61-70 | 4,231 | 12.50 | 30,819 | 91.09 |
| 51-60 | 4,688 | 13.86 | 26,588 | 78.58 |
| 41-50 | 5,229 | 15.45 | 21,900 | 64.73 |
| 31-40 | 5,565 | 16.45 | 16,671 | 49.27 |
| 21-30 | 5,851 | 17.29 | 11,106 | 32.82 |
| 11-20 | 4,452 | 13.16 | 5,255 | 15.53 |
| 00-10 | 803 | 2.38 | 803 | 2.37 |

**මූලාශ්‍රය :** පර්යේෂණ හා සංවර්ධන දත්ත, 2024, ශ්‍රී.ලං.වි.දෙ.

0 - 10 පන්ති ප්‍රාන්තරය අතර ලකුණු ලබාගත් අපේක්ෂකයන් 794 අතුරෙන් කිසිදු ලකුනක ලබා නොගත් අපේක්ෂක සංඛ්‍යාව 9කි.

# II කොටස

## 2. ප්‍රශ්න සහ පිළිතුරු සැපයීම පිළිබඳ විශ්ලේෂණය - I පත්‍රය

### 2.1 දේශපාලන විද්‍යාව I පත්‍රයේ ව්‍යූහය

**I පත්‍රය -** කාලය පැය 02 යි.

මෙම ප්‍රශ්න පත්‍රය A හා B යනුවෙන් කොටස් දෙකකින් සමන්විත වේ. ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සැපයිය යුතු ය.

**A කොටස**

වරණ 5 බැගින් වූ බහුවරණ ප්‍රශ්න 30කින් සමන්විත වේ. එක් ප්‍රශ්නයකට ලකුණු 02 බැගින් ප්‍රශ්න 30කට ලකුණු 60කි.

**B කොටස**

කෙටි පිළිතුරු සැපයීමේ වර්ගයේ ප්‍රශ්න 20කින් සමන්විත වේ. එක් ප්‍රශ්නයකට ලකුණු 02 බැගින් ප්‍රශ්න 20කට ලකුණු 40කි.

I පත්‍රය සඳහා මුළු ලකුණු 100කි.

**මූලාශ්‍රය :** අ.පො.ස (උ.පෙළ) විභාගය වර්ෂ 2019 සහ ඉන් පසුව පැවැත්වෙන විභාග සඳහා ප්‍රශ්න පත්‍ර ව්‍යූහය හා මූලාකෘති ප්‍රශ්න, 2018, ශ්‍රී.ලං.වි.දෙ.

## 2.2 දේශපාලන විද්‍යාව I පත්‍රය

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2024
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2024
General Certificate of Education (Adv. Level) Examination, 2024

දේශපාලන විද්‍යාව I
அரசியல் விஞ்ஞானம் I
Political Science I

23 S I

පැය දෙකයි
இரண்டு மணித்தியாலம்
*Two hours*

විභාග අංකය: ....................................

**උපදෙස්:**
* මෙම ප්‍රශ්න පත්‍රය A සහ B යනුවෙන් කොටස් **දෙකකින්** සමන්විත ය.
* A කොටස බහුවරණ ප්‍රශ්න 30 කින් සහ B කොටස කෙටි පිළිතුරු සැපයීමේ ප්‍රශ්න 20 කින් යුක්ත වේ.
* **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු මෙම පත්‍රයේ ම සැපයිය යුතු ය.
* එක් ප්‍රශ්නයකට ලකුණු **දෙක** බැගින් මුළු ලකුණු 100 කි.

**පරීක්ෂකගේ ප්‍රයෝජනය සඳහා පමණි.**

| පිටු අංකය | ප්‍රශ්න අංකය | ලකුණු |
|---|---|---|
| 1 | 1 - 3 | |
| 2 | 4 - 11 | |
| 3 | 12 - 17 | |
| 4 | 18 - 23 | |
| 5 | 24 - 30 | |
| 6 | 31 - 37 | |
| 7 | 38 - 45 | |
| 8 | 46 - 50 | |
| එකතුව | | |

| | අක්ෂර | සංකේත අංකය |
|---|---|---|
| 1 වන පරීක්ෂක | | |
| 2 වන පරීක්ෂක | | |
| අතිරේක ප්‍රධාන පරීක්ෂක | | |
| ගණිත පරීක්ෂක | | |
| ප්‍රධාන පරීක්ෂක | | |

### A කොටස

* අංක 1 සිට 20 තෙක් ඇති ප්‍රශ්නවලට **නිවැරදි** හෝ **වඩාත් ගැළපෙන** පිළිතුර තෝරා, එහි අංකය වරහන් තුළ ඇති තිත් ඉර මත ලියන්න.

**1.** දේශපාලන විද්‍යාව විෂයට අයත් වන්නේ පහත සඳහන් කවරක් ද?
   (1) සංවිධාන චර්යාව   (2) දේව ධර්මය   (3) මානව පරිණාමය
   (4) භාෂාව සහ සංස්කෘතිය   (5) තුලනාත්මක ආණ්ඩුක්‍රමය (......)

**2.** දේශපාලන විද්‍යාවේ දාර්ශනික ප්‍රවේශය
   (1) දේශපාලන අධ්‍යයනයේ නවතම ප්‍රවේශයන්ගෙන් එකකි.
   (2) හැරල්ඩ් ලැස්වෙල් සහ ඩේවිඩ් ඊස්ටන් විසින් හඳුන්වාදෙන ලදී.
   (3) ඇරිස්ටෝටල් විසින් ප්‍රතික්ෂේප කරන ලදී.
   (4) ප්‍රධාන දේශපාලන සංකල්ප පිළිබඳ ප්‍රතිමානික අවබෝධය සපයයි.
   (5) දේශපාලන අධ්‍යයනයටආනුභවික විමර්ශන ක්‍රම හඳුන්වා දුන්නේ ය. (......)

**3.** නූතන රාජ්‍යය
   (1) 17 වන සහ 19 වන සියවස් අතර කාලය තුළ ආසියාවේ පැන නැඟිණි.
   (2) ව්‍යවස්ථාදායක සහ විධායක කාර්යයන්ට සීමා වෙයි.
   (3) ගෝලීයකරණය හේතුකොට ගෙන ඇතිවන අභියෝගවලට මුහුණ දෙයි.
   (4) ඉඩම් හිමි පන්තියේ අභිලාෂ පිළිබිඹු කරයි.
   (5) නම්‍යශීලී දේශසීමා මායිම් මත පදනම් වෙයි. (......)

**4.** ආණ්ඩුව
(1) අභ්‍යන්තර ස්වාධිපත්‍යය හිමිකර ගනියි.
(2) ස්ථිර ආයතනයකි.
(3) සමස්ත සමාජය වෙනුවෙන් තීරණ ගැනීමේ වගකීම උසුලයි.
(4) මුල්වරට පැන නැගුණේ 18 වන සියවසේ ආසියාවේ දී ය.
(5) සෙසු සියලු සංවිධානවලට ඉහළින් සිටියි. (……)

**5.** ජනාධිපති ආණ්ඩුක්‍රමයේ ප්‍රධාන ලක්ෂණවලින් එකක් වන්නේ,
(1) දේශපාලන විධායකය සාමූහික වීමයි.
(2) ආණ්ඩුව ව්‍යවස්ථාදායකයට වගකීමයි.
(3) ආණ්ඩුවේ නායකත්වය සහ රාජ්‍යයේ නායකත්වය වෙන් වෙන් ව පැවතීමයි.
(4) ව්‍යවස්ථාදායකයේ විශ්වාසය මත ආණ්ඩුව පැවතීමයි.
(5) විධායක අධිකාරිත්වය ජනාධිපතිවරයා මත ඒකරාශීව පැවතීමයි. (……)

**6.** ලිබරල්වාදයේ ප්‍රධාන චින්තකයන්ගෙන් සමහරක් වූයේ
(1) ජෙරමි බෙන්තම්, ජෝන් ස්ටුවර්ට් මිල්, සහ ඇඩම් ස්මිත් ය.
(2) තෝමස් හොබ්ස්, එඩ්මන්ඩ් බර්ක්, සහ රොබට් නෝසික් ය.
(3) ෂාන් ෂාක් රූසෝ (Jean Jacques Rousseau), වුඩ්රෝ විල්සන්, සහ මහත්මා ගාන්ධි ය.
(4) රොබට් ඕවන්, කාල්මාක්ස්, සහ ව්ලැඩිමීර් ලෙනින් ය.
(5) මේරි වුල්ස්ටන්ක්‍රාෆ්ට්, බෙටී ෆ්‍රීඩන්, සහ කේට් මිලට් ය. (……)

**7.** ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක් තුළ
(1) රාජ්‍යය සහ ආණ්ඩුව අතර වෙනස අපැහැදිලි ය.
(2) අධිකරණය සලකනු ලබන්නේ විධායකයේ ශාඛාවක් ලෙසිනි.
(3) පුද්ගල නිදහස සහ අයිතිවාසිකම්වලට ගරු කෙරේ.
(4) පුරවැසියන්ගේ මැතිවරණ දේශපාලන සහභාගිත්වය අධෛර්යයට පත් කෙරේ.
(5) පාලකයන් ජනතාවට වගවීමෙන් නිදහස් ය. (……)

**8.** "ධනවාදී සමාජ සහ ආර්ථික ක්‍රමය ගොඩනගනු ලබන්නේ ශ්‍රම සූරා කෑම මත ය" යන අදහස ඉදිරිපත් කරන ලද්දේ පහත සඳහන් දේශපාලන චින්තකයන් අතුරෙන් කවරෙකු ද?
(1) කාල් මාක්ස් (2) ජෝන් ලොක් (3) ඒ.වී. ඩයිසි
(4) ජීන් බොඩෑන් (Jean Bodin) (5) මොන්ටෙස්ක්‍යු (……)

**9.** සමාජ ප්‍රජාතන්ත්‍රවාදය
(1) පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදය අධෛර්යමත් කරයි.
(2) සමාජවාදී මතය පමණක් අවධාරණය කරයි.
(3) සමාජ සුබසාධනය වෙනුවෙන් පෙනී සිටියි.
(4) සමාජවාදය සඳහා විප්ලවකාරී මගක් දිරිමත් කරයි.
(5) ආර්ථිකය තුළ රාජ්‍ය මැදිහත්වීම වළක්වයි. (……)

**10.** ස්ත්‍රීවාදය
(1) සමාජය තුළ ස්ත්‍රී-පුරුෂභාවී වෙනස්කම් අනුමත කරයි.
(2) ස්ත්‍රීන් පුරුෂයින්ට වඩා උත්තරීතර බව ප්‍රකාශ කරයි.
(3) ගෘහමය කටයුතු ඉටුකරලීමට පමණක් ස්ත්‍රීන් දිරිමත් කරයි.
(4) ස්ත්‍රීන්ගේ දේශපාලන සහභාගිත්වය අධෛර්යමත් කරයි.
(5) පීතෘ මූලික ආයතන විවේචනය කරයි. (……)

**11.** නිදහස් සහ සාධාරණ මැතිවරණ පැවැත්වීම සඳහා අත්‍යවශ්‍ය කොන්දේසිවලින් එකක් වන්නේ,
(1) ආධිපත්‍ය සහිත ඒක පක්ෂ ක්‍රමයක් පැවතීමයි.
(2) කේවල මන්ත්‍රී ඡන්ද කොට්ඨාශ ක්‍රමයක් තිබීමයි.
(3) බලසම්පන්න පොලිස් සහ සන්නද්ධ හමුදා පැවතීමයි.
(4) ක්‍රියාකාරී සමාජ මාධ්‍ය තිබීමයි.
(5) මැතිවරණ පැවැත්වීම සඳහා ස්වාධීන සහ බලවත් ආයතනයක් පැවතීමයි. (……)

**12.** පහත සඳහන් සංකල්පවලට දෙන ලද විස්තර අතුරෙන් එකක් පමණක් නිවැරදි ය. නිවැරදි විස්තරය අයත් සංකල්පය තෝරන්න.

(1) ජාතිය - පොදු භාෂාවක්, ආගමක්, සම්ප්‍රදායන් සහ සංස්කෘතියක් හිමි කරගත් එමෙන්ම තමන් නිශ්චිත දේශපාලන ප්‍රජාවක් වශයෙන් ඔවුන්ම සළකන්නා වූ පුද්ගල කණ්ඩායමකි.

(2) බලපෑම් කණ්ඩායම් - පොදු අපේක්ෂාවන් සහ ඉහළ මට්ටමේ දේශපාලන කැපවීම් නිසා වෙන්කොට හඳුනාගත හැකි විශාල පුද්ගල සමූහයකි.

(3) සමාජ ව්‍යාපාර - රාජ්‍ය ප්‍රතිපත්ති සහ ආණ්ඩුවේ ක්‍රියාකාරකම්වලට බලපෑම් කිරීමේ අරමුණින් ක්‍රියාකරන විධිමත් ජනතා සංවිධානයන් ය.

(4) සිවිල් සමාජය - ආණ්ඩු බලය දිනාගැනීමේ අරමුණින් සංවිධානය වූ ජන සමූහයන් ය.

(5) දේශපාලන පක්ෂය - ආණ්ඩුවේ පාලනය යටතේ ක්‍රියාකරන පුරවැසියන්ගේ සංවිධානයකි. (……)

**13.** සහසන්ධිය ක්‍රමයක් (a confederation) තුළ

(1) සන්ධීය ඒකක අතර ශක්තිමත් සම්බන්ධතාවක් පවත්වා ගැනේ.

(2) මධ්‍යය විසින්ම සිය බලතල තීරණය කරනු ලැබේ.

(3) ස්වාධිපත්‍යය මධ්‍යය සහ සන්ධීය ඒකක අතර බෙදා ගැනේ.

(4) සන්ධීය ඒකක මධ්‍යයට වඩා බලවත් ය.

(5) ජාතික මට්ටමේ විෂයයන් රාශියක් සම්බන්ධයෙන් බලය මධ්‍යයට තිබේ. (……)

**14.** ඇමෙරිකා එක්සත් ජනපදයේ සෙනේට් සභාව

(1) ප්‍රාන්ත රාජ්‍ය 50 න් එක් එක් ප්‍රාන්තය සඳහා නියෝජිතයන් තිදෙනෙකු බැගින් තෝරා එවීමට ඉඩ සලසයි.

(2) ලෝකයේ වඩාත්ම බලගතු දෙවැනි මණ්ඩලය ලෙසින් සලකනු ලබයි.

(3) මහජන මන්ත්‍රී මණ්ඩලයට ව්‍යවස්ථාමය ලෙසින් යටත් වේ.

(4) මහජන මන්ත්‍රී මණ්ඩලය විසින් සම්මත කරනු ලබන පනත් කෙටුම්පතක් වසරක් දක්වා ප්‍රමාද කිරීමේ බලය භුක්ති විඳී.

(5) ජනාධිපතිවරයා ඇතිකරගන්නා ගිවිසුම් අනුමත කිරීමේ බලයකින් තොර ය. (……)

**15.** පහත සඳහන් රට සහ එහි ආණ්ඩු ලක්ෂණය නිවැරදි ලෙසින් දක්වන විස්තරය තෝරන්න.

(1) ඇමෙරිකා එක්සත් ජනපදය - ජනාධිපතිවරයා සහ උප ජනාධිපතිවරයා සෑම වසර හතරකට වරක්ම ඡන්දයෙන් තෝරා පත් කර ගැනෙති.

(2) ඉන්දියාව - 19 වන සියවසේ දී කැබිනට් ආණ්ඩුක්‍රමය වර්ධනය විය.

(3) ප්‍රංශය - සෑම මහමැතිවරණයකින්ම පසුව ජාතික මන්ත්‍රණ සභාව විසින් ජනාධිපතිවරයා තෝරා පත් කර ගනු ලැබේ.

(4) එක්සත් රාජධානිය - රාජාණ්ඩුවකින් තොර වූ පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුක්‍රමයකි.

(5) ස්විට්සර්ලන්තය - විධායක ශාඛාව වන්නේ පාර්ලිමේන්තුව විසින් තෝරා පත් කරනු ලබන කැබිනට් මණ්ඩලයයි. (……)

**16.** රාජ්‍ය ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරන ආයතන වන්නේ,

(1) දේශපාලන පක්ෂ ය.

(2) අභිලාෂ කණ්ඩායම් ය.

(3) ප්‍රතිපත්ති උපදේශන කණ්ඩායම් ය.

(4) ස්ථිර විධායකය ය.

(5) සමාජ ව්‍යාපාර ය. (……)

**17.** නිදහසින් පසු අවධිය තුළ ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රතිපත්තිය හැඩ ගස්වන ලද ප්‍රධාන සාධකය වන්නේ,

(1) පවුල් පැළැන්ති දේශපාලනය (dynastic politics) ය.

(2) මහජන මතය ය.

(3) මැතිවරණ පොරොන්දු ය.

(4) සාර්ක් සාමාජිකත්වය ය.

(5) බලයේ සිටින ආණ්ඩුවේ ප්‍රතිපත්ති ය. (……)

**18.** ගැටුම්වල ජීවන චක්‍රය මගින් යෝජනා කෙරෙන්නේ,

(1) ගැටුම් යනු අවසානයක් නැති ක්‍රියාවලියක් බව ය.

(2) ගැටුම ස්ථිතික ක්‍රියාවලියක් බව ය.

(3) ගැටුම් කිසිවිටෙකවත් සාමකාමී ලෙසින් අවසන් නොවන බව ය.

(4) ගැටුම යනු ගතික ක්‍රියාවලියක් බව ය.

(5) ගැටුම් සෑම විටක දී ජය-ජය (win-win) විසඳුමක් ලබා දෙන බව ය. (……)

**19.** බලහත්කාරය මගින් විදේශ ප්‍රතිපත්ති අරමුණු ඉටුකරගන්නා මාධ්‍යයන්ට ඇතුළත් වන්නේ,

(1) රාජ්‍ය තාන්ත්‍රික සාකච්ඡා ය. (2) විදේශ ආධාර ය.

(3) ආර්ථික ගිවිසුම් ය. (4) ආර්ථික සම්බාධක ය.

(5) සංස්කෘතික රාජ්‍යතාන්ත්‍රික සම්බන්ධතා ය. (……)

**20.** 1648 වෙස්ට්ෆේලියානු සාම ගිවිසුම

(1) ජාත්‍යන්තර සාමය සහ ආරක්ෂාව පවත්වාගෙන යාමට ජාතීන්ගේ සංගමය (League of Nations) පිහිටු වී ය.

(2) ගිවිසුම් ගත වූ රාජ්‍යයන්ගේ භෞමික දේශසීමා තීරණය කෙළේ ය.

(3) යුරෝපා බලවතුන්ගේ යටත්විජිත පාලනයන් අවසන් කෙළේ ය.

(4) රාජ්‍ය පරමාධිපත්‍යය නොසළකා හැරියේ ය.

(5) යුරෝපයේ ආගමික නිදහස සීමා කෙළේ ය. (……)

- අංක **21** සිට **25** තෙක් වූ ප්‍රශ්නවලට දී ඇති ප්‍රකාශ අතුරින් **නිවැරදි ප්‍රකාශ කාණ්ඩය** ඇතුළත් වරණය තෝරා එහි අංකය වරහන් තුළ ඇති තිත් ඉර මත ලියන්න.

**21.** යටත්විජිත ලංකාව සඳහා කෝල්බෲක්-කැමරන් කොමිසම නිර්දේශ කෙළේ

A - රාජ්‍ය නිර්බාධ ආර්ථිකයකි.

B - පොදු අධිකරණ ක්‍රමයක් පිහිටුවීමට ය.

C - ආණ්ඩුව මගින් පවත්වාගෙන යනු ලබන සියලු ස්වදේශික පාඨශාලා තහනම් කිරීමට ය.

D - සීමිත බලයක් සහිත ආණ්ඩුවක් ය.

E - ඒකාබද්ධ ආණ්ඩුක්‍රමයක් ස්ථාපිත කිරීමට ය.

(1) A B C D (2) A B C E (3) A B D E (4) A C D E (5) B C D E (……)

**22.** 1910 සහ 1930 අතර කාලය තුළ හඳුන්වා දෙන ලද ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ යටතේ

A - ව්‍යවස්ථාදායක සභාව අනුක්‍රමයෙන් සිය බලතල වර්ධනය කර ගත්තේ ය.

B - ආණ්ඩුකාරයාගේ බලතල ක්‍රම ක්‍රමයෙන් අඩු කෙරිණ.

C - සීමිත ඡන්ද බලය සමග මන්ත්‍රීවරුන් තෝරා පත් කර ගැනීමේ මූලධර්මය හඳුන්වා දෙන ලදී.

D - ව්‍යවස්ථා ව්‍යුහය තුළ රැඩිකල් වෙනස්කම් සිදු කෙරිණි.

E - නිල නොලත් සාමාජිකයන්ගේ සංඛ්‍යාව වැඩි කෙරිණි.

(1) A B C D (2) A B C E (3) A B D E (4) A C D E (5) B C D E (……)

**23.** 1947/1948 සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ

A - සෙනෙට් මණ්ඩලයේ සියලුම මන්ත්‍රීන් ධුර කාලය එකවර අවසන් නොකළහ.

B - අග්‍රාණ්ඩුකාරයාගේ ධූරය නිශ්චිත නිල කාලයකට සීමා නොවී ය.

C - අග්‍රාණ්ඩුකාරයාගේ කටයුතු කිසිදු අධිකරණයක දී අභියෝග කළ නොහැකි විය.

D - කැබිනට් මණ්ඩලයේ සාමූහික වගකීමේ මූලධර්මය පිළි නොගැණිනි.

E - එක් එක් අමාත්‍යවරයා තම අමාත්‍යධූරයේ කටයුතු සම්බන්ධව පාර්ලිමේන්තුවට පෞද්ගලිකව වගකිව යුතු විය.

(1) A B C D (2) A B C E (3) A B D E (4) A C D E (5) B C D E (……)

**24.** 1972 ප්‍රථම ජනරජ ව්‍යවස්ථාව

A - බලතල වෙන්කිරීමේ මූලධර්මය නොතකා හැරී ය.

B - ප්‍රිවි කවුන්සිලයේ අධිකරණ කමිටුවට අභියාචනා කිරීමේ අයිතිය අහෝසි කෙළේ ය.

C - රාජ්‍යයේ ඒකීය ගතිලක්ෂණය පිළිගත්තේ ය.

D - යටතේ ජනාධිපතිවරයා ඔහුගේ නිල කටයුතු සම්බන්ධයෙන් ජාතික රාජ්‍ය සභාවට වග කී ය.

E - ස්වාධීන රාජ්‍ය සේවයක් පිළිබඳ සංකල්පය ප්‍රතික්ෂේප කෙළේ ය.

(1) A B C D (2) A B C E (3) A B D E (4) A C D E (5) B C D E (......)

**25.** 1978 මුල් ව්‍යවස්ථාවට අනුව ජනාධිපතිවරයා

A - අගමැතිවරයා ධූරයෙන් පහ කිරීමට සහ කැබිනට් මණ්ඩලය සංශෝධනය කිරීමට බලය හිමි වූවෙකි.

B - පාර්ලිමේන්තුවට වගකිව යුතු නොවී ය.

C - වසර පහක ධූර කාලයක් සඳහා තෝරා ගනු ලැබිණි.

D - තම අභිමතයට අනුව සියලු ප්‍රධාන පත් කිරීම් සිදු කළේ ය.

E - පාර්ලිමේන්තුව විසින් ප්‍රතික්ෂේප කරන ලද පනත් කෙටුම්පතක් ජනමත විචාරණයකට යොමු කිරීමේ බලය හිමි වූවෙකි.

(1) A B C D (2) A B C E (3) A B D E (4) A C D E (5) B C D E (......)

- අංක **26** සිට **30** තෙක් ඇති ප්‍රශ්න සඳහා ප්‍රකාශ දෙක බැගින් දක්වා ඇත. එක් එක් ප්‍රශ්නය හා සම්බන්ධව දක්වා ඇති ප්‍රකාශ යුගලයට වඩාත් ගැලපෙන්නේ පහත වගුවේ දැක්වෙන (1), (2), (3), (4) සහ (5) යන වරණවලින් කවර වරණය දැ'යි තෝරා, එහි අංකය වරහන් තුළ ඇති තිත් ඉර මත ලියන්න.

| අංකය | පළමුවැනි ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය |
|---|---|---|
| (1) | සත්‍ය | සත්‍ය |
| (2) | සත්‍ය | අසත්‍ය |
| (3) | අසත්‍ය | සත්‍ය |
| (4) | අසත්‍ය | අසත්‍ය |
| (5) | සත්‍ය | සත්‍ය වන අතර පළමුවැනි ප්‍රකාශය තවදුරටත් විස්තර කරයි. |

| | පළමුවැනි ප්‍රකාශය | දෙවැනි ප්‍රකාශය | |
|---|---|---|---|
| **26.** | ශ්‍රී ලංකාවේ විධායක ජනාධිපති ධූරය නිර්මාණය කරන ලද්දේ 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට 1977 වර්ෂයේ දී සිදු කරන ලද සංශෝධනයකිනි. | 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව හඳුන්වාදීම මගින් ජනාධිපති ක්‍රමයට ගැළපෙන ලෙස සමස්ත ව්‍යවස්ථා ව්‍යුහය වෙනස් කරනු ලැබිණි. | (......) |
| **27.** | ශ්‍රී ලංකාවේ 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව ජනාධිපති ධූරය පුරප්පාඩු වුවහොත් ඉතිරි ධූර කාලය සඳහා පාර්ලිමේන්තුව විසින් එහි සාමාජිකයන් අතුරෙන් එක් අයකු ජනාධිපතිවරයා ලෙස තෝරාපත් කර ගත යුතු ය. | අනුප්‍රාප්තික ජනාධිපතිවරයෙකු තෝරා පත් කරගැනීමේ දී පාර්ලිමේන්තුව තුළ ප්‍රකාශිත ඡන්දවලින් පරම බහුතරයක් තිබීම අවශ්‍ය වේ. | (......) |
| **28.** | 1987 වසරේ දී ශ්‍රී ලංකාවේ පළාත් සභා පිහිටුවීම හේතු කොටගෙන දිවයිනේ රාජ්‍ය සේවයේ ප්‍රධාන වෙනසක් ඇති විය. | පළාත් රාජ්‍ය සේවයේ ප්‍රධානියා වන්නේ ප්‍රධාන අමාත්‍යවරයා ය. | (......) |
| **29.** | ශ්‍රී ලංකාවට මනාප ඡන්ද ක්‍රමය හඳුන්වා දෙනු ලැබූයේ 1978 මුල් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගිනි. | ඡන්දදායකයකුට පාර්ලිමේන්තු මැතිවරණයක දී එකම පක්ෂයේ අපේක්ෂකයන් තිදෙනෙකුට මනාප තුනක් ප්‍රකාශ කළ හැකි ය. | (......) |
| **30.** | 1956-1977 අතර කාලය තුළ ද්වි පක්ෂ ක්‍රමය ශ්‍රී ලංකාවේ පක්ෂ දේශපාලනයේ ගතිලක්ෂණයක් විණි. | 1989 වසරේ සිට ශ්‍රී ලංකාවේ දේශපාලන පක්ෂ ක්‍රමය බහු පක්ෂ ක්‍රමයක් කරා ගමන් කර තිබේ. | (......) |

## B කොටස

**31.** ඓතිහාසික විකාශනය තුළ ආකෘති හෝ මාදිලි කිහිපයකට රාජ්‍යය වර්ගීකරණය කළ හැකි ය. ඒවායින් **දෙකක්** නම් කරන්න.

* ගෝත්‍රික රාජ්‍යය
* ග්‍රීක නාගරික (පෞර) රාජ්‍යය
* රාජාණ්ඩු
* ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යය
* සමාජවාදී රාජ්‍යය
* ෆැසිස්ට් රාජ්‍යය
* යටත් විජිත රාජ්‍යය
* පශ්චාත් යටත් විජිත රාජ්‍යය
* නව ලිබරල් රාජ්‍යය

**32.** (1) රාජ්‍ය නිර්මාණ ගැටුම් (the state formation conflict) පිළිබඳ ලියා ඇති ශාස්ත්‍රඥයෙකු නම් කරන්න.

පීටර් වොලන්ස්ටීන්

(2) 'තිරසර සාමය' පිළිබඳ සංකල්පය හඳුන්වා දුන් ශාස්ත්‍රඥයා නම් කරන්න.

යොහාන් ගැල්ටුන්

**33.** පහත සඳහන් කෘතිවල කතුවරුන් නම් කරන්න.

(1) කොමියුනිස්ට් ප්‍රකාශනය

කාල් මාක්ස් සහ ෆෙඩ්රික් එංගල්ස්

(2) ලෙවියාතන් (*Leviathan*)

තොමස් හොබ්ස්

**34.** ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රධාන වර්ග තුනකට බෙදා දැක්විය හැකි ය. ඒවායින් **දෙකක්** නම් කරන්න.

* ලිඛිත - අලිඛිත
* නම්‍ය - අනම්‍ය
* ඒකීය - සංඝීය

**35.** දේශපාලන පක්ෂ ක්‍රම වර්ග පහකට බෙදා දක්වනු ලැබේ. ඒවායින් **දෙකක්** නම් කරන්න.

* ඒක/තනි පක්ෂ ක්‍රමය
* ද්වි පක්ෂ ක්‍රමය
* බහු පක්ෂ ක්‍රමය
* අධිපති තනි/ඒක පක්ෂ ක්‍රමය
* අධිපති ද්වි පක්ෂ ක්‍රමය

**36.** එක්සත් රාජධානියේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව කේන්ද්‍රිය මූලධර්ම කිහිපයක් මත පදනම් වේ. ඉන් **දෙකක්** නම් කරන්න.

* පාර්ලිමේන්තු පරමාධිපත්‍යය
* ව්‍යවස්ථානුකූල රාජාණ්ඩුව
* නීතියේ ආධිපත්‍යය
* පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමය

**37.** 'සමාජවාදී රාජ්‍යය ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයෙන් මූලධාර්මිකව වෙනස් වේ.' වෙනස්කම් **දෙකක්** නම් කරන්න.

1. පෞද්ගලික දේපල සහ ඒවායෙහි හිමිකාරිත්වයට විරුද්ධ වීම
2. රාජ්‍ය විසින් මුළුමනින්ම ආර්ථිකය මෙහෙයවීම

**38.** සමාජවාදී ස්ත්‍රීවාදයේ ලක්ෂණ **දෙකක්** නම් කරන්න.

1. ස්ත්‍රී විමුක්තිය සඳහා වන අරගලය සමානාත්මතාවය සඳහා වූ සමාජයේ සෙසු අරගලවලට සම්බන්ධ කිරීම
2. ස්ත්‍රීන්ගේ විමුක්තිය සහ පූර්ණ සමානාත්මතාවය සමාජවාදය විසින් පමණක් සහතික කිරීම

**39.** අර්ධ ජනාධිපති ක්‍රමයේ (semi-presidential system) ලක්ෂණ **දෙකක්** නම් කරන්න.

* තෝරාපත් කරගත් ජනාධිපතිවරයා සහ පත් කරගත් අගමැතිවරයාගේ එකතුවෙන් යුත් විධායකයක් වීම
* ජනාධිපතිවරයා විසින් අගමැතිවරයා පත් කරන අතර ජනාධිපතිවරයාට පාර්ලිමේන්තුව විසුරුවා හැරීමේ බලය ද පැවතීම
* ජනාධිපතිවරයා නිශ්චිත නිලකාලයක් සමග සීමිත වාර ගණනකට ධූරය දැරීම
* අගමැතිවරයා සහ ඇමති මණ්ඩලය ජනාධිපතිවරයා සහ ව්‍යවස්ථාදායකය යන දෙකටම වගකීම
* ජනාධිපතිවරයා රාජ්‍ය නායකයා වන අතර ආණ්ඩුවේ නායකයා වශයෙන් අගමැති සමග විධායක බලතල පංගු කරගැනීම

**40.** ලෝකය තුළ භාවිතයට ගනු ලබන ප්‍රධාන මැතිවරණ ක්‍රම කිහිපයක් තිබේ. ඒවායින් **දෙකක්** නම් කරන්න.

* සරළ බහුතර ක්‍රමය
* සමානුපාතික ක්‍රමය
* මිශ්‍ර නියෝජන ක්‍රමය

**41.** වර්තමානයේ ලෝක දේශපාලනයට බලපෑම් කරන ජාත්‍යන්තර ත්‍රස්තවාදී සංවිධාන **දෙකක්** නම් කරන්න.

1. අයි. එස්. අයි. එස්.
2. අල් කයිඩා

**42.** නිදහසින් පසු ශ්‍රී ලංකාවේ විදේශ සම්බන්ධතා හැඩගස්වා ඇති විදේශ ප්‍රතිපත්ති දිශානති **දෙකක්** නම් කරන්න.

* බටහිරට පක්ෂපාතී
* සමාජවාදයට පක්ෂ පක්ෂපාතී
* නොබැඳි

**43.** (1) ලංකාවේ 'රාජකාරි ක්‍රමය' අහෝසි කරන ලද ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණය කුමක් ද?

කෝල්බෲක්-කැමරන් ප්‍රතිසංස්කරණ

(2) යටත් විජිත ශ්‍රී ලංකාවේ ව්‍යවස්ථාදායක සභාවට පළමුවරට මැතිවරණ මූලධර්මය (elective principle) හඳුන්ව දෙන ලද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණය කුමක් ද?

කෲව්-මැකලම් ප්‍රතිසංස්කරණ

**44.** සුළුතර ප්‍රජාවන්ගේ අභිලාෂ ආරක්ෂා කිරීමට ඩොනමෝර් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් ගන්නා ලද ක්‍රියාමාර් **දෙකක්** නම් කරන්න.

* පත්කල මන්ත්‍රීන් අට දෙනා
* විධායක කාරක සභා
* ආණ්ඩුකරු සතු පනත් ප්‍රතික්ෂේප කිරීමේ බලය

**45.** ඩොනමෝර් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ රාජ්‍ය මන්ත්‍රණ සභා මැතිවරණ දෙකක් පැවැත්විණි. ඒවා පැවැත්වූයෙ කුමන වර්ෂවල දී ද?

1. 1931
2. 1936

**46.** සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ රාජ්‍ය සේවා කොමිෂන් සභාව ස්ථාපිත කිරීමට මුල් වූ හේතු **දෙකක්** නම් කරන්න.

1. රාජ්‍ය සේවකයන් දේශපාලන අතපෙවීම් වලින් ආරක්ෂා කර ගැනීම
2. රාජ්‍ය සේවයෙහි අපක්ෂපාතිත්වය පිළිබඳව සුළුතර කණ්ඩායම් අතර විශ්වාසය ගොඩ නැගීම

**47.** (1) ශ්‍රී ලංකාවේ ප්‍රථම ජනරජ ව්‍යවස්ථාව යටතේ ජනාධිපතිවරයා පත් කරන ලද්දේ කවරෙකු විසින් ද?

අග්‍රාමාත්‍යවරයා විසින්

(2) ශ්‍රී ලංකාවේ ප්‍රථම ජනරජ ව්‍යවස්ථාව යටතේ ජනාධිපතිවරයාගේ නිල කාලය වසර කීය ද?

වසර 4 කි.

**48.** 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ පිහිටුවන ලද ශ්‍රේෂ්ඨාධිකරණයට අධිකරණ බලතල ක්ෂේත්‍ර කිහිපයක් ඇත ඒවායින් **දෙකක්** නම් කරන්න.

* පනත් කෙටුම්පත්වල ව්‍යවස්ථානුකූලත්වය සම්බන්ධයෙන් වූ අධිකරණ බලය
* මූලික අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා වූ අධිකරණ බලය
* අවසාන අභියාචනාධිකරණ බලය
* උපදේශක අධිකරණ බලය
* ඡන්ද පෙත්සම් සම්බන්ධයෙන් වූ අධිකරණ බලය
* පාර්ලිමේන්තු වරප්‍රසාද කඩ කිරීමක් සම්බන්ධයෙන් අධිකරණ බලය සහ
* පාර්ලිමේන්තුව විසින් නීතියෙන් පවරනු ලබන හෝ නියම කරනු ලබන වෙනත් කාරණා සම්බන්ධයෙන් වූ අධිකරණ බලය

**49.** ශ්‍රී ලංකාවේ 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 19 වන සංශෝධනය යටතේ ස්වාධීන කොමිෂන් සභා නවයක් පිහිටුවන ලදී. ඒවායින් **දෙකක්** නම් කරන්න.

* මැතිවරණ කොමිෂන් සභාව
* රාජ්‍ය සේවා කොමිෂන් සභාව
* ජාතික පොලිස් කොමිෂන් සභාව
* විගණන සේවා කොමිෂන් සභාව
* ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
* අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශනය කිරීමේ කෙමිෂන් සභාව
* මුදල් කොමිෂන් සභාව
* සීමා නිර්ණය කොමිෂන් සභාව
* ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව

**50.** සරල බහුතර නියෝජන ක්‍රමයේ අවාසි **දෙකක්** දක්වන්න.

* ව්‍යවස්ථාදායකය තුල මහජන මතය විකෘති ආකාරයට ප්‍රකාශ වීම
* ආණ්ඩුව සුළුතර කැමැත්ත මත පදනම් වීම හේතුවෙන් ආණ්ඩුවේ සුජාතභාවය හානියට පත් වීම
* ප්‍රධාන පක්ෂ වලට අධි නියෝජනයක් සහ කුඩා පක්ෂ වලට ඌන නියෝජනයක් ලැබීම
* සුළුතර සහ කුඩා පක්ෂ වලට ප්‍රමාණවත් නියෝජනයක් නොලැබීම

## 2.3 I පත්‍රය සඳහා ලකුණු දීමේ පටිපාටිය

### වගුව 2.1

1 - A කොටසෙහි ලකුණු දීමේ පටිපාටිය

| ප්‍රශ්න අංකය | නිවැරදි වරණය | ප්‍රශ්න අංකය | නිවැරදි වරණය |
|---|---|---|---|
| 01. | 5 | 16. | 4 |
| 02. | 4 | 17. | 5 |
| 03. | 3 | 18. | 4 |
| 04. | 3 | 19. | 4 |
| 05. | 5 | 20. | 2 |
| 06. | 1 | 21. | 3 |
| 07. | 3 | 22. | 2 |
| 08. | 1 | 23. | 2 |
| 09. | 3 | 24. | 4 |
| 10. | 5 | 25. | 3 |
| 11. | 5 | 26. | 1 |
| 12. | 1 | 27. | 5 |
| 13. | 4 | 28. | 2 |
| 14. | 2 | 29. | 3 |
| 15. | 1 | 30. | 4 |

නිවැරදි එක් පිළිතුරකට ලකුණු 02 බැගින් මුළු ලකුණු 60කි.

කෙටි ලිඛිත පිළිතුරකට ලකුණු 02 බැගින් මුළු ලකුණු 40කි.

I පත්‍රයේ මුළු ලකුණු - 60+40 =100

**මූලාශ්‍රය** - අ.පො.ස (උ.පෙළ) දේශපාලන විද්‍යාව ලකුණුදීමේ පටිපාටිය, 2024, ශ්‍රී.ලං.වි.දෙ.

## 2.4 I පත්‍රයේ වරණ තෝරා ඇති ආකාරය

**වගුව 2.2**

1-A කොටසෙහි එක් එක් ප්‍රශ්නයෙහි වරණ තෝරා ඇති අපේක්ෂකයන් ප්‍රතිශතය

| ප්‍රශ්න අංකය | නිවැරදි වරණය | එක් එක් වරණය තෝරා ගෙන ඇති අපේක්ෂකයන්ගේ ප්‍රතිශතය | | | | | ** |
|---|---|---|---|---|---|---|---|
| | | 1 | 2 | 3 | 4 | 5 | |
| 1 | 5 | 5.93 | 8.31 | 4.96 | 3.31 | 77.50 | 0.00 |
| 2 | 4 | 8.47 | 3.43 | 4.03 | 70.34 | 13.64 | 0.08 |
| 3 | 3 | 14.24 | 6.78 | 65.85 | 2.25 | 10.72 | 0.17 |
| 4 | 3 | 18.73 | 4.96 | 58.90 | 5.34 | 12.08 | 0.00 |
| 5 | 5 | 3.14 | 7.80 | 11.91 | 3.64 | 73.43 | 0.08 |
| 6 | 1 | 27.97 | 39.11 | 23.14 | 8.05 | 1.65 | 0.08 |
| 7 | 3 | 4.28 | 4.53 | 84.62 | 2.50 | 3.94 | 0.13 |
| 8 | 1 | 68.47 | 9.28 | 6.95 | 8.77 | 6.31 | 0.21 |
| 9 | 3 | 2.63 | 6.02 | 73.77 | 9.83 | 7.54 | 0.21 |
| 10 | 5 | 10.76 | 14.66 | 1.36 | 5.76 | 67.42 | 0.04 |
| 11 | 5 | 4.70 | 12.67 | 8.35 | 9.49 | 64.32 | 0.47 |
| 12 | 1 | 47.88 | 12.97 | 14.36 | 9.24 | 15.38 | 0.17 |
| 13 | 4 | 17.88 | 6.44 | 25.93 | 40.47 | 8.98 | 0.30 |
| 14 | 2 | 17.42 | 47.71 | 13.73 | 15.64 | 5.00 | 0.51 |
| 15 | 1 | 31.82 | 12.84 | 15.25 | 20.21 | 19.24 | 0.64 |
| 16 | 4 | 21.99 | 4.96 | 13.64 | 55.47 | 3.77 | 0.17 |
| 17 | 5 | 4.79 | 11.23 | 5.30 | 28.31 | 50.13 | 0.25 |
| 18 | 4 | 12.20 | 9.19 | 6.27 | 61.82 | 10.25 | 0.25 |
| 19 | 4 | 18.31 | 11.82 | 20.64 | 44.36 | 4.58 | 0.30 |
| 20 | 2 | 37.88 | 37.67 | 16.91 | 3.52 | 3.69 | 0.34 |
| 21 | 3 | 5.68 | 12.16 | 64.79 | 6.27 | 10.97 | 0.13 |
| 22 | 2 | 11.23 | 46.48 | 8.98 | 22.03 | 10.89 | 0.38 |
| 23 | 2 | 19.36 | 38.01 | 12.84 | 15.04 | 14.28 | 0.47 |
| 24 | 4 | 30.08 | 20.55 | 12.20 | 16.27 | 20.42 | 0.47 |
| 25 | 3 | 7.88 | 19.32 | 36.10 | 26.19 | 10.25 | 0.25 |
| 26 | 1 | 20.08 | 15.04 | 37.12 | 16.86 | 10.59 | 0.30 |
| 27 | 5 | 17.80 | 11.02 | 13.56 | 11.57 | 45.81 | 0.25 |
| 28 | 2 | 18.22 | 36.61 | 13.05 | 20.85 | 10.85 | 0.42 |
| 29 | 3 | 31.02 | 10.13 | 24.15 | 8.90 | 25.47 | 0.34 |
| 30 | 4 | 24.79 | 20.81 | 13.73 | 30.76 | 9.49 | 0.42 |

** ප්‍රතිචාර නොදැක්වූ හෝ එක් වරණයකට වඩා ප්‍රතිචාර දක්වා ඇති අපේක්ෂකයන්ගේ ප්‍රතිශතය

**මූලාශ්‍රය :** පර්යේෂණ හා සංවර්ධන දත්ත, 2024, ශ්‍රී.ලං.වි.දෙ.

**වගුව 2.3**

1-B කොටසේ ප්‍රශ්න සඳහා අපේක්ෂකයන් ලකුණු ලබා ඇති ආකාරය


| ප්‍රශ්න අංකය | | ලකුණු ප්‍රමාණය | ලකුණු ලබා ඇති අපේක්ෂකයන් ප්‍රතිශතය | | | උත්සහ නොකළ ප්‍රතිශතය |
|---|---|---|---|---|---|---|
| | | | 0 | 1 | 2 | |
| 31 | | 2 | 32.84 | 13.18 | 50.64 | 3.35 |
| 32 | . | 1 | 74.19 | 18.77 | 0.00 | 7.03 |
| | . | 1 | 71.27 | 18.14 | 0.00 | 10.59 |
| 33 | . | 1 | 72.63 | 22.42 | 0.00 | 4.96 |
| | . | 1 | 38.90 | 56.69 | 0.00 | 4.41 |
| 34 | | 2 | 70.64 | 20.59 | 3.94 | 4.83 |
| 35 | | 2 | 18.22 | 4.28 | 75.42 | 2.08 |
| 36 | | 2 | 68.64 | 12.54 | 6.57 | 12.25 |
| 37 | | 2 | 59.19 | 18.81 | 11.95 | 10.04 |
| 38 | | 2 | 70.08 | 19.70 | 6.48 | 3.73 |
| 39 | | 2 | 55.93 | 23.09 | 14.11 | 6.86 |
| 40 | | 2 | 65.08 | 10.47 | 21.44 | 3.01 |
| 41 | | 2 | 37.75 | 25.00 | 32.20 | 5.04 |
| 42 | | 2 | 81.69 | 5.76 | 4.07 | 8.47 |
| 43 | . | 1 | 35.17 | 61.06 | 0.00 | 3.77 |
| | . | 1 | 59.28 | 34.87 | 0.00 | 5.85 |
| 44 | | 2 | 71.27 | 17.25 | 3.77 | 7.71 |
| 45 | | 2 | 59.32 | 23.01 | 10.30 | 7.37 |
| 46 | | 2 | 53.26 | 19.24 | 19.07 | 8.43 |
| 47 | . | 1 | 46.36 | 50.76 | 0.00 | 2.88 |
| | . | 1 | 67.12 | 30.38 | 0.00 | 2.50 |
| 48 | | 2 | 54.49 | 18.73 | 19.24 | 7.54 |
| 49 | | 2 | 32.75 | 21.53 | 38.77 | 6.95 |
| 50 | | 2 | 59.92 | 19.87 | 9.53 | 10.68 |

**මූලාශ්‍රය :** පර්යේෂණ හා සංවර්ධන දත්ත, 2024, ශ්‍රී.ලං.වි.දෙ.

## 2.5 I පත්‍රයේ ප්‍රශ්න සඳහා පහසුතා දර්ශක

**ප්‍රස්තාරය 2.1**

I පත්‍රයේ ප්‍රශ්න සඳහා පහසුතා දර්ශක




මූලාශ්‍රය : RD/16/5/AL පත්‍රිකාවෙන් ඇගයීම පර්යේෂණ හා සංවර්ධන දත්ත, 2024, ශ්‍රී.ලං.වි.දෙ.

## 2.6 I පත්‍රයේ විශ්ලේෂණය

I පත්‍රයේ විශ්ලේෂණය

දේශපාලන විද්‍යාව I පත්‍රය A හා B යනුවෙන් කොටස් දෙකකි. A කොටස සැලකීමේ දී බහුතර අපේක්ෂකයන් ප්‍රතිශතයන් වැරදි වරණයක් පිළිතුර ලෙස තෝරාගත් ප්‍රශ්න ලෙස ප්‍රශ්න අංක 6, 20, 24, 26 හා 29 යන ප්‍රශ්න නිරීක්ෂණය කළ හැකි ය. මෙම කොටසෙහි පහසුතාව 70%ක් හෝ ඊට වැඩි ප්‍රශ්න සංඛ්‍යාව 05කි. එම ප්‍රශ්න අංක 1, 2, 5, 7 හා 9 යන ප්‍රශ්න වේ.

B කොටසෙහි පහසුතාව 70%ක් හෝ ඊට වැඩි ප්‍රශ්න සංඛ්‍යාව එකකි. පහසුතාව 40%ට අඩු ප්‍රශ්න 14කි.

A කොටස

A කොටස දේශපාලන විද්‍යා විෂය නිර්දේශයේ නිපුණතා 14ක් ආවරණය වන පරිදි බහුවරණ ප්‍රශ්න 30කින් සමන්විත වේ. ප්‍රශ්නවල පහසුතාව 16% - 85% අතර පරාසයක ව්‍යාප්තව ඇත. පහසුතාව වැඩිම 7 ප්‍රශ්නය වන අතර එම ප්‍රශ්නයෙහි පහසුතාව 85%කි. අපේක්ෂකයන් සතු විෂය කරුණු පිළිබඳ දැනුම මෙන්ම ප්‍රායෝගික භාවිතය පිළිබඳ අද්දැකීම මෙම ඉහළ සාධනයට හේතු වී ඇත. පහසුතාව අඩුම 24 ප්‍රශ්නයෙහි පහසුතාව 16%කි.

B කොටස

B කොටස දේශපාලන විද්‍යා විෂය නිර්දේශයේ නිපුණතා 12ක් ආවරණය වන පරිදි කෙටි පිළිතුරු සැපයීමේ ප්‍රශ්න 20කින් සමන්විත වේ. ප්‍රශ්නවල පහසුතාව 7% -78% අතර පරාසයක ව්‍යාප්තව ඇත. පහසුතාව වැඩිම 35 ප්‍රශ්නය වන අතර එම ප්‍රශ්නයෙහි පහසුතාව 78%කි. පහසුතාව අඩුම 42 ප්‍රශ්නය වන අතර එහි පහසුතාව 7%කි.

**නිපුණතා අනුව විශ්ලේෂණය**


වගුව **2.4**

නිපුණතා අනුව I පත්‍රයට අදාළ ප්‍රශ්න අංක

| **නිපුණතාවය** | **A** කොටසට අදාළ ප්‍රශ්න අංක | **B** කොටසට අදාළ ප්‍රශ්න අංක |
|---|---|---|
| 01. දේශපාලනයේ සහ දේශපාලන විද්‍යාවේ ස්වභාවය හඳුනාගත් පුරවැසියකු ලෙස ක්‍රියා කරයි. | 2 | - |
| 02. දේශපාලන විද්‍යා විෂය සමන්විත වන ක්ෂේත්‍ර හඳුනාගනිමින් දේශපාලන විද්‍යාව අධ්‍යයනය කරයි. | 1, 4, 12 | 35 |
| 03. තමා ද පුරවැසියකු වන රාජ්‍ය පිළිබඳව න්‍යායික සහ ප්‍රායෝගික අවබෝධයකට පදනම සකසා ගනියි. | 3, 7, 20 | 31, 37 |
| 04. ලෝකයේ පවත්නා ආණ්ඩුක්‍රම ආකෘති ප්‍රභේද ආශ්‍රයෙන් ආණ්ඩුක්‍රම විග්‍රහ කිරීමට ඇත හැකියාව ප්‍රකාශ කරයි. | 5, 13 | 34, 39 |
| 05. දේශපාලන මතවාදවල ස්වභාවය සහ කාර්ය පිළිබඳ අවබෝධය ප්‍රදර්ශනය කරයි. | 6, 8, 9, 10 | 33, 38 |
| 06. ගැටුම්වල ස්වභාවය අවබෝධ කොටගෙන ගැටුම් නිරාකරණය සහ සාමය ගොඩනැගීම පිළිබඳ අවශ්‍යයතාව ප්‍රකාශ කරයි. | 18 | 32 |
| 07. ශ්‍රී ලංකාවේ යටත් විජිත පරිවර්තනයේ සමාජ, ආර්ථික සහ දේශපාලන පැතිකඩ හඳුනාගනියි. | 21, 22 | 43, 44, 45 |
| 08. නිදහසින් පසු ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංවර්ධනය පිළිබඳ අවබෝධ ප්‍රදර්ශනය කරයි. | 23, 24 | 46, 47 |
| 09. ප්‍රජාතන්ත්‍රවාදී ආණ්ඩුකරණය පිළිබඳ ඇති අවබෝධය ප්‍රදර්ශනය කරයි. | 11 | 40 |
| 10. සමකාලීන ලෝකයේ පවත්නා විවිධ ආණ්ඩුක්‍රම මාදිලි පිළිබඳ තුලනාත්මක අවබෝධයකින් යුතු පුද්ගලයෙකු ලෙස ක්‍රියා කරයි. | 14, 15, 28 | 36 |
| 11. රාජ්‍ය ප්‍රතිපත්ති දේශපාලන ක්‍රියාවලියේ ප්‍රතිඵලයක්ය යන අවබෝධය ප්‍රදර්ශනය කරයි. | 16 | - |
| 12. 1978 ව්‍යවස්ථාව යටතේ ඇති වූ ආණ්ඩුක්‍රමයේ ව්‍යුහාත්මක ලක්ෂණ, ආයතනික සංයුතිය සහ බල තුලනය හඳුනාගෙන පැහැදිලි කරයි. | 25, 26, 27, 29 | 48, 49, 50 |
| 13. ශ්‍රී ලංකාවේ දේශපාලන පක්ෂ ක්‍රමයේ ස්වභාවය සහ ප්‍රවණතා ඒවායේ ක්‍රියාකාරීත්වය ඔස්සේ ගෙන හැර දක්වයි. | 30 | - |
| 14. ජාත්‍යන්තර දේශපාලනයේ ස්වභාවය හා ප්‍රවණතා හඳුනාගෙන අදහස් දක්වයි. | - | 41 |
| 15. බාහිර ලෝකය සමඟ ශ්‍රී ලංකාව පවත්වන සම්බන්ධතාවල ස්වභාවය සහ ඵල විපාක පිළිබඳ අවබෝධයෙන් අදහස් දක්වයි. | 17, 19 | 42 |

**ප්‍රස්තාරය 2.2**


I පත්‍රයේ A කොටසෙහි විෂයයේ නිපුණතා අනුව ප්‍රශ්නවල පහසුතා දර්ශක




**මූලාශ්‍රය :** RD/16/5/AL පත්‍රිකාවෙන් රැස්කළ පර්යේෂණ හා සංවර්ධන දත්ත, 2024, ශ්‍රී. ලං. වි. දෙ.

**ප්‍රස්තාරය 2.3**

I පත්‍රයේ B කොටසෙහි විෂයයේ නිපුණතා අනුව ප්‍රශ්නවල පහසුතා දර්ශක




මූලාශ්‍රය : RD/16/5/AL පත්‍රිකාවෙන් රැස්කළ පර්යේෂණ හා සංවර්ධන දත්ත, 2024, ශ්‍රී. ලං. වි. දෙ.

## 2.7 I ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීම පිළිබඳ නිරීක්ෂණ, නිගමන හා යෝජනා

I පත්‍රයේ A කොටසෙහි බහුවරණ ප්‍රශ්න අතුරෙන් 6, 20, 24, 26 සහ 29 ප්‍රශ්න පහසුතාව 40%ට අඩු ප්‍රශ්න වේ.

6 ප්‍රශ්නයෙහි පහසුතාව 27.97%කි. මෙම ප්‍රශ්නය 12 ශ්‍රේණියේ 5 නිපුණතාවට අදාළව සකසා ඇත. අපේක්ෂකයන්ගෙන් 39.11%ක් වැරදි පිළිතුරක් වන (2) වරණය පිළිතුර ලෙස තෝරාගෙන ඇත. දේශපාලන විද්‍යාවේ ප්‍රධානතම දේශපාලන මතවාදයක් වන ලිබරල්වාදය ඉදිරිපත් කළ ප්‍රධාන චින්තකයින් පිළිබඳ නිරවුල් අවබෝධයක් අපේක්ෂකයන් සතු නොවීම වැරදි පිළිතුරක් කරා බහුතරයක් අපේක්ෂකයන් යොමු වීමට හේතුවක් වී ඇත. ලිබරල්වාදය මතවාදයක් ලෙස ඉදිරිපත් කළ චින්තකයින් සහ සමකාලීන ලිබරල් චින්තකයින් පිළිබඳ නිරවුල් අවබෝධයක් හා ප්‍රමාණාත්මක දැනුමක් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය තුළ ශිෂ්‍යයාට ලබාදීමට කටයුතු කළ යුතු ය.

20 ප්‍රශ්නය 12 ශ්‍රේණියේ 03 නිපුණතාවට අදාළව සකසා ඇත. මෙම ප්‍රශ්නයෙහි පහසුතාව 37.67%ක් වන නමුත් 37.88%ක ප්‍රතිශතයක් නිවැරදි පිළිතුර ලෙස (1) වරණය තෝරාගෙන ඇත. 1648 දී ඇති කරගන්නා ලද වෙස්ට්ෆේලියා (Westphalia) සාම ගිවිසුම මඟින් නූතන ජාතික රාජ්‍ය බිහිකර ගැනීමට අවශ්‍ය පදනම සකසා ඇත. නමුත් නූතන රාජ්‍ය බිහිවීම හා වෙස්ට්ෆේලියා සාම සම්මුතිය අතර ඇති සබඳතාවය පිළිබඳ බොහෝ අපේක්ෂකයන් සතුව නිරවුල් අවබෝධයක් නොමැති වීම පහසුතාව අඩුවීමට හේතු වී ඇත. එබැවින් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය තුළදී නූතන ජාතික රාජ්‍ය බිහිවීම සඳහා මෙම සම්මුතිය මඟින් සිදුකළ බලපෑම පිළිබඳව නිශ්චිත අවබෝධයක් සිසුන් වෙත ලබා දීමට කටයුතු කළ යුතු ය.

ප්‍රශ්න අංක 24හි පහසුතාව 16.27%ක් වන අතර, එය A කොටසෙහි පහසුතාව අඩුම ප්‍රශ්නයයි. මෙම ප්‍රශ්නය 12 ශ්‍රේණියේ 08 නිපුණතාවට අදාළව සකසා ඇත. අපේක්ෂකයන් අතුරෙන් 30.08%ක් නිවැරදි පිළිතුර ලෙස (1) වරණය තෝරා ගෙන ඇත. එමෙන්ම පිළිවෙළින් 20.42%ක් සහ 20.55%ක් (5) සහ (2) වරණද පිළිතුර ලෙස තෝරා ගෙන ඇත. මෙම ප්‍රශ්නයට පිළිතුරු සැපයීම සඳහා 1947 සෝල්බරි ආණ්ඩුක්‍රමයේ සහ 1972 ප්‍රථම ජනරජ ආණ්ඩුක්‍රමයේ ලක්ෂණ මෙන්ම එම ආණ්ඩුක්‍රම ක්‍රියාත්මක වූ කාලය තුළ ඇති වූ විශේෂිත වෙනස්කම් ආදිය පිළිබඳ ඉහළ මට්ටමක දැනුමක් අපේක්ෂකයන් සතු විය යුතු ය. සෝල්බරි ආණ්ඩුක්‍රමයට ගෙන ආ සංශෝධනයක් මඟින් ලංකාවේ අවසාන අභියාචනාධිකරණ බලය හිමි වූ ප්‍රිවි කවුන්සිලයට පැවති බලය අහෝසි කිරීම පිළිබඳව හා 1947 හා 1972 ආණ්ඩුක්‍රම යටතේ රාජ්‍ය සේවයේ (ස්ථිර විධායකය) ඇති වූ වෙනස්කම් පිළිබඳ අපේක්ෂකයන් සතුව තිබූ දැනුම ප්‍රමාණවත් නොවීම මෙහි අඩු සාධනයට හේතු වී ඇත. ලංකාවේ දේශපාලන ව්‍යූහය තුළ සිදු වූ නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා හඳුන්වාදීමේ දී එහි ව්‍යූහය හා ලක්ෂණ පමණක් නොව එම ආණ්ඩුක්‍රම ක්‍රියාත්මක වූ කාල පරාසය තුළ සිදු වූ සුවිශේෂී වෙනස්කම් පිළිබඳව ද සිසුන්ට අවධාරණය වන සේ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සංවර්ධනය කරගත යුතු ය.

26 ප්‍රශ්නය 13 ශ්‍රේණියේ 12 නිපුණතාවට අදාළව සකසා ඇත. නිවැරදි පිළිතුර වන (1) වරණය තෝරාගෙන ඇත්තේ අපේක්ෂකයන් අතුරෙන් 20.08%ක් වැනි සුළු පිරිසකි. නිවැරදි පිළිතුරක් නොවන (3) වරණය අපේක්ෂකයන්ගෙන් 37.12%ක් තෝරාගෙන ඇත. මෙම ප්‍රශ්නයෙහි පළමු ප්‍රකාශය බොහෝ අපේක්ෂකයන් පිරිසක් අසත්‍ය යැයි නිගමනය කිරීම එයට හේතුවක් විය හැකි ය. 1972 ප්‍රථම ජනරජ ආණ්ඩු ක්‍රමයට අනුව 1977 ජූලි මාසයේ දී පවත්වන ලද ජාතික රාජ්‍ය සභා මැතිවරණයේ දී එක්සත් ජාතික පක්ෂයට මන්ත්‍රී ධූර 168න් 140ක විශේෂිත බහුතර බලයක් හිමි වූ අතර, එම බලය පදනම් කරගෙන එම ආණ්ඩුක්‍රමයට ගෙන ආ සංශෝධනයක් මඟින් විධායක ජනාධිපති ධූරයක් ස්ථාපිත කරන ලදී. නමුත් මේ පිළිබඳ අපේක්ෂකයන් සතු දැනුම ප්‍රමාණවත් නොවීම නිසා පළමු ප්‍රකාශය අසත්‍ය යැයි නිගමනය කිරීමෙන් වැරදි වරණයක් වෙත බහුතරයක්

අපේක්ෂකයන් යොමු වීමට හේතු වී ඇත. ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී ආණ්ඩුක්‍රම සඳහා කාලීනව සිදුකරන ලද වෙනස් වීම් ද පදනම් කරගෙන නිවැරදි දැනුම සිසුන්ට ලබා දීමට කටයුතු කළ යුතු ය.

29 ප්‍රශ්නයෙහි පහසුතාව 24.15%ක් වන අතර 31.02%ක් පිළිතුර ලෙස (1) වරණය තෝරාගෙන ඇත. මෙම ප්‍රශ්නය 13 ශ්‍රේණියේ 12 නිපුණතාවට අදාළව සකසා ඇත. 1978 දෙවන ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ගෙන ආ සංශෝධන පිළිබඳ දැනුම ලබා දීමේ දී 13, 17, 18, 19 සහ සමකාලීන සංශෝධන වන 20 හා 21 පිළිබඳව පමණක් ප්‍රමුඛතාව ලබා දීමත්, අනෙකුත් සංශෝධන පිළිබඳ අපේක්ෂකයන් සතු දැනුම ප්‍රමාණවත් නොවීමත් වැරදි වරණයක් වෙත බහුතරයක් අපේක්ෂකයන් යොමු වීමට හේතු වී ඇත. එබැවින් 1978 දෙවන ජනරජ ආණ්ඩුක්‍රමය යටතේ ඇති කරන ලද විශේෂිත සංශෝධන පිළිබඳ මූලික දැනුම තහවුරු කරමින් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සංවර්ධනය කරගත යුතු ය.

I පත්‍රයේ B කොටසෙහි 20%ට වඩා අඩු පහසුතාව සහිත ප්‍රශ්න 07කි. එම ප්‍රශ්න වනුයේ අංක 32 (1) (2), 34, 36, 38, 42, 44 හා 50 වේ.

42 ප්‍රශ්නයෙහි පහසුතාව 7%කි. මෙම ප්‍රශ්නය 13 ශ්‍රේණියේ 15 නිපුණතාවට අදාළව එනම් 'ශ්‍රී ලංකාව සහ ලෝකය අතර පවතින සම්බන්ධතාව විදේශ ප්‍රතිපත්තිය මඟින් පැහැදිලි කරයි, ඇසුරෙන් යොමු කර ඇත. ඒ තුළ එක් එක් ආණ්ඩු බලයේ සිටි අවධියේ විදේශ ප්‍රතිපත්තියේ ස්වරූපය හා ඒ සඳහා යොමු වූ දිශානති මෙහිදී විග්‍රහ කරනු ලබයි. නමුත් නිදහසින් පසු ශ්‍රී ලංකාව පවත්වන ලද විදේශ සබඳතා, රටවල් හා දිශානති වශයෙන් වෙන්කර ගැනීමට අපේක්ෂකයන් සතු අවබෝධය පුළුල් නොවීම මෙහි පහසුතාව අඩු වීමට හේතුවක් වී ඇත. නිදහසින් පසු ආණ්ඩු වෙනස් වීම සමඟ ඒ ඒ ආණ්ඩු පවත්වන ලද විදේශ සබඳතාවල ස්වරූපය පිළිබඳ තුලනාත්මක අවබෝධයක් ලබා ගත හැකි පරිදි ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය හැඩ ගස්වා ගත යුතු ය.

44 ප්‍රශ්නය 12 ශ්‍රේණියේ 7 නිපුණතාවට අදාළව සකසා ඇත. මෙම ප්‍රශ්නයෙහි පහසුතාව 12%ක් වන අතර ලකුණු නොලැබූ අපේක්ෂකයන්ගේ ප්‍රතිශතය 71.27%කි. මෙම ප්‍රශ්නය සඳහා සම්පූර්ණ ලකුණු හිමිකරගත් අපේක්ෂකයන්ගේ ප්‍රතිශතය 3.77%කි. 1931 ඩොනමෝර් ආණ්ඩුක්‍රමය මගින් සුළුතර ප්‍රජාවගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීමට විධිවිධාන සලසා තිබුණ ද අපේක්ෂකයන් ඒ කෙරෙහි විශේෂ අවධානයක් යොමු නොකිරීම මෙම අඩු සාධනයට හේතුවක් වී ඇත. ඩොනමෝර් ආණ්ඩුක්‍රමය තුළ වාර්ගික නියෝජනය අහෝසි කළ ද සුළුතර ප්‍රජාවන්ගේ අයිතීන් ආරක්‍ෂා කිරීමට ආණ්ඩුකරණය තුළ ඍජුව මෙන්ම වක්‍රාකාරයෙන් ද උත්සාහ ගත් බව ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය තුළ සිසුන්ට අවධාරණය කිරීමට වගබලා ගත යුතු ය.

36 ප්‍රශ්නය 13 ශ්‍රේණියේ 10 නිපුණතාවට අදාළව සකසා ඇත. මෙම ප්‍රශ්නයෙහි පහසුතාව 13%කි. අපේක්ෂකයන්ගෙන් 68.64%ක ප්‍රතිශතයක් ලකුණු නොලබා ඇති අතර 12.25%ක් මෙම ප්‍රශ්නය සඳහා පිළිතුරු ලබා දී නොමැත. රටක ආණ්ඩුක්‍රම සම්පාදනය කිරීමේ දී විවිධ දේශපාලන න්‍යායන් යොදා ගනියි. එක්සත් රාජධානියේ ආණ්ඩුක්‍රමය ගොඩනැඟීමට අදාළ න්‍යායන් හා මූලධර්ම පිළිබඳ දැනුම බොහෝ අපේක්ෂකයන් සතු නොවීම මෙහි පහසුතාව අඩු වීමට හේතු වන්නට ඇත. විවිධ රටවල ආණ්ඩුක්‍රම පිළිබඳ ව දැනුම ලබා දීමේදී ඊට පසුබිම් වූ සාධක සහ මූලධර්ම පිළිබඳව තුලනාත්මක අවබෝධය ලබාදීම සඳහා ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කරගත යුතු ය.

34 ප්‍රශ්නය 12 ශ්‍රේණියේ 4 නිපුණතාවට අදාළව සකසා ඇත. මෙහි පහසුතාව 14%කි. මෙම ප්‍රශ්නය සඳහා 70.64%ක් ලකුණු නොලබා ඇති අතර සම්පූර්ණ ලකුණු හිමිකරගෙන ඇත්තේ අපේක්ෂකයන්ගෙන් 3.94%ක් පමණි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා වර්ගීකරණයට අදාළ මූලික දැනුම බොහෝ අපේක්ෂකයන් සතු නොවීම මෙහි පහසුතාව අඩු වීමට හේතු වූවා විය හැකි ය. ආණ්ඩුක්‍රම

ආකෘති පිළිබඳ දැනුම ලබාදීමේ දී ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා වර්ගීකරණය අවධාරණය කරමින් මූලික දැනුම ලබා දීම සඳහා ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සකස් කරගත යුතු ය.

'දේශපාලන මතවාදවල ස්වභාවය සහ කාර්ය පිළිබඳ අවබෝධය ප්‍රදර්ශනය කරයි' යන 12 ශ්‍රේණියේ පස්වන නිපුණතාවට අදාළව 38 ප්‍රශ්නය සකසා ඇත. එහි පහසුතාව 16%කි. 70.08%ක අපේක්ෂකයන් පිරිසක් ලකුණු නොලබා ඇත. දේශපාලන මතවාද අතරින් ස්ත්‍රීවාදය පිළිබඳ මූලික දැනුම පැවතිය ද එහි එක් එක් ධාරා පිළිබඳ වෙන් වෙන් වශයෙන් නිරවුල් අවබෝධයක් අපේක්ෂකයන් සතු නොවීම මෙහි පහසුතාව අඩු වීමට හේතු වී ඇති බවට උපකල්පනය කළ හැකි ය. පන්තිකාමරය තුළ ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කර ගැනීමේ දී ස්ත්‍රීවාදයේ එක් එක් ධාරාවන්හි සුවිශේෂී ලක්ෂණ පිළිබඳ අවධානය සංකල්ප සිතියම්, බුද්ධි මණ්ඩල සාකච්ඡා යනාදී ක්‍රමවේද මඟින් ලබා දීමට විශේෂ වැඩසටහන් ක්‍රියාත්මක කළ යුතු ය.

32 ප්‍රශ්නය 12 ශ්‍රේණියේ 'ගැටුම්වල ස්වභාවය අවබෝධ කොටගෙන ගැටුම් නිරාකරණය සහ සාමය ගොඩනැගීම පිළිබඳ අවශ්‍යතාව ප්‍රකාශ කරයි' යන 6 නිපුණතාවට අදාළව සකසා ඇත. මෙම ප්‍රශ්නය කොටස් දෙකකින් සමන්විත වේ. 32(1)කොටසෙහි පහසුතාව 19%කි. 32(2) කොටසෙහි පහසුතාව 18%කි. මෙම ප්‍රශ්නයෙහි පළමු කොටස සඳහා ලකුණු නොලැබූ අපේක්ෂක ප්‍රතිශතය 74.19%කි. දෙවන කොටස සඳහා 71.27%ක් ලකුණු නොලබා ඇති අතර එම කොටස සඳහා පිළිතුරු සපයා නොමැති අපේක්ෂකයන් ප්‍රතිශතය 10.59%කි. ගැටුම් හා ගැටුම් සමථනය පිළිබඳ න්‍යායාත්මක සංකල්පවල ශාස්ත්‍රීය පැතිකඩ පිළිබඳව අපේක්ෂකයන් සතුව පවතින අනවබෝධය, ගැටුම් හා ගැටුම් සමථනය පිළිබඳව සහ එක් එක් සංකල්ප ඉදිරිපත් කළ ශාස්ත්‍රඥයින්ගේ අදහස් නිශ්චිතව අපේක්ෂකයන් හඳුනා නොගැනීම මෙහි පහසුතාව අඩුවීමට හේතු වන්නට ඇත. මෙම නිපුණතාවට අදාළ තොරතුරු දැක්වීමේ දී මෙහි ප්‍රායෝගික මෙන්ම ශාස්ත්‍රීය පැතිකඩ කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරවිය යුතු ය.

'1978 ව්‍යවස්ථාව යටතේ ඇති වූ ආණ්ඩුක්‍රමයේ ව්‍යුහාත්මක ලක්ෂණ, ආයතනික සංයුතිය සහ බලතුලනය හඳුනාගෙන පැහැදිලි කරයි' යන 13 ශ්‍රේණියේ 12 නිපුණතාව ආශ්‍රිතව 50 ප්‍රශ්නය සකස් කර ඇත. එහි පහසුතාව 19%කි. මෙම ප්‍රශ්නය සඳහා ලකුණු නොලැබූ අපේක්ෂකයන්ගේ ප්‍රතිශතය 59.92%ක් වන අතර අපේක්ෂකයන් අතුරෙන් 10.68%ක් මෙම ප්‍රශ්නය සඳහා පිළිතුරු සපයා නොමැත. 1978 දෙවන ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ මැතිවරණ පැවැත්වීමට යොදාගන්නා නියෝජන ක්‍රම පිළිබඳ අවබෝධය ලබා දීමේදී බොහෝ අපේක්ෂකයන් සතු මූලික දැනුම ප්‍රමාණවත් නොවීම මෙම අඩු සාධනයට හේතු වන්නට ඇත. ශ්‍රී ලංකාවේ වර්තමාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ සමානුපාතික නියෝජන ක්‍රමය සාකච්ඡා කිරීමේදී ලෝකයේ රටවල ක්‍රියාත්මක වන නියෝජන ක්‍රම පිළිබඳ තුලනාත්මක අවබෝධයක් සිසුන් තුළ තහවුරු වන පරිදි ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සංවිධානය කරගත යුතු ය.

# III කොටස

## 3. ප්‍රශ්න හා පිළිතුරු සැපයීම පිළිබඳ විශ්ලේෂණය - II පත්‍රය

### 3.1 දේශපාලන විද්‍යාව II පත්‍රයේ ව්‍යුහය

කාලය පැය 03යි (ඊට අමතරව කියවීම් කාලය මිනිත්තු 10යි.)

මෙම ප්‍රශ්න පත්‍රය කොටස් තුනකින් සමන්විත වේ. මෙම කොටස්වලින් ප්‍රශ්න පහකට පිළිතුරු සැපයිය යුතු ය. එක් ප්‍රශ්නයකට ලකුණු 20 බැගින් ප්‍රශ්න පහකට ලකුණු 100කි.

I කොටස - රචනා හා අර්ධ ව්‍යුහගත වර්ගයේ ප්‍රශ්න තුනකින් සමන්විත වේ. අවම වශයෙන් එක් ප්‍රශ්නයකට පිළිතුරු සැපයිය යුතු ය.

II කොටස - රචනා සහ අර්ධ ව්‍යුහගත වර්ගයේ ප්‍රශ්න හතරකින් සමන්විත වේ. අවම වශයෙන් ප්‍රශ්න දෙකකට පිළිතුරු සැපයිය යුතු ය.

III කොටස - රචනා සහ අර්ධ ව්‍යුහගත වර්ගයේ ප්‍රශ්න තුනකින් සමන්විත වේ. අවම වශයෙන් ප්‍රශ්න එකකට පිළිතුරු සැපයිය යුතු ය.


II පත්‍රය සඳහා මුළු ලකුණු 100කි.

**මූලාශ්‍රය :** අ.පො.ස (උ.පෙළ) විභාගය වර්ෂ 2019 සහ ඉන් පසුව පැවැත්වෙන විභාග සඳහා ප්‍රශ්න පත්‍ර ව්‍යුහය හා මූලාකෘති ප්‍රශ්න, 2018, ශ්‍රී.ලං.වි.දෙ.

## 3.2 II පත්‍රයේ විශ්ලේෂණය

**ප්‍රස්තාරය 3.1**

II පත්‍රයේ  ප්‍රශ්න තෝරා ඇති ආකාරය




**මූලාශ්‍රය :** RD/16/3/AL, පත්‍රිකාවලින් රැස්කළ පර්යේෂණ හා සංවර්ධන දත්ත, 2024,  ශ්‍රී. ලං. වි. දෙ.

II පත්‍රය කොටස් තුනකින් සමන්විත වේ. I කොටසට අයත් ප්‍රශ්න තුනෙන් අවම වශයෙන් එක් ප්‍රශ්නයක් ද II කොටසට අයත් ප්‍රශ්නවලින් දෙකක් ද III කොටසින් අවම වශයෙන් එක් ප්‍රශ්නයක් ද වන සේ තෝරාගෙන ප්‍රශ්න පහකට පිළිතුරු සැපයිය යුතු වේ.


පළමු ප්‍රශ්නය දේශපාලන විද්‍යාවේ ස්වභාවය යන පළමු පාඩම් ඒකකයෙන් සකස් කර ඇත. එය පිළිතුරු සැපයීම සඳහා තෝරාගෙන ඇති අපේක්ෂක ප්‍රතිශතය 82%කි. 2 ප්‍රශ්නය පිළිතුරු සැපයීම සඳහා තෝරා ගෙන ඇති අපේක්ෂක ප්‍රතිශතය 57%ක් වැනි සාපේක්ෂ අඩු ප්‍රතිශතයකි.

7 ප්‍රශ්නය ශ්‍රී ලංකාවේ වර්තමාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ ජනාධිපතිවරයාට අදාළ තේමා දෙකක් පදනම් කරගෙන සකසා ඇත. මෙය පිළිතුරු සැපයීම සඳහා තෝරාගෙන ඇති අපේක්ෂක ප්‍රතිශතය 66%කි. 4 හා 5 ප්‍රශ්න පිළිතුරු සැපයීම සඳහා තෝරා ගෙන ඇති අපේක්ෂක ප්‍රතිශතය පිළිවෙළින් 64%ක හා 50%කි.

II පත්‍රයේ සියලුම ප්‍රශ්න අතුරෙන් පිළිතුරු සැපයීම සඳහා අඩුම ප්‍රතිශතයක් තෝරා ගෙන ඇත්තේ ඇත්තේ 9 ප්‍රශ්නයයි. එම ප්‍රතිශතය 10%කි.

**ප්‍රස්තාරය** 3.2

පන්ති ප්‍රාන්තර අනුව එක් එක් ප්‍රශ්නය සඳහා අපේක්ෂකයන්ගේ සාධනය




**මූලාශ්‍රය :** RD/16/3/AL පත්‍රිකාවෙන් රැස්කළ පර්යේෂණ හා සංවර්ධන දත්ත, 2024, ශ්‍රී. ලං. වි. දෙ.


ප්‍රස්තාරය 3.2 මගින් II පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා ලබා දෙන ලකුණු ප්‍රමාණය 100 ලෙස සලකා එය ලකුණු ප්‍රාන්තර 4කට බෙදා එම ලකුණු ප්‍රාන්තර අනුව අපේක්ෂකයන් ලකුණු ලබා ඇති ආකාරය නිරූපණය කර ඇත.

II පත්‍රය කොටස් තුනකින් යුක්ත වන අතර එක් එක් ප්‍රශ්නයක් සඳහා ලැබෙන ලකුණු සංඛ්‍යාව 20කි. එම ලකුණු 20 ලකුණු 100ට පරිවර්තනය කර 00-25, 26-50, 51-75, 76-100 ලෙස පන්ති ප්‍රාන්තර හතරකට බෙදා එක් එක් පන්ති ප්‍රාන්තරය තුළ ලකුණු ලබා ගත් අපේක්ෂකයන් ප්‍රතිශතයක් ලෙස දක්වා ඇත.

I කොටසේ ප්‍රශ්න 3 සඳහා වැඩිම අපේක්ෂක ප්‍රතිශතයක් ලකුණු ලබා ඇත්තේ 51-75% පන්ති ප්‍රාන්තරය තුළය. II කොටසේ 4, 5, 6, 7 ප්‍රශ්න අතුරෙන් 4, 6 ප්‍රශ්න සඳහා වැඩිම අපේක්ෂක ප්‍රතිශතයක් 51-75% පන්ති ප්‍රාන්තරය තුළද 5, 7 ප්‍රශ්න සඳහා වැඩිම අපේක්ෂක ප්‍රතිශතයක් 00-25% පන්ති ප්‍රාන්තරය තුළ ද ලකුණු ලබා ඇත. III කොටසේ 8, 9, 10 ප්‍රශ්න සඳහා වැඩිම අපේක්ෂක ප්‍රතිශතයක් ලකුණු ලබා ඇත්තේ 00-25% පන්ති ප්‍රාන්තරය තුළය.

**ප්‍රස්තාරය 3.3**

II පත්‍රයේ ප්‍රශ්න සඳහා පහසුතා දර්ශකය




**මූලාශ්‍රය :** RD/16/4/AL පත්‍රිකාවෙන් රැස්කළ පර්යේෂණ හා සංවර්ධන දත්ත, 2024, ශ්‍රී. ලං. වි. දෙ.

## 3.3 II පත්‍රයේ එක් එක් ප්‍රශ්න සඳහා සුවිශේෂී නිරීක්ෂණ හා නිර්දේශ

### 3.3.1 ප්‍රශ්න අංක 1 සහ අපේක්ෂිත පිළිතුර

#### I කොටස

**1. දේශපාලනය සහ දේශපාලන විද්‍යාව අතර වෙනස පැහැදිලි කරන්න. (ලකුණු 20)**

මෙම ප්‍රශ්නයේ අරමුණ වනුයේ දේශපාලනය සහ දේශපාලන විද්‍යාව අතර ඇති වෙනස අපේක්ෂකයා විසින් අවබෝධ කරගෙන ගෙන තිබෙන්නේ ද යන්න පරීක්ෂා කිරීම ය.

මෙහි දී අපේක්ෂකයා දේශපාලනය සහ දේශපාලන විද්‍යාව එකිනෙකින් වෙනස් වන්නේ කෙසේ ද යන්න කෙටියෙන් දක්විය යුතු ය. දේශපාලනය, දේශපාලනයේ ප්‍රායෝගික පැතිකඩ පිළිබඳව අවධාරණය කරන බවත් දේශපාලන විද්‍යාව එහි න්‍යායාත්මක පැතිකඩ ගැන සැළකිල්ල දක්වන බවත් මෙහි දී දක්විය හැකි ය.

දේශපාලනය සහ දේශපාලන විද්‍යාව අතර වෙනස පිළිබඳව දෙයාකාරයකින් බැලිය හැකි ය. ඒවා නම්,

- දේශපාලනය කිරීම හෙවත් ප්‍රායෝගික දේශපාලනය
- දේශපාලනය හැදෑරීම

දේශපාලනය කිරීම යනු ක්‍රියාකාරී ලෙසින් දේශපාලනයට සම්බන්ධ වීම ය. එය පහත සඳහන් ආකාරයේ ක්‍රියාකාරකම් සමග සම්බන්ධ වේ.

- දේශපාන බලය අත්කර ගැනීමට ක්‍රියා කිරීම
- ආණ්ඩුවේ කටයුතුවලට නිල මට්ටමින් සම්බන්ධ වීම
- මැතිවරණ සහ මැතිවරණ ව්‍යාපාරයට සම්බන්ධ වීම
- දේශපාලන පක්ෂ ක්‍රියාකාරකම් වලට සම්බන්ධ වීම
- විරෝධතා ව්‍යාපාර වලට සම්බන්ධ වීම යනාදියයි.

පළමුව, දිගු කාලයක සිට දේශපාලනය ආණ්ඩුවේ විධිමත් ආයතන සහ ඒවායේ ක්‍රියාකාරිත්වයට සම්බන්ධ වෙයි.

දෙවනුව, දේශපාලනය පුද්ගලික යැයි සිතන දේට වෙනස් ව පොදු ක්ෂේත්‍රයට සහ පොදු ක්‍රියාකාරකම් වලට සම්බන්ධ වෙයි. දේශපාලනය සෑම තැන්හි පවතින අතර සෑම දෙයක්ම දේශපාලනය වෙයි. දේශපාලනය අපගේ සමාජීය, සංස්කෘතික සහ ආර්ථික ක්ෂේත්‍රවල සෑම පැතිකඩක් කෙරෙහි ම සම්බන්ධ වෙයි.

තෙවනුව, දේශපලනය බලය, ධනය සහ සම්පත් බෙදා හැරීමට සම්බන්ධව පවතින දෙයක් ලෙස ද දක්වයි.

සිව්වනුව, දේශපාලනය බලය අභ්‍යාස කිරීමක් ලෙසින් ද සාමූහික තීන්දු ගැනීමේ ක්‍රියාවලියක් ලෙසින් ද හුවා දක්වයි.

රාජ්‍යයේ/ආණ්ඩුවේ කටයුතු වලට ක්‍රියාකාරී ලෙසින් සම්බන්ධ වන අය හඳුනාගනු ලබන්නේ දේශපාලනඥයන් ලෙසිනි. ඔවුහු දේශපාලන පක්ෂ පිහිටුවා ගනිති, මැතිවරණ වලට තරග කරති, ආණ්ඩුව මෙහෙයවති. එය හඳුනා ගනු ලබන්නේ ප්‍රායෝගික දේශපාලනය ලෙස ය.

ක්‍රියාකාරී දේශපාලනයට සම්බන්ධවන පුරවැසියන් සහ දේශපාලනඥයන් යන දෙපිරිසට ම ශාස්ත්‍රීය දැනුමක් අවශ්‍ය නොවේ. ඒවාට අවශ්‍ය වන්නේ ආශාව, කැපවීම සහ අධිෂ්ඨානයයි. මෙලෙස, දේශපාලනය කිරීම එසේත් නැතිනම් දේශපාලනයේ ප්‍රායෝගික පැතිකඩ දේශපාලන විද්‍යාවේ අධ්‍යයන අරමුණකි.

අපේක්ෂකයා මේ ආකාරයෙන් ද පිළිතුරු දිය හැකි ය. එනම්,

- රාජ්‍යය පිළිබඳ ව සැළිකිලිමත් වීම දේශපාලනය ලෙසින්
- දේශපාලනය ගැටුම් නිරාකරණය කිරීමේ ක්‍රමවේදයක් ලෙසින්
- ගැටුම දේශපාලනය ලෙසින්
- බලය අභ්‍යාස කිරීම දේශපාලනය ලෙසින්
- සමාජීය සහ මානව ක්‍රියාකාරකමක් දේශපාලනය ලෙසින්
- පොදු ක්‍රියාකාරකමක් දේශපාලනය ලෙසින්

එසේ වුව ද දේශපාලන විද්‍යාව දේශපාලනය පිළිබඳව ක්‍රමානුකූලව අධ්‍යයනයට යොමු කරවයි. මෙයින් රාජ්‍යය සහ ආණ්ඩුව පිළිබඳ න්‍යාය, කෘත්‍රිම පුද්ගලයෙකු ලෙසින් නීති සම්පාදනය පිළිබඳ න්‍යාය සහ රාජ්‍ය පිළිබඳ න්‍යාය ආවරණය කරයි. පළමු අංගයට රාජ්‍යයේ ලක්ෂණ සහ ආණ්ඩුවේ මූලික මූලධර්ම සම්බන්ධ වේ.

දේශපාලනය අවබෝධ කරගැනීම අපගේ සාමාන්‍ය බුද්ධි අවබෝධය මත සිදුවන්නක් නොවේ. එය විශේෂිත වර්ගයේ දැනුමකට අනුව සිදු වේ. එය සිදු වන්නේ දේශපාලන විද්‍යාඥයන් විසින් සිදු කරනු ලබන පර්යේෂණ තුලිනි. දේශපාලනය පිළිබඳ ව ඉගැන්වීම සහ ලිවීම එවැනි වෘත්තීමය වශයෙන් නිපදවන ලද දැනුම බෙදා හැරීමේ ක්‍රමයකි.

දේශපාලන විද්‍යාව යනු දේශපාලනය විද්‍යාත්මක ලෙසින් හැදෑරීමයි. ඒ අනුව පාලන ක්‍රම සහ බලය සමග, දේශපාලන ක්‍රියාකාරකම් විශ්ලේෂණය කිරීම සමග දේශපාලන චින්තනය සමග, දේශපාලන චර්යාව සමග, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සහ නීති සමග සම්බන්ධ වේ. මේ අනුව මෙය දේශපාලනය කිරීමෙන් වෙනස් වේ.

දේශපාලනය ප්‍රායෝගික ක්‍රියාකාරකමක් නම් දේශපාලන විද්‍යාව යනු න්‍යායාත්මක එසේත් නැතිනම් ශාස්ත්‍රීය කටයුත්තකි. දේශපාලනයට ප්‍රායෝගික ලෙසින් සම්බන්ධ වීම සහ දේශපාලනය ශාස්ත්‍රීය ලෙසින් හැදෑරීම එකිනෙකට වෙනස් භාවිතයන් දෙකකි. දේශපාලන විද්‍යාව අධ්‍යයනය කිරීම යනු න්‍යායන්, සංකල්ප සහ ක්‍රමවේද ඇසුරු කරගනිමින් ශාස්ත්‍රීය ලෙසින් එය හැදෑරීම ය.


දේශපාලනය අධ්‍යයනය කිරීම සඳහා ප්‍රායෝගික ලෙසින් දේශපාලනයට සම්බන්ධ වීම අත්‍යවශ්‍ය සාධකයක් වන්නේ නැත. දේශපාලන අධ්‍යයනයට පුළුල් පරාසයක තේමාවන් අයත් වේ. උදාහරණ ලෙසින් ආණ්ඩුක්‍රම, මැතිවරණ, දේශපාලන පක්ෂ, ප්‍රචණ්ඩත්වය යනාදිය දැක්විය හැකි ය.

මෙහි දී අපේක්ෂකයා නිගමනය ලෙසින් දේශපාලනය සහ දේශපාලන විද්‍යාව අතර ඇති මූලික වෙනස කෙටියෙන් දක්වන්නේ නම් එය අංග සම්පූර්ණ පිළිතුරක් වනු ඇත.

### 3.3.2 ප්‍රශ්න අංක 1 සඳහා විශ්ලේෂණය

**ප්‍රස්තාරය 3.4**

ප්‍රශ්න අංක 1 සඳහා අපේක්ෂකයන් ලබාගත් ලකුණුවල ව්‍යාප්තිය




මෙම ප්‍රශ්නය සඳහා හිමි ලකුණු ප්‍රමාණය 20කි.

ඉන්;

ලකුණු 00 – 05 ප්‍රාන්තරයේ 24.58%ක් ද,

ලකුණු 06 – 10 ප්‍රාන්තරයේ 26.5%ක් ද,

ලකුණු 11 – 15 ප්‍රාන්තරයේ 32.74%ක් ද,


ලකුණු 16 – 20 ප්‍රාන්තරයේ 16.18%ක් ද,

වශයෙන් අපේක්ෂකයන් ලකුණු ලබා ගෙන ඇත. අපේක්ෂකයන් අතුරෙන් 24.58%ක් ලකුණු 5ක් හෝ ඊට අඩුවෙන් ලබා ඇත.

**මූලාශ්‍රය :** RD/16/3/AL පත්‍රිකාවෙන් රැස්කළ පර්යේෂණ හා සංවර්ධන දත්ත, 2024, ශ්‍රී. ලං. වි. දෙ.

**ප්‍රස්තාරය 3.5**

ප්‍රශ්න අංක 1 සඳහා පහසුතා දර්ශක




**මූලාශ්‍රය :** RD/16/4/AL පත්‍රිකාවෙන් රැස්කළ පර්යේෂණ හා සංවර්ධන දත්ත, 2024, ශ්‍රී. ලං. වි. දෙ.

මෙම ප්‍රශ්නය 12 ශ්‍රේණියේ 'දේශපාලනය සහ දේශපාලන විද්‍යාවේ ස්වභාවය හඳුනාගත් පුරවැසියෙකු ලෙස ක්‍රියා කරයි' යන පළමු නිපුණතාවට අදාළව ඉදිරිපත් කර ඇත. මෙම ප්‍රශ්නයෙන් දේශපාලනය හා දේශපාලන විද්‍යාව අතර ඇති වෙනස හඳුනා ගැනීම අපේක්ෂා කර ඇත. මෙම ප්‍රශ්නය පිළිතුරු සැපයීම සඳහා තෝරා ගෙන ඇති අපේක්ෂකයන් ප්‍රතිශතය 82%කි. ප්‍රශ්නයෙහි පහසුතාව 53%කි. න්‍යායාත්මක දේශපාලනය හා ප්‍රායෝගික දේශපාලනය පිළිබඳ බහුතරයක් අපේක්ෂකයන් සත තිබුව නිවැරදි අවබෝධය මෙම සාධනයට හේතු විය හැකි ය. එහිදී දේශපාලනය හා දේශපාලන විද්‍යාව පිළිබඳ වෙන් වෙන් මාතෘකා ඇසුරෙන් ඉගෙනුම් ක්‍රියාවලිය සිදුකරන නිසා බොහෝ අපේක්ෂකයන් තුළ මේ පිළිබඳ දැනුම හොඳින් තහවුරු වී ඇත.

න්‍යායාත්මක දැනුම සිසුන් තුළ තහවුරු වන ආකාරයට ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සිදු කිරීම, අමතර පොත් පත් පරිශීලනයට සිසුන් යොමු කිරීම, ප්‍රායෝගික දේශපාලන ක්‍රියාකාරකම් පිළිබඳ විමසිලිමත් වීම හා එදිනෙදා දෙස් විදෙස් දේශපාලන පුවත් එකිනෙකා අතර හුවමාරු කර ගැනීමට අවස්ථාව ලබාදීම මඟින් ශිෂ්‍ය සාධනය සංවර්ධනය කරගත හැකි ය.

## 3.3.3 ප්‍රශ්න අංක 2 සහ අපේක්ෂිත පිළිතුර

**2. පහත සඳහන් ඕනෑම මාතෘකා දෙකක් විස්තර කරන්න.**

**(i) රාජ්‍යය සහ පුරවැසියන් අතර සම්බන්ධතාව**

**(ii) රාජ්‍යය සහ ආණ්ඩුව අතර වෙනස්කම්**

**(iii) ජාතික රාජ්‍යය කෙරෙහි ගෝලීයකරණයේ බලපෑම** (ලකුණු 10 x 2 = 20)

**(i) රාජ්‍යය සහ පුරවැසියන් අතර සම්බන්ධතාව**

නූතන දේශපාලනය තුල රාජ්‍යය සහ පුරවැසියන් අතර සම්බන්ධතාවයට ප්‍රධාන පැතිකඩ දෙකක් තිබේ.

- පුරවැසියන් භුක්ති විඳින දේශපාලන අයිතිවාසිකම් සහ
- පුරවැසියන්ගේ දේශපාලන බැඳීම්

රාජ්‍යයට ඇති අවනතභාවය සහ පක්ෂපාතිත්වය පුරවැසියන්ගේ මූලික බැඳීම් ය. එය පැමිණෙන්නේ රාජ්‍යයේ සාමාජිකයන් ලෙසින් පුරවැසියන් භුක්ති විඳින අයිතිවාසිකම් වලට හුවමාරුවක් ලෙසිනි.

ඇරිස්ටෝටල්ට අනුව පුරවැසියන් රාජ්‍යයට අවනත වන්නේ පුරවැසියන්ට ඉහළම මට්ටමෙන් සුභසාධනය සළසන සමාජයේ ඉහළම සංගමය රාජ්‍යය වන බැවිනි.

සමාජ සම්මුති න්‍යායෙන් රාජ්‍ය-පුරවැසි සම්බන්ධතාව අර්ථ දක්වනු ලැබේ. එබැවින් රාජ්‍යයට සහ පුරවැසියන්ට අන්‍යෝන්‍ය බැඳීම් පවතී.

රාජ්‍යය විසින් පුරවැසියන්ට ආරක්ෂාව සහ සුරක්ෂිතතාවය සළසන අතර ඒ වෙනුවෙන් පුරවැසියෝ රාජ්‍යයට අවනතභාවය දක්වති.

ලිබරල් දේශපාලන න්‍යායට අනුව පුරවැසියන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කරන්නේ රාජ්‍යයයි. රාජ්‍යය කෙරෙහි පුරවැසියන්ගේ දේශපාලන බැඳීමේ පදනම වන්නේ මෙයයි.

රූසෝගේ සමූහාණ්ඩු න්‍යායෙන් ප්‍රකාශ කරන්නේ සමාජයේ පොදු කැමැත්ත රාජ්‍යයෙන් නියෝජනය කරන බවයි. එබැවින් සියළු පුරවැසියන් රාජ්‍යයට අවනතභාවය දැක්වීමට බැඳී සිටිති.

අවංකභාවය සමග පුරවැසියන් ඔවුන්ගේ ඡන්ද ප්‍රකාශ කිරීම මගින් ඔවුන් රාජ්‍යයේ පාලන කටයුතු වලට සම්බන්ධ වේ. ඡන්ද ප්‍රකාශ කිරීම ඔස්සේ සුදුසු අපේක්ෂකයන් තේරීපත් වීමක් සිදු නොවන්නේ නම් ආණ්ඩුව දුර්වල වනු ඇත.

පුරවැසියන් රාජ්‍යයට බදු ගෙවති. මේ අතර රාජ්‍යයේ එදිනෙදා පරිපාලන කටයුතු, ආරක්ෂාව සහ සංවර්ධන කටයුතු සඳහා මුදල් අවශ්‍ය වේ. කළට වේලාවට බදු මුදල් නොලැබෙන්නේ නම් රාජ්‍යයේ කටයුතු සිදුකර ගෙන යා නොහැකි ය.

**(ii) රාජ්‍යය සහ ආණ්ඩුව අතර වෙනස්කම්**

රාජ්‍යය සහ ආණ්ඩුව යන පද එදිනෙදා ව්‍යවහාරයේ දී මාරුවෙන් මාරුවට යොදා ගත්ත ද ඒවා හාත්පසින්ම වෙනස් අංග දෙකක් දක්වීම සඳහා භාවිතා කෙරේ. රාජ්‍යය සහ ආණ්ඩුව ඇති ප්‍රධාන වෙනස්කම් වලින් කිහිපයක් පහත දක්වේ.

- පොදු ක්ෂේත්‍රයට අයත් සියළුම ආයතන අන්තර් කරගත් සංගමයක් ලෙස රාජ්‍යය හැඳින්විය හැකි ය. ආණ්ඩුවට අයත් විවිධාකාර ආයතන මෙන්ම නිලබලතන්ත්‍රය, හමුදාව, පොලිසිය, අධිකරණ පද්ධතිය සමාජ ආයතන යනාදියෙන් රාජ්‍යය සමන්විත ය. ඒ අනුව රාජ්‍යය, ආණ්ඩුවට වඩා පැතිරුණු එකකි.
- රාජ්‍යය ස්ථාවර දෙයකි. ආණ්ඩුව යනු තාවකාලික එකකි. රාජ්‍යයකින් තොරව ආණ්ඩුවකට පැවතිය හැකි ය. එසේ වුව ද ආණ්ඩුවක් නොමැතිව රාජ්‍යයකට පැවැතිය නොහැකි ය. ආණ්ඩුව විසින් රාජ්‍යයේ පැවැත්ම ආරක්ෂා කෙරෙයි.
- රාජ්‍යය නිශ්චිත දේශ සීමාවක් තුල සිය පරමාධිපත්‍යය බලය පිහිටුවා ඇත. රාජ්‍යයේ තත්වය විදහා දක්වන ලක්ෂණය වන්නේ රාජ්‍යයට අයත් ස්වාධිපති බලයයි. රාජ්‍යයට අයත් දේශ සීමාව තුල ජීවත්වන සියළු පුද්ගලයන් නීතියට අවනත කර ගැනීමේ  හැකියාව රාජ්‍යයට තිබේ.
- රාජ්‍යයේ අධිකාරී බලය ක්‍රියාවට නංවන උපකරණය වන්නේ ආණ්ඩුවයි. රාජ්‍යය ප්‍රතිපත්ති සම්පාදනය කිරීමේ දී සහ ඒවා ක්‍රියාවට නැංවීමේ දී ආණ්ඩුව ක්‍රියාත්මක වන්නේ රාජ්‍යයේ මොළයට සමාන ආකාරයට ය (Government is the brain of the State). ආණ්ඩුව සැළකෙන්නේ රාජ්‍යයේ සෙසු ආයතන වන පොලිසීය, හමුදාව, පරිපාලන ආයතන වැනි ආයතන හසුරුවන සහ ඒවාට නියෝග දෙන ආයතනයක් ලෙස ය.
- රාජ්‍යය යනු පොදු අභිලාෂ වෙනුවෙන් ක්‍රියා කරන ආයතනයකි. ආණ්ඩුව යනු විශේෂිත කාලයකට ආණ්ඩුව දරන පුද්ගලයන්ගේ පාර්ශ්වීය අභිප්‍රාය නියෝජනය කරන ආයතනයකි.
- රාජයයක සාමාජිකයෙකු වන සෑම පුරවැසියෙකු ම රාජ්‍යයට අවනතභාවයත් පක්ෂපාතීභාවයත් දක්වීම අවශ්‍ය ය. මෙය ආණ්ඩුව සම්බන්ධයෙන් අදාළ වන්නේ නැත.

**(iii) ජාතික රාජ්‍යය කෙරෙහි ගෝලීයකරණයේ බලපෑම**

ගෝලීයකරණය පිළිබඳ ව ඇති විවාද අතුරින් බොහෝ විවාද වලට විෂය වන්නේ ජාතික රාජ්‍ය කෙරෙහි ගෝලීයකරණයේ ඇති බලපෑම පිළිබඳව ය.

ගෝලීයකරණයේ වර්ධනය මගින් ජාතික රාජ්‍යයේ බලය සහ රාජ්‍යයේ වැදගත්කම කෙරෙහි සිදු කර ඇති බලපෑම පිළිබඳ ප්‍රධාන පෙළේ විවාදයක් ගෝලීයකරණය වූ ලෝකය තුල සිදුව තිබේ.

මෙම විවාදයේ එක ස්ථාවරයකින් ප්‍රකාශ වන්නේ ගෝලීයකරණය හේතුවෙන් රාජ්‍යවල බලය සහ බලපෑම එයට අහිමි වී ඇති බවයි. එනම් ජාතික රාජ්‍යයේ පසු බැසීමක් සිදුව ඇති බවයි. අර්ථාන්විත ක්‍රියාධරයෙකු ලෙසින් සිටි රාජ්‍යය ගෝලීකරණයේ පැන නැගීම හේතුවෙන් නොවැළැක්විය හැකි ලෙසින් පරිහානියට පත් ව තිබෙන බව ප්‍රකාශ වේ. මේ අනුව බලය, රාජ්‍යයෙන් වෙළඳපලට සහ පාර ජාතික සමාගම්වලට මාරු වී තිබේ.

දෙවන ස්ථාවරයට අනුව, රාජ්‍යයට අයත් දේශ සීමාව තුල සිටින ක්‍රියාධරයා වශයෙනුත් ලෝක රගමඩල මත සිටින ප්‍රධාන ක්‍රියාධරයා වශයෙනුත් තව දුරටත් ප්‍රධාන ක්‍රියාධරයා වන්නේ රාජ්‍යයයි. මේ මතයට අනුව ගෝලීයකරණය හමුවේ රාජ්‍යය වෙනස් නොවී පවතින බවත් රාජ්‍යය වලට ඒවායේ නියාමන සහ මෙහෙයවීම් පුළුල්කර ගැනීමට පවා හැකියාව තිබේ.

තෙවන ස්ථාවරය යටතේ ඉහතින් සඳහන් කළ මත දෙක අතරට වැටෙන් තව මතයක් ද තිබේ. මෙයින් අවධාරණය කරන්නේ ගෝලීයකරණය මගින් රාජ්‍යයේ බලය සහ තත්වය අඩු කිරීම හෝ වැඩි කිරීමකට වඩා රාජ්‍යය පරිවර්තනයකට ලක් කර තිබෙන බවයි. මේ අනුව ඇතැම් අංශවලින් ජාතික රාජ්‍යය වඩාත් ශක්තිමත් තත්වයට පත්ව තිබෙන අතර ඇතැම් අංශ වලින් වඩාත් දුර්වල තත්වයට පත්ව ඇති බවයි. මෙයාකාරයට රාජ්‍යයේ පරිවර්තනීය ක්‍රියාවලියක් සිදුවෙමින් පවතින අතර එසේ වන්නේ රාජ්‍යයෙන් රාජ්‍යයෙන් රාජ්‍යයට වෙනස් ආකාරයට බව ප්‍රකාශ වේ.


සාර්ථක පිළිතුරක දී ඉහත සඳහන් සෑම පැතිකඩක් ම උදාහරණ සහිතව පැහැදිලි කරනු ලැබේ.

### 3.3.4 ප්‍රශ්න අංක 2 සඳහා විශ්ලේෂණය

**ප්‍රස්තාරය 3.6**

ප්‍රශ්න අංක 2 සඳහා අපේක්ෂකයන් ලබාගත් ලකුණුවල ව්‍යාප්තිය

මෙම ප්‍රශ්නය සඳහා හිමි ලකුණු සංඛ්‍යාව 20කි.




ඉන්;

ලකුණු 00– 05 ප්‍රාන්තරයේ 28.39%ක් ද,

ලකුණු 06– 10 ප්‍රාන්තරයේ 27.8%ක් ද,

ලකුණු 11 – 15 ප්‍රාන්තරයේ 30.61%ක් ද,

ලකුණු 16 – 20 ප්‍රාන්තරයේ 13.2%ක් ද,


වශයෙන් අපේක්ෂකයන් ලකුණු ලබා ගෙන ඇත.

අපේක්ෂකයන් අතුරෙන් 28.39%ක් ලකුණු 5ක් හෝ ඊට අඩුවෙන් ලබා ඇත. ලකුණු 16ක් හෝ ඊට වැඩියෙන් ලබාගත් අපේක්ෂකයන් ප්‍රතිශතය 13.2%කි

**මූලාශ්‍රය :** RD/16/3/AL පත්‍රිකාවෙන් රැස්කළ පර්යේෂණ හා සංවර්ධන දත්ත, 2024, ශ්‍රී. ලං. වි. දෙ.

**ප්‍රස්තාරය 3.7**

ප්‍රශ්න අංක 2 සඳහා පහසුතා දර්ශක




**මූලාශ්‍රය :** RD/16/4/AL පත්‍රිකාවෙන් රැස්කළ පර්යේෂණ හා සංවර්ධන දත්ත, 2024, ශ්‍රී. ලං. වි. දෙ.

දෙවන ප්‍රශ්නය 12 ශ්‍රේණියේ 'තමා ද පුරවැසියකු වන රාජ්‍යය පිළිබඳව න්‍යායික සහ ප්‍රායෝගික අවබෝධයකට පදනම සකසා ගනියි' යන 03 නිපුණතාවෙන් ඉදිරිපත් කර ඇත. ලබා දී ඇති මාතෘකා තුනෙන් මාතෘකා දෙකක් විස්තර කිරීම මෙහිදී අපේක්ෂා කර ඇත.

මෙම ප්‍රශ්නය පිළිතුරු සැපයීම සඳහා තෝරා ගත් අපේක්ෂකයන් ප්‍රතිශතය 57%කි. එම අපේක්ෂකයන් අතුරෙන් බහුතර අපේක්ෂක සංඛ්‍යාවක් රාජ්‍යය සහ පුරවැසියන් අතර සම්බන්ධතාව හා රාජ්‍යය හා ආණ්ඩුව අතර වෙනස්කම් යන (i) හා (ii) මාතෘකා දෙක තෝරා ගෙන ඇති අතර (iii) කොටස එනම් ජාතික රාජ්‍යය කෙරෙහි ගෝලීයකරණයේ බලපෑම යන මාතෘකාව 17%ක් වූ අඩු අපේක්ෂක සංඛ්‍යාවක් පිළිතුරු සැපයීමට තෝරා ගෙන ඇත. නමුත් මෙම කොටස් තුනෙන් පහසුතාව වැඩිම කොටස (iii) වන අතර, එහි පහසුතාව 60%කි. ගෝලීයකරණය නිසා ජාතික රාජ්‍යය බිඳ වැටීම සහ ගෝලීයකරණය අනුව ජාතික රාජ්‍යය ප්‍රතිව්‍යුහගත වීම යන න්‍යායික ප්‍රවේශ දෙක පමණක් විග්‍රහ කිරීම (iii) කොටසින් අපේක්ෂා කර තිබීම මෙම සාපේක්ෂ ඉහළ පහසුතාවට හේතු වී ඇත. එහෙත් (i) හා (ii) යන කොටස් දෙකෙන්ම වඩාත් පුළුල් න්‍යායික කරුණු විග්‍රහ කිරීම අපේක්ෂා කර ඇති අතර අපේක්ෂකයන් සතු දැනුම සාරාංශ කර අත්‍යාවශ්‍ය කරුණු විස්තර කිරීමට අපොහොසත් වීම මෙම කොටස් දෙක සඳහා සාපේක්ෂ අඩු සාධනයට හේතු වී තිබිය හැකි ය.

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය තුළ දී ඉහත මාතෘකා පිළිබඳ පුළුල් න්‍යායික දැනුමක් ලබාදීම සඳහා පොත්පත් පරිශීලනයට අවස්ථාව ලබාදීම හා මඟ පෙන්වීම සහ අන්තර්ජාතික රාජ්‍ය පද්ධතිය තුළ සිදුවන වෙනස්කම් පිළිබඳ සිසුන් දැනුවත් කිරීම සඳහා සම්මන්ත්‍රණ, සාකච්ඡා පැවැත්වීම සහ අන්තර්ජාලය භාවිත කිරීම මඟින් තොරතුරු ඒකරාශී කිරීමට සිසුන් පෙලඹවීම මඟින් ශිෂ්‍ය සාධනය සංවර්ධනය කර ගත හැකි ය.

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය තුළ දී ඉහත මාතෘකා පිළිබඳ සිසු අවබෝධය පුළුල් කිරීම සඳහා විෂය පිළිබඳ ලියවී ඇති පොත්පත් පරිශීලකයාට අවස්ථාව ලබාදීම හා මඟ පෙන්වීමත්, අන්තර්ජාලය පරිශීලනයට අවස්ථාව ලබාදීමත් මඟින් ශිෂ්‍ය සාධනය සංවර්ධනය කරගත හැකි ය.

### 3.3.5 ප්‍රශ්න අංක 3 සහ අපේක්ෂිත පිළිතුර

**3. පහත සඳහන් දේශපාලන මතවාදවලින් ඕනෑම <u>දෙකක</u> ප්‍රධාන ලක්ෂණ කෙටියෙන් සාකච්ඡා කරන්න.**

**(i) ලිබරල්වාදය**

**(ii) සමාජවාදය**

**(iii) ෆැසිස්ට්වාදය** **(ලකුණු 10 x 2 = 20)**

**(i) ලිබරල්වාදය**

ලිබරල්වාදය පුද්ගල නිදහස වෙනුවෙන් පෙනී සිටී. එනම් ආණ්ඩුව විසින් සිදු කෙරෙන අත්තෝමතික මැදිහත් වීමෙන් පුද්ගලයා නිදහස් කර ගැනීම වෙනුවෙන් පෙනී සිටී. ඒ අනුව පුද්ගල නිදහස සළකනු ලබන්නේ ලිබරල්වාදයේ ප්‍රමුඛ තේමාව ලෙසිනි. ආණ්ඩුවේ අයුතු මැදිහත් වීමෙන් තොරව පුද්ගලයන්ට ඔවුන්ගේ ජීවිත සංවිධානය කරගැනීමටත් තම ජීවිතය බුක්ති විඳීමටත් පුද්ගලයන්ට නිදහස තිබිය යුතු ය. රාජ්‍යයේ සහ පාලකයන්ගේ හිතුවක්කාරී පාලනයෙන් පුරවැසියන් සහ ඔවුන්ගේ නිදහස ආරක්ෂා කිරීමට යාන්ත්‍රණ තිබිය යුතු බව ලිබරල් දේශපාලන චින්තකයන් අවධාරණය කරයි. නීතියේ ආධිපත්‍යය, මූලික අයිතිවාසිකම් පනත, ව්‍යවස්ථානුලවාදය, බලතල බෙදීම සහ සංවරණ සහ තුලන ක්‍රම යනාදිය එම යාන්ත්‍රණයන් ය.

අපේක්ෂකයා ලිබරල්වාදයේ පහතින් දැක්වෙන ප්‍රධාන ලක්ෂණ කෙරෙහි ද අවධානය දැක්විය හැකි ය.

- පුද්ගලවාදය- මෙමගින් කිසියම් සමාජ කණ්ඩාමකට හෝ සාමූහික ආයතනයකට එරෙහිව මානව පුද්ගලයාගේ උත්තරීතර වැදගත්කම පිළිබඳ විශ්වාසය පිළිබිඹු කෙරේ.
- නිදහස - මෙය ලිබරල්වාදයේ කේන්ද්‍රීය අගය කිරීමකි. මෙයට සමානාත්මතාව, සාධාරණත්වය හෝ අධිකාරියට ඉහළින් ප්‍රමුඛත්වය ලබා දෙයි.
- සමානාත්මතාවය - මින් අදහස් වන්නේ අවස්ථාලාභයන්ගේ සාමානාත්මතාවයයි.
- ඉවසීම-ලිබරල්වාදීන් විශ්වාස කරන්නේ ඉවසීම පුද්ගල නිදහස සහතික කිරීමක් සහ සමාජීය පොහොසත් කිරීමේ මාධ්‍යයක් බවයි.
- කැමැත්ත-ලිබරල් අදහස තුල, අධිකාරිත්වය සහ සමාජ සම්බන්ධතාවයන් සැම විටම කැමැත්ත හෝ එකගත්වය මත පදනම් විය යුතු ය. එබැවින් ආණ්ඩුව පාලිතයාගේ කැමැත්ත මත පදනම් විය යුතු ය.

**(ii) සමාජවාදය**

මෙයින් අපේක්ෂා කරන්නේ සමාජවාදයේ ප්‍රධාන ලක්ෂණ තේරුම් ගැනීමේ සහ පැහැදිලි කිරීමේ හැකියාව පරීක්ෂා කිරීම ය.

සමාජවාදයේ විශ්වාසය වන්නේ නිෂ්පාදන ක්‍රියාවලිය සමාජයේ පොදු ක්‍රියාවලියක් බවට පරිවර්තනය කිරීම මගින් සහ පොදු අයිතිය තහවුරු කිරීම මගින් පුද්ගල දේපල ක්‍රමය තුල ඇති අසමානත්වයට ආමන්ත්‍රණය කළහැකි බවයි. සමාජවාදයේ ප්‍රධාන අදහස් පහත දක් වේ.

- ධනේශ්වර සමාජ සහ ආර්ථික ක්‍රමය ගොඩ නැගී ඇත්තේ ශ්‍රම සූරා කෑම මත ය.
- පුද්ගලික දේපල ක්‍රමය සහ නිෂ්පාදන මාධ්‍යයේ පුද්ගල හිමිකාරිත්වය පවතින තාක් ශ්‍රම සූරා කෑම සහ පන්ති අසමානත්මතාවය අඛණ්ඩව පවතිනු ඇත.
- ශ්‍රම සූරාකෑමල තියුණු සමාජ අසමානාත්මතාවය සහ දුප්පත්කම ධනවාදයට ආවේණික ය. එය මුලිනුපුටා දැමිය හැක්කේ ධනවාදය වෙනුවට සමාජවාදී සමාජ ආර්ථික ක්‍රමයක් ඇති කිරීම මගිනි. එවැනි මූලික වෙනසක් සඳහා සමාජවාදී විප්ලවයක් අවශ්‍ය ය.
- සමාජවාදය යටතේ නිෂ්පාදන මාධ්‍යයන්ගේ පොදු අයිතිය හිමි වනු ඇත්තේ පොදුවේ මුළු සමාජයටම ය. ආර්ථික නිෂ්පාදනය සහ බෙදා හැරීම සමාජ ක්‍රියාවලියක් වනු ඇත.
- කිහිප දෙනෙකු අත ධනය ඒකරාශී වීමක් සිදු නොවේ. සමාජ ධනය සමාජය තුල සාධාරණ ලෙස බෙදී යනු ඇත.
- පෞද්ගලික දේපල සහ පන්ති අසමානාත්මතාවය නොමැති වීමේ ප්‍රතිපලයක් වශයෙන් පන්තීන් අතුරුදහන් වනු ඇත.
- ධනේශ්වර සමාජයක් තුල, එවන් සමාජවාදී පරිවර්තනයක් සඳහා මූලිකත්වය ගත යුත්තේ කම්කරු පන්තිය විසිනි. කම්කරු පන්තිය සමාජවාදී විප්ලවයට නායකත්වය සැපයිය යුතු ය.
- වීප්ලවය ධනපති හා කම්කරු පන්ති අතර පන්ති අරගලයේ කූටප්‍රාප්තිය ද වනු ඇත.
- සමාජවාදී රාජ්‍යයේ ප්‍රධාන කාර්ය වනුයේ පෞද්ගලික දේපල ක්‍රමය අහෝසි කිරීම සහ ධනේශ්වර ආර්ථික සහ සමාජ ක්‍රමය සමාජවාදී ක්‍රමයට පරිවර්තනය කිරීමයි.
- සමාජවාදය යනු කොමියුනිස්ට්වාදය දෙසට සමාජ වර්ධනයේ පළමු අදියරයි.

අපේක්ෂකයා විසින් සමාජවාදය මගින් සාමූහික හිමිකම ප්‍රවර්ධනය, සමාජ සමානාත්මතාවය, පොදු මනුෂ්‍යත්වය බෙදාහැරීමේ සාධාරණත්වය යනාදිය ප්‍රවර්ධනය කරන බව ද ඉස්මතු කල හැකි ය.

**(iii) ෆැසිස්ට්වාදය**

මෙහිදී අපෙක්ෂා කරන්නේ ෆැසිස්ට්වාදය ප්‍රධාන ලක්ෂණ පැහැදිලි කිරීම සම්බන්ධයෙන් අපේක්ෂකයාගේ හැකියාව පරීක්ෂා කිරීම ය.

- ෆැසිස්ට්වාදය විශේෂිත වර්ගයක ආඥාදායකත්වයක් ස්ථාපිත කිරීමට යත්න දරයි. මේ ආකාරයේ ආඥාදායකත්වයක් තුල රාජ්‍යය විසින් මුළුමනින් ද සමාජය සහ එහි පුරවැසියන් පාලනය කරයි. දේශපාලන න්‍යාය තුල එය හඳුන්වන්නේ සර්වබලවාදය ලෙසිනි. සර්වබලවාදය රාජ්‍යයට සහ පාලකයාට සමාජය පාලනය කිරීම සම්බන්ධයෙන් පරම බලයක් ලබා දෙයි.

**රාජ්‍යය වන්දනය**

රාජ්‍ය වන්දනය පිළිබඳ මතවාදය මුලින් ආරම්භ කලේ මුසෝලිනි විසිනි. එහි මූලික අදහස වූයේ රාජ්‍යයේ පරම අධිකාරීත්වය ප්‍රශ්න කිරීමකින් තොරව සෑම පුරවැසියෙකු විසින් ම පිළිගත යුතු බවත් එයට කොන්දේසි විරහිතව යටත්විය යුතු බවත් ය.

**නායකත්ව වන්දනාව**

නායකයාගේ පරම අධිකාරීත්වය කොන්දේසි විරහිතව පිළිගැනීම පැසිස්ට් මතවාදයේ ප්‍රධාන ලක්ෂණයකි.

**අන්ත වර්ගවාදය**

අන්ත වර්ගවාදය වර්ධනය කරනු ලැබුවේ ජර්මන් ෆැසිස්ට්වාදයේ කොටසක් ලෙසිනි. නාසිවාදය යටතේ ජර්මන් ජාතිය සළකනු ලැබුවේ ශ්‍රේෂ්ඨතම සහ ශුද්ධ වූ ආර්ය ජාතිය ලෙසිනි.

**අන්ත මිලිටරිවාදය**

අන්ත මිලිටරිවාදය සහ වර්ගවාදය මගින් අනුප්‍රාණය ලද ජර්මන් ෆසිස්ට්වාදීන් විසින් ලෝක යුද්ධයට මුල පුරමින් යුරෝපීය රටවල් ආක්‍රමණය කර යුදෙව්වන් ලක්ෂ ගණනක් ඝාතනය කරන ලදි.

**දේශපාලන ආයුදයක් ලෙසින් ප්‍රචන්ඩත්වය සහ භීෂණය භාවිතා කිරීම**

ෆැසිස්ට් රාජ්‍යය සහ ෆැසිස්ට් ව්‍යාපෘතිය උත්සාහ කලේ සමස්ථ ජරමනිය ම ෆැසිස්ට්වාදීන්ගේ පාලනය යටතට ගෙන ඒමයි. ඒ සඳහා ඔවුන් විරුද්ධවාදීන් ඝාතනය කිරීම සහ සිරගත කිරීම අඛණ්ඩව සිදු කලේ ය.

ෆැසිස්ට්වාදය ධනවාදයට, ලිබරල්වාදයට, පුද්ගලවාදයට සහ කොමියුනිස්ට්වාදයට විරුද්ධ වූවකි.


ෆැසිස්ට් දාර්ශනික Gentile (1875-1944) වරක් ප්‍රකාශ කලේ 'සැම දෙයක් ම පවතින්නේ රාජ්‍ය සඳහා මිස රාජ්‍යයට විරුද්ධව හෝ ඉන් පරිබාහිරව නොවේ' ය යන්නයි.

### 3.3.6 ප්‍රශ්න අංක 3 සඳහා විශ්ලේෂණය

**ප්‍රස්තාරය 3.8**

ප්‍රශ්න අංක 3 සඳහා අපේක්ෂකයන් ලබාගත් ලකුණුවල ව්‍යාප්තිය

මෙම ප්‍රශ්නය සඳහා හිමි මුළු ලකුණු ප්‍රමාණය 20කි.




ඉන්;


ලකුණු 00– 05 ප්‍රාන්තරයේ 26.2% ක් ද,
ලකුණු 06– 10 ප්‍රාන්තරයේ 27.5% ක් ද,
ලකුණු 11 – 15 ප්‍රාන්තරයේ 33.4% ක් ද,
ලකුණු 16 – 20 ප්‍රාන්තරයේ 12.8% ක් ද,
වශයෙන් අපේක්ෂකයන් ලකුණු ලබා ඇත.

අපේක්ෂකයන් අතුරෙන් 26.23%ක් ලකුණු 5ක් හෝ ඊට අඩුවෙන් ලබා ඇත.

**මූලාශ්‍රය :** RD/16/3/AL පත්‍රිකාවෙන් රැස්කළ පර්යේෂණ හා සංවර්ධන දත්ත, 2024, ශ්‍රී. ලං. වි. දෙ.

**ප්‍රස්තාරය 3.9**

ප්‍රශ්න අංක 3 සඳහා පහසුතා දර්ශක




**මූලාශ්‍රය :** RD/16/4/AL පත්‍රිකාවෙන් රැස්කළ පර්යේෂණ හා සංවර්ධන දත්ත, 2024, ශ්‍රී. ලං. වි. දෙ.

මෙම ප්‍රශ්නය 12 ශ්‍රේණියේ 'දේශපාලන මතවාදවල ස්වභාවය සහ කාර්ය පිළිබඳ අවබෝධය ප්‍රදර්ශනය කරයි' යන 5 නිපුණතාව මත පදනම්ව ඉදිරිපත් කර ඇත. මෙම ප්‍රශ්නය විවිධ දේශපාලන මතවාද පිළිබඳ අපේක්ෂකයන්ගේ දැනුම පරීක්ෂා කිරීම අරමුණු කොට සකසා ඇති අතර, ලබා දී ඇති දේශපාලන මතවාද තුනෙන් දෙකක ප්‍රධාන ලක්ෂණ කෙටියෙන් සාකච්ඡා කිරීම අපේක්ෂා කර ඇත. මෙම ප්‍රශ්නය පිළිතුරු සැපයීම සඳහා තෝරා ගත් අපේක්ෂකයන් ප්‍රතිශතය 36%කි. එම අපේක්ෂකයන් අතුරෙන් බහුතර අපේක්ෂක සංඛ්‍යාවක් ලිබරල්වාදය හා ෆැසිස්ට්වාදය යන (i) හා (iii) මාතෘකා දෙක තෝරා ගෙන ඇති අතර (ii) කොටස එනම් සමාජවාදය යන මාතෘකාව 25%ක් වූ අඩු අපේක්ෂක සංඛ්‍යාවක් පිළිතුරු සැපයීමට තෝරා ගෙන ඇත. (iii) කොටසෙහි පහසුතාව 60%ක් තරම් සාපේක්ෂව ඉහළ අගයක් ගැනීමට හේතු වන්නට ඇත්තේ ෆැසිස්ට්වාදයට අදාළ ලක්ෂණ නිශ්චිතව දැක්වීමට ඇති හැකියාවයි. බොහෝ අපේක්ෂකයන් ලිබරල්වාදය හා සමාජවාදය යන දේශපාලන මතවාද දෙකෙහි ප්‍රධාන ලක්ෂණ වෙනුවට න්‍යාය සඳහන් කිරීම එම මාතෘකා දෙක සඳහා පහසුතාව අඩු වීමට හේතු වී ඇත.

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සංවර්ධනය කිරීම සඳහා දේශපාලන ආර්ථික මතවාද, සංකල්ප හා න්‍යායාත්මක කරුණු පිළිබඳව පොත්පත් පරිශීලනය හා එම මතවාද ප්‍රායෝගිකව රාජ්‍යයන් තුළ ක්‍රියාත්මකවන ආකාරය පිළිබඳ තොරතුරු සෙවීමට සිසුන් යොමු කරවීම සිදු කළ යුතු ය.

## 3.3.7 ප්‍රශ්න අංක 4 සහ අපේක්ෂිත පිළිතුර

**II කොටස**

**4. ඩොනමෝර් ව්‍යවස්ථාව මගින් ප්‍රදානය කරන ලද සර්වජන ඡන්ද බලයේ දේශපාලන සහ සමාජ බලපෑම විමර්ශනය කරන්න. (ලකුණු 20)**

මෙම ප්‍රශ්නයේ අරමුණ වනුයේ ඩොනමෝර් ව්‍යවස්ථාවෙන් හඳුන්වා දෙන ලද සර්ව ජන ඡන්ද බලය ලංකාවේ සමාජ, ආර්ථික සහ දේශපාලන ක්ෂේත්‍ර අතුරින් දේශපාලන සහ සමාජ ක්ෂේත්‍රයට ඇති කළ බලපෑම උදාහරණ සහිත ව අපේක්ෂයා විසින් විමර්ශනයට ලක් කිරීමයි.

සර්ව ජන ඡන්ද බලය හඳුන්වා දීම ශ්‍රී ලංකාවේ දේශපාලන සහ ආර්ථික ක්ෂේත්‍රය කෙරෙහි කැපී පෙනෙන බලපෑමක් ඇති කළේ ය. එය පහත සඳහන් අන්දමට සාරාංශ කොට දැක්විය හැකි ය.

* සාමාන්‍ය ජනතාව රටේ ප්‍රධාන දේශපාලන ප්‍රවාහයට පිවිසියේ සර්ව ජන ඡන්ද බලය තුලිනි. සර්ව ජන ඡන්ද බලයේ ප්‍රතිඵලයක් ලෙසින් 1924 වර්ෂයේ දී ලක්ෂ දෙකක් ව පැවැති ඡන්දදායක සංඛ්‍යාව සර්වජන ඡන්ද බලය ප්‍රදානය කිරීමත් සමග ලක්ෂ 15 දක්වා වැඩි විය. 1936 වන විට සර්ව ජන ඡන්ද බලයේ ප්‍රතිඵලයක් ලෙසින් එතෙක් ප්‍රභූන් විසින් අභ්‍යාස කරමින් සිටි දේශපාලනය ග්‍රාමීය ඡන්දදායකයා වෙත ලගා වන්නට විය. ඉන් පසු ඔවුහු ක්‍රමයෙන් අර්ධ පක්ෂ දේශපාලනයට හැඩ ගැසීමට පටන් ගත්හ.

* 1931 දී සර්ව ජන ඡන්ද බලය හඳුන්වා දීම පක්ෂ සංවිධාන ගොඩ නැගීමට උත්තේජනයක් ඇති කළේ ය. මෙය පලමුව දැකිය වූයේ 1935 දී ලංකා සම සමාජ පක්ෂය පිහිටු වීමෙනි. 1943 දී ලංකා කොමියුනිස්ට් පක්ෂ ආරම්භ විය. 1944 සහ 1951 අතර කාලය තුල දෙමළ කොන්ග්‍රසය, එක්සත් ජාතික පක්ෂය, ෆෙඩරල් පක්ෂය, විප්ලවකාරී ලංකා සමසමාජ පක්ෂය සහ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය යන පක්ෂ

පිහිටවනු ලැබිණි. 1947 මහමැතිවරණය පක්ෂ මත පදනම්ව පැවැති ප්‍රතම මැතිවරණය විය. මෙම මැතිවරණයේ දී ජයග්‍රාහී පක්ෂය ලෙසින් එක්සත් ජාතික පක්ෂය මතුවනු අතර එම පක්ෂය වෙනත් පක්ෂ සහ කණ්ඩායම්වල සහාය ඇතිව නිදහස් ලංකාවේ ප්‍රතම ආණ්ඩුව පිහිටු වීය. 1950 ගණන් වල දී පක්ෂ ක්‍රමයේ ව්‍යුහය ගොඩ නැගුණු අතර ඒ තුල මෑතක් වන තුරු දේශපාලන බලය අරබයා ප්‍රධාන තරගකරුවන් දෙදෙනා වශයෙන් එක්සත් ජාතික පක්ෂය සහ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය සුවිශේෂි ස්ථානයක් අත්කර ගෙන තිබුණි.

* සර්ව ජන ඡන්ද බලය, රටේ දේශපාලන නායකත්වයට මහජනතාවගේ අවශ්‍යතා සඳහා මෙතෙක් කටයුතු කලාට වඩා මහත් වගකීමෙන් කටයුතු කිරීමට බල කළේ ය. ජනතාවගේ අපේක්ෂාවන් ඉටු කිරීමට ක්‍රියා නොකලහොත් ඊ ලග මැතිවරණයේ දී ජනතාව විසින් ඔවුන්ව ප්‍රතික්ෂේප කරනු ඇත යන්න වටහා ගැනීමට දේශපාලන නායකයන් පෙළඹුණි.

* සර්ව ජන ඡන්ද බලය විශේෂයෙන් 1936- 1947 අතර කාලය තුල සමාජ සුබසාධනයේ ආරම්භය සහ වර්ධනය කෙරෙහි පලල් උත්තේජනයක් සැපයිණි. මේ කාලය තුල සුබසාධනයේ වැදගත් ක්ෂේත්‍ර තුනක් වූයේ අධ්‍යාපනය, සෞඛ්‍යය සහ සහනාධාර ය. සමාජ සුබ සාධනයට සිදුකල ආයෝජනය ඉතා විශාල ලෙසින් ඉහළ ගිය අතර එම නැමියාව ඩොනමෝර් යුගයෙන් ඔබ්බට ද පැවතුණි. එමගින් ඉතා කුඩා සුභ සාධක රාජ්‍යයට පදනම දමනු ලැබිණ.

* ඩොනමෝර් ප්‍රතිසංස්කරණවල ප්‍රධාන ප්‍රතිඵල වලින් එකක් වූයේ ජනතාව දේශපාලනිකව බලගැන්වීමයි. මෙයට ප්‍රධාන ලෙසින් හේතු වූයේ සර්ව ජන ඡන්ද බලය ප්‍රදානය කිරීම ය. එය ආන්තීකරනයට ලක්ව සිටි සමාජ සහ වාර්ගික කණ්ඩායම් වලට ඔවුන්ගේ විමුක්තිය ගැන වඩාත් දැනුවත් වීමට උපකාරි විය.

* සර්ව ජන ඡන්ද බලය මානව හිමිකම්වල වර්ධනයට දායක විය. සර්ව ජන ඡන්ද බලය, ජනතාව නොදැනුවත්භාවයෙන් විමුක්තිය අත්කර දීමේ උපකරණයක් ලෙසින් ක්‍රියා කළේ ය. සර්ව ජන ඡන්ද බලය ප්‍රදානය කිරීම පිටුපස පැවැති තර්කය වූයේ කිසිදු අවහිරයකින් තොරව අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස, රැස්වීමේ නිදහස, සමාගමයේ නිදහස සහ පුවත් නිදහස පිළි ගැනීම ය. සර්ව ජන ඡන්ද බලය හඳුන්වා දීම සෙසු ඇතැම් අයිතිවාසිකම් වල විශේෂයෙන් සමාජ අයිතිවිසිකම්වල වර්ධනයට ඉවහල් විය. මේ ප්‍රතිසංස්කරණ වල ඉහළම අත්කර ගැනීම වූයේ සියළු මට්ටම් වලට නිදහස් අධ්‍යාපනය හඳුන්වා දීමයි.


ඉහතින් දක්වන ලද කරුණු හැරුණු විට අපේක්ෂකයා අමතර විශේෂ කරුණු ද පිළිතුරට ඇතුලත් කළ හැකිය. ඒවායේ අදාළත්වය සහ යෝග්‍යතාව සැළකිල්ලට ගෙන ලකුණු ප්‍රදානය කරන්නේ නම් මැනවි.

### 3.3.8 ප්‍රශ්න අංක 4 සඳහා විශ්ලේෂණය

**ප්‍රස්තාරය 3.10**

ප්‍රශ්න අංක 4 සඳහා අපේක්ෂකයන් ලබාගත් ලකුණුවල ව්‍යාප්තිය

මෙම ප්‍රශ්නය සඳහා හිමි මුළු ලකුණු ප්‍රමාණය 20කි.




ඉන්;

ලකුණු 00– 05 ප්‍රාන්තරයේ 28.17%ක් ද,

ලකුණු 06– 10 ප්‍රාන්තරයේ 21.14%ක් ද,

ලකුණු 11 – 15 ප්‍රාන්තරයේ 28.76%ක් ද,

ලකුණු 16 – 20 ප්‍රාන්තරයේ 21.93%ක් ද,


වශයෙන් අපේක්ෂකයන් ලකුණු ලබා ඇත.

මෙම ප්‍රශ්නය පිළිතුරු සැපයීම සඳහා තෝරා ගත් අපේක්ෂකයන් අතුරෙන් 28.17%ක් ලකුණු 05ක් හෝ ඊට වඩා අඩුවෙන් ලබා ඇත. අපේක්ෂකයන් අතුරෙන් 21.93%ක් ලකුණු 16ක් හෝ ඊට වඩා වැඩියෙන් ලබා ඇත.

**මූලාශ්‍රය :** RD/16/3/AL පත්‍රිකාවෙන් රැස්කළ පර්යේෂණ හා සංවර්ධන දත්ත, 2024, ශ්‍රී. ලං. වි. දෙ.

**ප්‍රස්තාරය 3.11**

ප්‍රශ්න අංක 4 සඳහා පහසුතා දර්ශකය




**මූලාශ්‍රය :** RD/16/4/AL පත්‍රිකාවෙන් රැස්කළ පර්යේෂණ හා සංවර්ධන දත්ත, 2024, ශ්‍රී. ලං. වි. දෙ.

මෙම ප්‍රශ්නය 12 ශ්‍රේණියේ 'ශ්‍රී ලංකාවේ යටත් විජිත පරිවර්තනයේ සමාජ ආර්ථික සහ දේශපාලන පැතිකඩ හඳුනා ගනියි' යන නිපුණතාව මත පදනම්ව සකස් කර ඇත. මෙම ප්‍රශ්නය ශ්‍රී ලංකාවේ යටත් විජිත පරිවර්තනය සඳහා බෙහෙවින් බලපෑ සර්වජන ඡන්ද බලය ලබා දීමේ ප්‍රතිවිපාක විමසා බැලීම අරමුණු කර ගොඩනගා ඇත. මෙම ප්‍රශ්නය පිළිතුරු සැපයීම සඳහා තෝරාගත් අපේක්ෂක ප්‍රතිශතය 64%කි. මෙම ප්‍රශ්නයෙහි පහසුතාව 52%කි. ශ්‍රී ලංකාවේ යටත් විජිත පරිවර්තනයේ ප්‍රතිවිපාක සමාජය තුළින් ග්‍රහණය කර ගැනීමට අපේක්ෂකයන්ට අවස්ථාවන් පැවතීම මෙම සාධනයට හේතු වන්නට ඇත.

විෂය කරුණු සංවර්ධනය සඳහා ලංකාවේ ආණ්ඩුක්‍රමය සම්බන්ධ ග්‍රන්ථ පරිශීලනය කිරීමට අවස්ථාව ලබා දීම, කථික තරඟ පැවැත්වීම, සංවාද මණ්ඩප හා විවාද පැවැත්වීම, ආණ්ඩුක්‍රම ඉතිහාසය පිළිබඳ සඟරා සහ පුවත්පත් සකස් කිරීම වැනි ක්‍රියාකාරකම් තුළින් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය හැඩ ගස්වා ගැනීම ශිෂ්‍ය සාධනය සංවර්ධනය කර ගැනීමට යොදාගත හැක.

## 3.3.9 ප්‍රශ්න අංක 5 සහ අපේක්ෂිත පිළිතුර

**5. 1947/1948 සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අදාළව පහත සඳහන් අංග දෙකක් කෙටියෙන් සාකච්ඡා කරන්න.**

**(i) අග්‍රාණ්ඩුකාරයා**
**(ii) සෙනෙට් මණ්ඩලය**
**(iii) රාජ්‍ය සේවා කොමිෂන් සභාව**
**(iv) පාර්ලිමේන්තුවේ පරමාධිපත්‍යය** **(ලකුණු 10x 2 = 20)**

**(i) අග්‍රාණ්ඩුකාරයා**

* 1947/ 1948 සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ බ්‍රිතාන්‍ය රැජින ලංකාවේ ද රැජින විය. ඇයගේ ශ්‍රී ලංකාවේ නියෝජිතයා වූයේ අග්‍රාණ්ඩුකාරවරයා ය. ලංකාවේ අගමැතිවරයාගේ උපදෙස් මත බ්‍රිතාන්‍ය රැජින විසින් ඔහුව එම ධූරයට පත් කෙරිණි. අග්‍රාණ්ඩුකාරවරයාට නිශ්චිත නිල කාලයක් නොවී ය.

* ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ඇතැම් බලතල අග්‍රාණ්ඩුකාරයාට ප්‍රදානය කල අතර එම බලතල ඔහු විසින් ක්‍රියාවට නැංවිය යුතු වූයේ අගමැතිගේ උපදෙස් මත ය. එම බලතල වලට පාර්ලිමේන්තුව කැඳවීම සහ කල් තැබීම, පනත් වලට අනුමැතිය දීම, මහමැතිවරණයෙන් පසුව සෙනෙට් සභිකයන් පත් කිරීම සහ මහජන මන්ත්‍රී මණ්ඩලයට සාමාජිකයන් සය දෙනෙකු පත් කිරීම, සීමා නිර්ණය කොමිසමට සාමාජිකයන් පත් කිරීම, අධිකරණ සේවා කොමිසමේ සභාපතිවරයා හැර සෙසු සාමාජිකයන් පත් කිරීම, රාජ්‍ය සේවා කොමිසමේ සාමාජිකයන් පත් කිරීම, ඉහළ අධිකරණ වලට විනිසුරුවන් පත් කිරීම, කැබිනට් ලේකම් පත් කිරීම, ස්ථිර ලේකම්වරු පත් කිරීම, විගණකාධිපතිවරයා පත් කිරීම සහ මැතිවරණ කොමසාරිස්වරයා පත් කිරීම යනාදිය අයත් විය. මහමැතිවරණයෙන් පසුව අගමැතිවරයා පත් කිරීම සහ කැබිනට් අමාත්‍යවරු සහ පාර්ලිමේන්තු ලේකම්වරු (නියෝජ්‍ය අමාත්‍යවරු) පත් කිරීම ද අග්‍රාණ්ඩුකරුගේ කාර්යයන් විය.

* විදේශ ගිවිසුම් ඇති කරගැනීම, තානාපතිවරු සහ සෙසු රාජ්‍යතාන්ත්‍රික නිලධාරීන් පත් කිරීම, සහ යුද්ධය ප්‍රකාශ කිරීම යන කටයුතු වලට අදාළ බලතල අග්‍රාණ්ඩුකරුට හිමි වූයේ නැත. මෙම බලතල ක්‍රියාවට නැංවීම ලංකාවේ අගමැතිගේ උපදෙස් මත බ්‍රිතාන්‍ය රැජින විසින් සිදු කෙරිණි.

* ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සඳහන් නොවුව ද, අග්‍රාණ්ඩුකරුවිසින් ඉටුකල හැකි වූ එක් කාර්යයක් වූයේ රැජිනගේ නාමයෙන් වරදකරුවන්ට සමාව පිරි නැමීමයි. මෙම බලතල ඔහු විසින් ක්‍රියාත්මක කල යුතු වූයේ අධිකරණ අමාත්‍යවරයාගේ උපදෙස් මත පමණි.

අග්‍රාණ්ඩුකාරවරයා ඇතැම් සමාජ සහ උත්සවාකාර කටයුතු සිදු කළේ ය. මේවාට, පාඨශාලාවල ත්‍යාග ප්‍රදාන කිරීම් වලට සම්බන්ධ වීම, සංස්කෘතික කටයුතුවලට සම්බන්ධ වීම යනාදිය අයත් විය. එක් එක් පාර්ලිමේන්තු සැසිවාරය ආරම්භයේ දී ඉදිරි කාලය සඳහා ආණ්ඩුවේ ප්‍රතිපත්ති ඇතුලත් රාජාසන කතාව සිදු කලේ ද ආග්‍රාණ්ඩුකරු විසිනි.

**(ii) සෙනේට් මණ්ඩලය**

* සෙනේට් මණ්ඩලය නිර්මාණය කිරීම සෝල්බරි කොමිසමේ යෝජනාවකට අනුව සිදු වූවකි. එය පාර්ලිමේන්තුවේ දෙවන මණ්ඩලය විය. සෙනේට් මණ්ඩලය සාමාජිකයන් 30 දෙනෙකුගෙන් සමන්විත වූ අතර ඉන් 15 දෙනෙකු අගමැතිගේ උපදෙස් මත අග්‍රාණ්ඩුකරු විසින් පත් කල අතර සෙසු සාමාජිකයන් මාරුකල හැකි තනි ඡන්ද ක්‍රමය යටතේ මහජන මන්ත්‍රී මණ්ඩලයේ සාමාජිකයන් විසින් තෝරා පත් කරන ලදී.

* සෙනේට් සභිකයෙකු වීමට අවම වශයෙන් වයස අවුරුදු 35 ක් සම්පූර්ණ කල යුතු විය. සෙසු සුදුසුකම් මහජන මන්ත්‍රී මණ්ඩලයේ සාමාජිකයන්ගේ සුදුසුකම් ම විය.

* සෙනේට් සභිකයෙකු පත් කරනු ලබන්නේ වසර සයක නිල කාලයක් සඳහා ය. කෙසේ වෙතත් සෙනේට් මණ්ඩලය ක්‍රියාත්මක වූයේ අඛණ්ඩව ක්‍රියාත්මක වන ආයතනයක් ලෙසිනි. එහි අඛණ්ඩතාව ආරක්ෂා කලේ එහි සභිකයන්ගෙන් 1/3 ක් වසර දෙකකට වරක් ඉවත් වීම මගිනි. එබැවින් පාර්ලිමේන්තුව විසුරුවා හැරීමක් සෙනේට් සාමාජිකයන්ගේ ධූර කාලයට බලපෑවේ නැත.

* සෙනේට් මණ්ඩලය සතුව පැවැති එකම විශේෂිත බලය වූයේ මුදල් නොවන පනත් කෙටුම්පතක් පාර්ලිමේන්තුවේ සැසිවාර දෙකක් දක්වා කල් දැමීමයි. මුදල් පනත් කෙටුම්පතක් මාසයක් දක්වා කල් දැමීමේ හැකියාව එයට තිබුනි. එයට මුදල් පනත් කෙටුම්පතකට මුල පිරීමේ බලය නොතිබුණි.

* ව්‍යවස්ථාවේ සඳහන් වූයේ අවම වශයෙන් ඇමැතිවරු දෙදෙනෙක් වත් සෙනේට් මණ්ඩලයෙන් පත් කළ යුතු බවයි. ඉන් එක් අයෙකු අධිකරණ ඇමැති විය යුතුය. තව ද, පාර්ලිමේන්තු ලේකම්වරුගෙන් (නියෝජ්‍ය ඇමැතිවරුන්ගෙන්) දෙදෙනෙකුට වැඩි නොවන සංඛ්‍යාවක් සෙනේට් මණ්ඩලයෙන් පත් කල යුතු බව සඳහන් විය.

* රටේ දේශපාලන අධ්‍යාපනයට වටිනා සේවයක් සෙනේට් මණ්ඩලයෙන් කල හැකිය යන අපේක්ෂාව සෝල්බරි කොමිසමට තිබුනි. කෙසේ වෙතත් සෙනේට් මණ්ඩලයට පත්කල සභිකයන් ව්‍යවස්ථාවේ සඳහන්ව තිබූ අන්දමට විශේෂිත ක්ෂේත්‍ර වලින් සැම විට පත් වූයේ නැත. සෙනේට් මණ්ඩලයට සභිකයන් තෝරා පත් කරන විට හෝ පත් කරන විට සුළුතර අයිතිවාසිකම් සැළකිල්ලට ගත යුතු වුව ද ඔවුන් තෝරා ගන්නා ලද්දේ විශේෂයෙන් ඔවුන්ගේ පක්ෂ දේශපාලන ලැදියාවන් සැළකිල්ල ගෙන ය. එය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සම්පාදකයන්ගේ අභිලාෂ වලට පටහැනි විය.

**(iii) රාජ්‍ය සේවා කොමිෂන් සභාව**

* රාජ්‍ය සේවා කොමිසම රාජ්‍ය සේවයේ නියුතු පුද්ගලයන් සම්බන්ධයෙන් වග කියන අධිකාරිය විය. රාජ්‍ය සේවකයන් පත් කිරීම, මාරු කිරීම, අස් කිරීම සහ ඔවුන්ගේ විනය පාලනය මේ කොමිසමට පැවරී තිබුණි.

* අගමැතිගේ උපදෙස් මත අග්‍රාණ්ඩුකාරයා විසින් පත් කරනු ලබන සාමාජිකයන් තිදෙනෙකුගෙන් කොමිසම සමන්විත විය. සාමාජිකත්වය වසර පහක් විය. එසේ වුවද නැවත පත් කිරීමට ඉඩක් තිබුණි. සමාජිකයන් අතුරින් එක් අයෙකු අගමැතිගේ උපදෙස් මත අග්‍රාණ්ඩුකාරයා විසින් කොමිසමේ සභාපති ලෙස පත් කලයුතු විය.

* රාජ්‍ය සේවා කොමිසම පිහිටුවීමෙන් අරමුණු කිහිපයක් ඉටු කර ගැනීමට අපේක්ෂා කළේ ය. රාජ්‍ය සේවයට පුද්ගලයන් තෝරා ගැනීමේ දී වියහැකි වෙනස් ලෙෂ සැලකීම් මෙන්ම දේශපාලන අතපෙවීම් වලින් රාජ්‍ය සේවය ආරක්ෂා කර ගැනීමේ බලගතු බාධකයක් ලෙසින් ක්‍රියා කරනු ඇත යන අපේක්ෂාව පැවතුනි. වෙනස් ලෙෂ සැළකීමට එරෙහිව සුළුතර කණ්ඩායම් වල බිය පහකිරීම මෙන්ම ඔවුන් තුල විශ්වාසය තහවුරු මෙවැනි කොමිසමකින් හැකි ය යන අපේක්ෂාව ද තිබුණි.

* අපක්ෂපාති ආයතනයක් ලෙසින් රාජ්‍ය සේවා කොමිසමේ තත්වය ආරක්ෂා කෙරෙන ව්‍යවස්ථාමය ප්‍රතිපාදන කිහිපයක් තිබුණි. 1. කොමිසමේ තීරණ වලට බලපෑම් කිරීමට උත්සාහ කරන අයට දඩ් දඬුවම් පැමින වීමට ව්‍යවස්ථාව නිර්දේශ කිරීම 2. කොමිසමේ වැටුප් ඒකාබද්ධ අරමුදලට වැය බරක් වීම 3. සාමාජිකයන්ගේ වැටුප් අඩු නොකල යුතු වීම 4. සේවා කාලයෙන් පසු රාජ්‍ය සේවකයෙකු ලෙසින් කිසිදු පත් වීමක් බාර ගැනීම තහනම් කිරීම යනාදියයි.

**(iv) පාර්ලිමේන්තුවේ පරමාධිපත්‍යය**

* ඉංග්‍රීසි නීතිය මගින් එක්සත් රාජධානියට අදාළව පාර්ලිමේන්තුවේ පරමාධිපති සංකල්පය අර්ථකතනය කර ඇති ආකාරයට ලංකාවේ පාර්ලිමේන්තුව පරමාධිපත්‍ය භුක්ති වින්දේ නැත.

* 1947/48 සෝල්බරි ව්‍යවස්ථාව ලංකා පාර්ලිමේන්තුවේ ව්‍යවස්ථාදායක බලයට ඇති සීමාවන් සඳහන් කර තිබුණි. මේ සීමාවන් නම්

**ව්‍යවස්ථාවේ 29 (2) වගන්තිය**

ව්‍යවස්ථාවේ මේ වගන්තියෙන් පාර්ලිමේන්තුවේ නීති සම්පාදන බලය සීමා කර තිබුණි. මේ වගන්තියට අනුව ඕනැම ප්‍රජාවක පුද්ගලයන්ගේ ආගමික නිදහස උල්ලංඝණය වන හෝ වෙනස් ලෙස සැලකීමට ලක් කරන ඕනැම නීතියක් පැනවීම පාර්ලිමේන්තුවට තහනම් විය.

**අධිකරණ විවරණ බලය**

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට පටහැනි වන ආකාරයට සම්පාදනය කල නීතියක් අහෝසි කිරීමේ බලය අධිකරණයට තිබුනි. පනත් සම්මත කිරීම සම්බන්ධයෙන් පැවැති අධිකරණ විවරණ බලය සෝල්බරි ව්‍යවස්ථාව මගින් ප්‍රකාශිත ව අධිකරණයට ප්‍රදානය කලේ නැත. එය සෝල්බරි ව්‍යවස්ථාවේ ලිඛිත හා අනම්‍ය ස්වභාවයෙන් ඇගවුම් කර ඇති බව ඇමෙරිකා එක්සත් ජනපදයේ මෙන් ලංකාවේ අධිකරණය විසින් උපකල්පනය කරන ලදි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 19 වැනි වගන්තියෙන් අධිකරණයට නීති විවරණය කිරීමේ බලය පවතින බව ව්‍යංගයෙන් අවබෝධ කරගනු ලැබිණි. සෝල්බරි අවධිය තුල මෙම බලය අධිකරණය විසින් නිරන්තරයෙන් ම භාවිතා කරන ලදි.

**ව්‍යවස්ථාවේ 29 (4) වගන්තිය**


ව්‍යවස්ථාව සංශෝධනය කරන ආකාරයේ පනත් කෙටුම් පතක් සම්මත කරන්නේ නම්, 29(4) වගන්තියේ නියමයන් අනුගමනය කල යුතුව තිබුනි. මෙම වගන්තියට අනුව ව්‍යවස්ථාව සංශෝධනය කරන හෝ එහි කොටසක් ඉවත් කරන පනත් කෙටුම්පතක් සම්මත කල යුත්තේ මහජන මන්ත්‍රී මණ්ඩලයේ 2/3 ක බහුතරයෙනි. 2/3 ක බහුතරයෙන් සම්මත කරන ලද බවට සහතිකයක් කතානායක විසින් එයට ඇමිනිය යුතු බව එම වගන්තියේ සඳහන් විය. එම සහතිකය අවසානාත්මක වූ අතර එය කිසිඳු අධිකරණයක දී ප්‍රශ්න කල නොහැකි විය. එසේ වුව ද එම ක්‍රියාපටිපාටිය අනුගමනය නොකළේ නම් අධිකරණය විසින් එම පනත /නීතිය වලංගු නොවන බව ප්‍රකාශ කිරීමට නියමිතව තිබුණි.

### 3.3.10 ප්‍රශ්න අංක 5 සඳහා විශ්ලේෂණය

**ප්‍රස්තාරය 3.12**

ප්‍රශ්න අංක 5 සඳහා අපේක්ෂකයන් ලබාගත් ලකුණුවල ව්‍යාප්තිය

මෙම ප්‍රශ්නය සඳහා හිමි මුළු ලකුණු ප්‍රමාණය 20කි.




ඉන්;


ලකුණු 00– 05 ප්‍රාන්තරයේ 32.81%ක් ද,
ලකුණු 06– 10 ප්‍රාන්තරයේ 20.98%ක් ද,
ලකුණු 11 – 15 ප්‍රාන්තරයේ 30.64%ක් ද,
ලකුණු 16 – 20 ප්‍රාන්තරයේ 15.57%ක් ද,
වශයෙන් අපේක්ෂකයන් ලකුණු ලබා ඇත.

මෙම ප්‍රශ්නය පිළිතුරු සැපයීම සඳහා තෝරා ගත් අපේක්ෂකයන් අතුරෙන් 32.81%ක් ලකුණු 05ක් හෝ ඊට වඩා අඩුවෙන් ලබා ඇත.

**මූලාශ්‍රය :** RD/16/3/AL පත්‍රිකාවෙන් රැස්කළ පර්යේෂණ හා සංවර්ධන දත්ත, 2024, ශ්‍රී. ලං. වි. දෙ.

**ප්‍රස්තාරය 3.13**

ප්‍රශ්න අංක 5 සඳහා පහසුතා දර්ශකය




**මූලාශ්‍රය :** RD/16/4/AL පත්‍රිකාවෙන් රැස්කළ පර්යේෂණ හා සංවර්ධන දත්ත, 2024, ශ්‍රී. ලං. වි. දෙ.

මෙම ප්‍රශ්නය 12 ශ්‍රේණියේ 'නිදහසින් පසු ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංවර්ධනය පිළිබඳ අවබෝධය ප්‍රදර්ශනය කරයි' යන 8 නිපුණතාවෙන් සකස් කර ඇත. සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අදාළ අංග හතරක් අතුරෙන් අංග දෙකකට පමණක් පිළිතුරු සැපයීම අපේක්ෂා කර ඇත. මෙම ප්‍රශ්නය පිළිතුරු සැපයීම සඳහා තෝරාගත් අපේක්ෂකයන් ප්‍රතිශතය 50%කි.

මෙම ප්‍රශ්න යටතේ ලබා දී ඇති අනුකොටස් අතුරෙන් රාජ්‍ය සේවා කොමිෂන් සභාව යන මාතෘකාව සඳහා පහසුතාව වැඩිම අතර එහි පහසුතාව 56%කි. පිළිතුර සඳහා සංක්ෂිප්තව කරුණු දැක්විය හැකි වීම මෙම සාපේක්ෂ ඉහළ සාධනයට හේතු වී ඇත.

පහසුතාව අඩුම 5(iv) අනුකොටස වන අතර එහි පහසුතාව 47%කි. ඉන් පාර්ලිමේන්තුවේ පරමාධිපත්‍ය පිළිබඳව සාකච්ඡා කිරීම අපේක්ෂා කර ඇත. පාර්ලිමේන්තු පරමාධිපත්‍ය සංකල්පය තහවුරු කිරීම සඳහා සමහර අපේක්ෂකයන් ප්‍රමාණාත්මකව කරුණු නොදැක්වීම මෙම අඩු සාධනයට හේතු වී ඇත.

ආණ්ඩුක්‍රමයේ එක් එක් අංග පිළිබඳ ප්‍රමාණාත්මක අවබෝධයක් සිසුන්ට ලබා දීමට ක්‍රියා කිරීම, ආණ්ඩුක්‍රම තුලනාත්මකව අධ්‍යයනය කිරීමට විවාද පැවැත්වීම හා බුද්ධි මණ්ඩල සාකච්ඡා මෙහෙයවීම වැනි ක්‍රියාකාරකම් මඟින් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සංවර්ධනය කර ගත හැකි ය.

## 3.3.11 ප්‍රශ්න අංක 6 සහ අපේක්ෂිත පිළිතුර

**6. 1972 ප්‍රථම ජනරජ ව්‍යවස්ථාව යටතේ පිහිටුවන ලද ජාතික රාජ්‍ය සභාවේ සංයුතිය හා උත්තරීතරභාවය පිළිබඳව සාකච්ඡා කරන්න. (ලකුණු 20)**

මෙම ප්‍රශ්නයේ අරමුණ ජතික රාජ්‍ය සභාවේ සංයුතිය පිළිබඳ අපේක්ෂයා තුල පවතින අවබෝධය තක්සේරු කිරීමත් ජාතික රාජ්‍ය සභාවේ උත්තරභාවය පිළිබඳ ව අපේෂකයා තුල ඇති අවබෝධය පරීක්ෂා කිරීමත් ය.

1972 ව්‍යවස්ථාවෙන් පිහිටුවන ලද ව්‍යවස්ථාදායකය ඒකමාණ්ඩලික ව්‍යවස්ථාදායකයක් වූ අතර එය ජාතික රාජ්‍ය සභාව නමින් හැඳින්විණි. එහි සාමාජිකත්වය සඳහා පැවතියේ එක පදනමක් පමණක් බැවින් එහි සංයුතිය විස්තර කිරීම පහසු ය. ජාතික රාජ්‍ය සභාව සමන්විත වූයේ මුළුමනින්ම තෝරා පත්කර ගන්නා ලද මන්ත්‍රීන් ගෙනි.

කෙසේ වෙතත් ප්‍රතම ජාතික රාජ්‍ය සභාව සඳහා ව්‍යවස්ථාවේ 42 වන වගන්තිය තුල විශේෂිත සැළසුමක් තිබුණි. ඒ අනුව පළමු ජාතික රාජ්‍ය සභාවට පත් කල මන්ත්‍රීන් ද ඇතුලත් වන බව සඳහන් විය. ව්‍යවස්ථාවට අනුව,බහු මන්ත්‍රී කොට්ඨාශ කිහිපයකින් හැර සෙසු සියළු මන්ත්‍රීන් පත් වන්නේ සරල බහුතර ක්‍රමය යටතේ තේ්වල මන්ත්‍රී ඡන්ද කොට්ඨාශ වලිනි.

මන්ත්‍රීවරුන්ගෙන් කිහිප දෙනෙකු ඉදිරි පෙළ මන්ත්‍රීන් ලෙසත් බහුතරය පසු පෙළ මන්ත්‍රීන් ලෙෂත් වර්ග කෙරිණි. සෑම ජාතික රාජ්‍ය සභාවක් කලින් විසුරුවා හැරීමක් නොකරන්නේ නම් සය අවුරුද්දක් පවතින බව ව්‍යවස්ථාවේ 40 (1) වගන්තියේ සඳහන් වෙයි.

ජාතික රාජ්‍ය සභාවේ උත්තරීතරභාවය ප්‍රතම ජනරජ ව්‍යවස්ථාවේ ප්‍රධාන ලක්ෂණය විය. මේ අනුව රටේ රාජ්‍ය බලයේ උත්තරීතර උපකරණය වූයේ ජාතික රාජ්‍ය සභාවයි.

රාජ්‍ය බලයේ උත්තරීතර උපකරණය වශයෙන් ජාතික රාජ්‍ය සභාව 1) ජනතාවගේ ව්‍යවස්ථාදායක බලය ද, 2) ජනාධිපතිවරයා සහ අමාත්‍ය මණ්ඩලය හරහා ශ්‍රී ලංකාවේ ආරක්ෂාව ඇතුළු ජනතාවගේ විධායක බලය සහ, 3) අධිකරණය මඟින් ජනතාවගේ අධිකරණ බලය ද ක්‍රියාත්මක කලේ ය.

ජාතික රාජ්‍ය සභාවේ උත්තරීතර ව්‍යවස්ථාදායක බලයට ව්‍යවස්ථාව පරිච්ඡින්න කිරීම හෝ සංශෝධනය කිරිම සහ පවතින ව්‍යවස්ථාව වෙනුවට නව ව්‍යවස්ථාවක් පැනවීමේ බලය ද අයත් විය.

ජාතික රාජ්‍ය සභාවේ උත්තරීතරත්වය තුල කවර නීතියක් වුව ද පැනවීමේ බලය එයට තිබුණි.

ජාතික රාජ්‍ය සභාව සම්මත කල නීතියක වලංගුභාවය ප්‍රශ්න කිරීමට හෝ ඒ පිළිබඳ මතයක් ඉදිරිපත් කිරීමට කිසිඳු අධිකරණයකට හෝ වෙනත් ආයතනයකට හෝ පුද්ගලයෙකුට හැකියාවක් නොතිබුණි.


මේ ව්‍යවස්ථාව යටතේ අධිකරණයට නීති විවරණ බලය නොතිබුණි. කෙසේ වෙතත් යෝජිත පනතක/පනත් කෙටුම්පතක වගංගුභාවය විමසීමේ ඉඩක් මේ ව්‍යවස්ථාවෙන් විශේෂයෙන් ස්ථාපිත කළ ව්‍යවස්ථා අධිකරණයට තිබුණි. මේ ව්‍යවස්ථා අධිකරණය විසින් යම් කිසි පනත් කෙටුම්පතක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට පටහැනි බව ප්‍රකාශ කලහොත් ජාතික රාජ්‍ය සභාවේ 2/3 ක වැඩි ඡන්දයෙන් එය බලාත්මක කළ හැකි විය. ජනතාවගේ ව්‍යවස්ථාදායක බලය ක්‍රියාත්මක කරන රාජ්‍ය බලයේ උත්තරීතර උපකරණය වීම හේතුවෙන් එම බලයට නෛතික සීමාවන් දක්වා නොතිබුණි.

### 3.3.12 ප්‍රශ්න අංක 6 සඳහා විශ්ලේෂණය

**ප්‍රස්තාරය 3.14**

ප්‍රශ්න අංක 6 සඳහා අපේක්ෂකයන් ලබාගත් ලකුණුවල ව්‍යාප්තිය

මෙම ප්‍රශ්නය සඳහා හිමි මුළු ලකුණු ප්‍රමාණය 20කි.




ඉන්;

ලකුණු 00– 05 ප්‍රාන්තරයේ 26.34%ක්ද,

ලකුණු 06– 10 ප්‍රාන්තරයේ 22.92%ක්ද,

ලකුණු 11 – 15 ප්‍රාන්තරයේ 28.5%ක්ද,


ලකුණු 16 – 20 ප්‍රාන්තරයේ 22.25%ක්ද,

වශයෙන් අපේක්ෂකයන් ලකුණු ලබා ඇත. මෙම ප්‍රශ්නය පිළිතුරු සැපයීම සඳහා තෝරා ගත් අපේක්ෂකයන් අතුරෙන් 26.34%ක් ලකුණු 05ක් හෝ ඊට වඩා අඩුවෙන් ලබා ඇත. අපේක්ෂකයන් අතුරෙන් 22.25%ක් ලකුණු 16ක් හෝ ඊට වඩා වැඩියෙන් ලබා ඇත.

**මූලාශ්‍රය :** RD/16/3/AL පත්‍රිකාවෙන් රැස්කළ පර්යේෂණ හා සංවර්ධන දත්ත, 2024, ශ්‍රී. ලං. වි. දෙ.

**ප්‍රස්තාරය 3.15**

ප්‍රශ්න අංක 6 සඳහා පහසුතා දර්ශකය




**මූලාශ්‍රය :** RD/16/4/AL පත්‍රිකාවෙන් රැස්කළ පර්යේෂණ හා සංවර්ධන දත්ත, 2024, ශ්‍රී. ලං. වි. දෙ.

මෙම ප්‍රශ්නය 12 ශ්‍රේණියේ 'නිදහසින් පසු ශ්‍රී ලංකාවේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංවර්ධනය පිළිබඳ අවබෝධය ප්‍රදර්ශනය කරයි' යන 8 නිපුණතාවෙන් සකස් කර ඇත. මෙම ප්‍රශ්නයෙන් 1972 ප්‍රථම ජනරජ ව්‍යවස්ථාව මඟින් පිහිටුවන ලද ජාතික රාජ්‍ය සභාවේ සංයුතිය හා උත්තරීතරභාවය ආවරණය වන පිළිතුරක් අපේක්ෂා කර ඇත. මෙම ප්‍රශ්නය පිළිතුරු සැපයීම සඳහා තෝරාගත් අපේක්ෂකයන් ප්‍රතිශතය 28%කි. ප්‍රශ්නයෙහි පහසුතාව 46%කි.

ජාතික රාජ්‍ය සභාවේ සංයුතිය හා උත්තරීතරභාවය යන කරුණු දෙකම පිළිතුර තුළ ප්‍රමාණාත්මක ලෙස අන්තර්ගත නොවීම මෙම අඩු සාධනයට හේතු වී ඇත. ලකුණු ලබා ගැනීමට පහසු ප්‍රශ්නයක් වුවද, මෙම ප්‍රශ්නය අපේක්ෂකයන් අතර ජනප්‍රිය ප්‍රශ්නයක් නොවීමට 1972 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ අන්තර්ගතය පිළිබඳ පුළුල් දැනුමක් නොමැතිවීම හේතුවන්නට ඇත.

ඉහළ ලකුණු මට්ටමකට යෑමට හැකි මෙවැනි ප්‍රශ්න සඳහා පිළිතුරු සැපයීමට සිසුන්ට අවශ්‍ය පුහුණුව ලබා දීමට අනුහුරු අභ්‍යාස හා ආදර්ශ ප්‍රශ්න පත්‍ර සඳහා පිළිතුරු ලිවීමට අවස්ථාව ලබා දිය යුතු ය. ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා පිළිබඳ ප්‍රමාණාත්මක අවබෝධයක් ලබා දීම සඳහා ව්‍යවස්ථා තුලනාත්මකව හැදෑරීමට වාද විවාද පැවැත්වීම, බුද්ධි මණ්ඩල සාකච්ඡා, ප්‍රශ්න විචාරාත්මක වැඩසටහන් වැනි ක්‍රියාකාරකම් මඟින් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සංවර්ධනය කර ගත හැකි ය.

## 3.3.13 ප්‍රශ්න අංක 7 සහ අපේක්ෂිත පිළිතුර

**7. ශ්‍රී ලංකාවේ වර්තමාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ ජනාධිපතිවරයාට අදාළව පහත සඳහන් තේමා සාකච්ඡා කරන්න.**

**(i) ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීමේ ක්‍රමය (ලකුණු 05)**

**(ii) ජනාධිපතිවරයාගේ බලතල සහ කාර්යයන් (ලකුණු 15)**

මෙම ප්‍රශ්නයේ පළමු කොටසින් ශ්‍රී ලංකාවේ වර්තමාන ව්‍යවස්ථාව යටතේ ජනාධිපතිවරයා තෝරා පත් කරගන්නේ කෙසේ ද යන්න පිළිබඳ අපේක්ෂකයා සතු දැනුම හා අවබෝධය පරීක්ෂා කෙරේ. දෙවන කොටසින් අපේක්ෂා කරන්නේ වර්තමාන ව්‍යවස්ථාව යටතේ ජනාධිපතිවරයාගේ බලතල හා කාර්යයන් පිළිබඳ විශ්ලේෂණයකි.

**(i) ජනාධිපතිවරයා තෝරා පත්කර ගැනීමේ ක්‍රමය**

1978 ව්‍යවස්ථා සම්පාදකයන් තීරණය කළේ ජනතාවගේ ඡන්දයෙන් සෘජුව තෝරා පත්කර ගනු ලබන ජනාධිපති ධූරයක් හඳුන්වා දීමට ය. එහි අරමුණ වූයේ සමාජයේ සියළු කණ්ඩායම් නියෝජනය කල හැකි ජාතික චරිතයක් ලෙෂ ජනාධිපතිවරයා සිටිය යුතු බවයි. ජනාධිපතිවරයා තෝරා පත්කරගැනීමේ අවශ්‍යතාවේ දී ව්‍යවස්ථා සම්පාදකයන් විශේෂයෙන් උත්සුක වූයේ එවැනි ජනාධිපතිවරයෙකු තෝරා පත්කර ගැනීමට යොදා ගන්නා හොඳම ක්‍රමය කුමක් ද යන්න පිළිබඳව ය. මෙහිදී එක මැතිවරණයකට වට දෙකේ ඡන්ද ක්‍රමය (two round voting) ඒකාබද්ධ කරන ලද පරිපූරක ඡන්ද ක්‍රමය (supplementary voting system ) යොදා ගැනීමට තීරණය විය.

මේ ක්‍රමය යටතේ ජනාධිපතිවරයා තෝරා පත්කරගනු ලබන්නේ බහුතර සහායෙනි. මෙම ක්‍රමය අපේක්ෂකයනට තම දේශපාලන හෝ වාර්ගික ඡන්ද කොට්ඨාශයෙන් ඔබ්බට බැලීමට දිරිගැන්වීම් නිර්මාණය කරයි. මේ දක්වා (2024 හැර) ජයග්‍රාහි ජනාධිපති අපේක්ෂකයාට පළමු වටයේ දීම ප්‍රකාශිත වලංගු ඡන්ද වලින් පරම/ ඒකාන්ත බහුතරය දිනා ගැනීමට හැකි විය. එබැවින් මනාප මාරු කිරීම මත ක්‍රියා කිරීමේ අවශ්‍යතාවයක් ඇති නොවුණි. එනම් වලංගු ඡන්ද වලින් පරම බහුතර ඡන්ද ලබා ගන්නා (වලංගු ඡන්ද වලින් අඩකට වැඩි) අපේක්ෂකයා නිරායාසයෙන් ම ජනාධිපති ලෙෂ තේරී පත්වේ.

කිසිඳු අපේක්ෂකයෙකු තේරී පත් වූ බව ප්‍රකාශ නොකළහොත් එහි දී වැඩිම සහ දෙවන වැඩිම ඡන්ද සංඛ්‍යාව ලබා ගත් අපේක්ෂකයන් තරගය තුල රඳවා ගනිමින් සෙසු අය තරගයෙන් ඉවත් කෙරේ. ඉන් පසුව ඉවත් කරන ලද අපේක්ෂකයන් අතුරින් වැඩිම ඡන්ද ලබා ගත් අපේක්ෂකයාගේ ඡන්ද පත්‍රිකාවල දෙවන මනාපය තරගය තුල සිටින අපේක්ෂකයන් දෙදෙනාගෙන් එක් එක් අයට දී තිබේ නම් එය ඔවුන්ට ලැබුණු ඡන්ද සේ සළකා වෙන වෙනම එකතු කරනු ලැබේ. මේ ආකාරයට ඔහුගේ ඡන්ද පත්‍රිකාවේ තෙවන මනාපය ද තරගය තුල සිටින දෙදෙනාගෙන් එක් එක් අයට දී තිබේ නම් ඒවා ද ඔවුන්ගේ ඡන්ද වලට එකතු කරනු ලැබේ. අවසානයේ දෙදෙනා ගෙන් වැඩිම ඡන්ද ලබාගත් අපේක්ෂකයා ජයග්‍රාහකයා ලෙසින් තෝරා ගන්නා ලදැයි ප්‍රකාශයට පත් කෙරේ.

**(ii) ජනාධිපතිවරයාගේ බලතල සහ කාර්යයන්** **(ලකුණු 15)**

* වර්තමාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ ජනාධිපතිවරයා තවදුරටත් රාජ්‍යයේ නායකයා ද ආණ්ඩුවේ නායකයා ද විධායකයේ නායකයා ද සන්නද්ධ හමුදාවල ප්‍රධානියා ද වේ.

* ජනාධිපතිවරයා විසින් ක්‍රියාවට නැංවිය යුතු වඩා වැදගත් බලයක් හා කාර්යයක් වන්නේ අගමැතිවරයෙකු පත් කිරීමයි. ජනාධිපතිවරයා පාර්ලිමේන්තුවේ සාමාජිකයන් අතුරින් අගමැතිවරයාව පත් කරයි. අගමැතිවරයා පත් කිරීමේ දී ඔහුට කිසිදු කෙනෙකුගේ උපදෙස් පැතීම අනිවාර්ය අවශ්‍යතාවක් වන්නේ නැත.

* කැබිනට් මණ්ඩලයේ ක්‍රියාකාරීත්වය තුල ජනාධිපතිවරයාගේ භූමිකාව සැළකිය යුතු ලෙසින් පවතී. ඔහු/ඇය කැබිනට් මණ්ඩලයේ සාමාජිකයෙකු වන අතර කැබිනට් මණ්ඩලයේ නායකයා ද වේ. වර්තමාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ ජනාධිපතිවරයා ආරක්ෂක අමාත්‍ය ධූරය දැරිය යුතු ය. ඔහුට අමාත්‍ය ඕනෑම සංඛ්‍යාවක් තම භාරයේ තබා ගත හැකි ය. ආණ්ඩුක්‍රම ව්‍යවස්තාවෙන් දක්වා ඇති සීමාවන්ට යටත් ව, අමාත්‍ය ධූර සංඛ්‍යාව සහ අමාත්‍යාංශ සංඛ්‍යාව තීරණය කිරීමේ බලය ද එවැනි අමාත්‍යාංශ වලට විෂයයන් හා කාර්යයන් පැවරීමේ බලය ද තවදුරටත් ජනාධිපතිවරයා සතු ය. තව ද, ජනාධිපතිවරයාට තම අභිමතය පරිදි අමාත්‍යාංශ වලට සියළුම ලේකම්වරු පත් කිරීමේ බලය තිබේ. මෙය නැවතත් ජනාධිපති නිලය තුල විධායක බලය ඒකරාශි කිරීම සුරක්ෂිත කරයි.

* ව්‍යවස්ථාවේ 32 වන වගන්තියට අනුව, සෑම මාස තුනකට වරක් ම පාර්ලිමේන්තුවට පැමිණිය යුතු ය. මේ කාර්ය ක්‍රියාවට නැංවීමේ දී පාර්ලිමේන්තුවේ දී ඡන්දය ප්‍රකාශ කිරීම හැර මන්ත්‍රීවරයෙකු සතු වරප්‍රසාද, පරිහාර සහ බලතල වලට ඔහු හෝ ඇය හිමිකම් ලබයි. ව්‍යවස්ථාවේ 33 වන වගන්තිය යටතේ ජනාධිපතිවරයා විසින් පාර්ලිමේන්තුවේ එක් එක් සැසිවාර ආරම්භයේ දී ආණ්ඩුවේ ප්‍රතිපත්ති ප්‍රකාශනය ඉදිරිපත් කරනු ලබයි. පාර්ලිමේන්තුවේ උත්සවාකාර අවස්ථාවලදී එහි මූලසුන ගැනීමේ බලය ද ව්‍යවස්ථයෙන් ජනාධිපතිවරයාට පිරිනමා ඇත.

මහමැතිවරණයකින් පසු නව පාර්ලිමේන්තුවක් ප්‍රතම වරට රැස් වූ දිනයේ සිට වසර දෙකයි මාස හයක් ඉක්ම වීමෙන් පසු ඕනෑම විටෙක එම පාර්ලිමේන්තුව විසුරුවා හැරීමේ බලය ජනාධිපතිවරයා සතුව පවතී. පාර්ලිමේන්තුව විසුරුවා හැරීමේ බලය පාර්ලිමේන්තුව ජනාධිපතිවරයාගේ කැමැත්තට අනුකූල විය යුතු බව සහතික කරගැනීම සඳහා තිබෙන දේශපාලන ආයුදයක් ලෙෂ සැළකිය හැකි ය.

* ජනාධිපතිවරයා සහ පාර්ලිමේන්තුවේ බහුතරය එකම දේශපාලන පක්ෂයට අයත් වූ විටෙක පාර්ලිමේන්තුවට ස්වාධීන විවාදයකට යාමට හැකියාවක් ලැබෙන්නේ නැත. තව ද එබදු විටෙක ජනාධිපතිවරයාව යම් ආකාරයකට සංවරණය කිරීමට පාර්ලිමේන්තුවට තිබෙන ඉඩ ගිලිහෙනු ඇත.

* ව්‍යවසථාවේ 35 වන වගන්තියට අනුව මූලික අයිතිවාසිකම් පෙත්සම් සම්බන්ධයෙන් හැර ජනාධිපතිවරයා මුක්තියේ රැකවරණයට හිමිකම් ලබයි. ජනාධිපතිවරයාට එරෙහිව මූලික අයිතිවාසිකම් පෙත්සම් නීතිපතිවරයාට එරෙහිව ගොනු කෙරේ.


* ජනාධිපතිවරයාට තිබෙන තව සැළකිය යුතු බලයක් නම් සිය ධූර කාලයෙන් සිව් වසරක් අවසන් වීමෙන් පසු ඕනෑම විටෙක ජනාධිපතිවරණයක් පැවැත්වීමට ක්‍රියා කිරීම මගින් ජනාධිපතිවරණයේ වාසිය තම අතට ගැනීම අරබයා මැතිවරණ සිතියම වෙනස් කිරීමට තිබෙන හැකියාව ය.

### 3.3.14 ප්‍රශ්න අංක 7 සඳහා විශ්ලේෂණය

**ප්‍රස්තාරය 3.16**

ප්‍රශ්න අංක 7 සඳහා අපේක්ෂකයන් ලබාගත් ලකුණුවල  ව්‍යාප්තිය

මෙම ප්‍රශ්නය සඳහා හිමි මුළු ලකුණු ප්‍රමාණය 20කි.




ඉන්;

ලකුණු 00– 05 ප්‍රාන්තරයේ  39.26%ක් ද,

ලකුණු 06– 10 ප්‍රාන්තරයේ  25.07%ක් ද,

ලකුණු 11 – 15 ප්‍රාන්තරයේ 21.33%ක් ද,

ලකුණු 16 – 20 ප්‍රාන්තරයේ 14.34%ක් ද,


වශයෙන් අපේක්ෂකයන් ලකුණු ලබා ඇත.

මෙම ප්‍රශ්නය පිළිතුරු සැපයීම සඳහා තෝරා ගත් අපේක්ෂකයන් අතුරෙන් 39.26%ක් ලකුණු 05ක් හෝ ඊට වඩා අඩුවෙන් ලබා  ඇත.

මූලාශ්‍රය : RD/16/3/AL පත්‍රිකාවෙන් රැස්කළ පර්යේෂණ හා සංවර්ධන දත්ත, 2024,  ශ්‍රී. ලං. වි. දෙ.

**ප්‍රස්තාරය 3.17**

ප්‍රශ්න අංක 7 සඳහා පහසුතා දර්ශකය




මූලාශ්‍රය : RD/16/4/AL පත්‍රිකාවෙන් රැස්කළ පර්යේෂණ හා සංවර්ධන දත්ත, 2024,  ශ්‍රී. ලං. වි. දෙ.

මෙම ප්‍රශ්නය 13 ශ්‍රේණියේ '1978 ව්‍යවස්ථාව යටතේ ඇති වූ ආණ්ඩු ක්‍රමයේ ව්‍යුහාත්මක ලක්ෂණ, ආයතනික සංයුතිය සහ බලතුලනය හඳුනාගෙන පැහැදිලි කරයි' යන 12 නිපුණතාව පදනම් කරගෙන ගොඩ නැගී ඇත. මෙම ප්‍රශ්නය 1978 ජනාධිපතිවරයා තෝරාගැනීමේ ක්‍රමවේදය සහ බලතල හා කාර්යයන් පිළිබඳ දැනුම පරීක්ෂා කිරීමේ අරමුණින් සැකසූ ප්‍රශ්නයකි. මෙම ප්‍රශ්නය පිළිතුරු සැපයීම සඳහා තෝරාගත් අපේක්ෂකයන් ප්‍රතිශතය 66%කි. ප්‍රශ්නයෙහි පහසුතාව 41%කි.

ප්‍රශ්නය අනුකොටස් දෙකකින් සමන්විත වේ. ශ්‍රී ලංකාවේ වර්තමාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ ජනාධිපතිවරයාට අදාළව තේමා දෙකක් පිළිබඳ මින් විමසා ඇති අතර ජනාධිපතිවරයා තෝරා පත් කර ගැනීමේ ක්‍රමයට ලකුණු 05ක් ද, ජනාධිපතිවරයාගේ බලතල හා කාර්යයන් සඳහා ලකුණු 15ක් ද පිරිනමා ඇත. මෙම අනුකොටස් සඳහා වෙන්කර ඇති ලකුණු පදනම්ව පිළිතුර සංවිධානය කරගැනීමට අපේක්ෂකයන් බහුතරයක් අසමත් වී ඇත. එම දුබලතාව මඟහරවා ගැනීම සඳහා පිළිතුරක් සංක්ෂිප්ත කරන ආකාරය සඳහා අනුහුරු අභ්‍යාස කරවීම, ආදර්ශ ප්‍රශ්න සාකච්ඡා කිරීම හා පිළිතුරු ලියවීම වැනි ක්‍රියාකාරකම් සඳහා සිසුන් යොමු කරවීම සිදු කළ යුතු ය.

## 3.3.15 ප්‍රශ්න අංක 8 සහ අපේක්ෂිත පිළිතුර

**III කොටස**

**8. පහත සඳහන් ඕනෑම මාතෘකා දෙකක් පැහැදිලි කරන්න.**

**(i) ඉන්දියානු සංධීයවාදයේ ප්‍රධාන ලක්ෂණ**

**(ii) වර්තමාන ප්‍රංශ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ ජනාධිපතිවරයාගේ බලතල සහ කාර්යයන්**

**(iii) ඇමෙරිකානු මධ්‍යම ආණ්ඩුවේ බලතල**

**(i) ඉන්දියානු සංධීයවාදයේ ප්‍රධාන ලක්ෂණ**

ඉන්දියානු සංධීයවාදයේ ප්‍රධාන ලක්ෂණ ලෙස පහත සඳහන් ලක්ෂණ දැක්විය හැකි ය.

* අර්ධ සංධීය ක්‍රමයක් වීම

(සංධීයවාදයේ සහ ඒකීයවාදයේ සම්මිශ්‍රණයක් වීම)

* අසමමිතික ආකාරයෙන් බලය වෙන් කිරීම

(සංධීය ඒකක වලට එකම මට්ටමෙන් බලය සහ නිපුණතා මට්ටම් නොමැත)

* ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ උත්තරීතරභාවය

* ශේෂ බලතල මධ්‍යම ආණ්ඩුවට පැවරීම

* මධ්‍යගත සංධීයවාදය

* ඒකීය පුරවැසිභාවය

ඇමෙරිකා එක්සත් ජනපදය වැනි සම්භාව්‍ය සංධීය මාදිලි වල දක්නට ලැබෙන ඇතැම් අත්‍යවශ්‍ය සංධීය ලක්ෂණ ඉන්දීය සංධීයක්‍රමය තුලින් දැකිය නොහැකි ය.

ඉන්දියානු සංධීය ක්‍රමයෙහි ඉහතින් ලැයිස්තු ගතකර ඇති ලක්ෂණ හැරුණු විට අපේක්ෂකයාට අමතර විශේෂ කරුණු ද මෙම පිළිතුරට සැපයිය හැකි ය. ඒවායේ අදාලත්වය සහ යෝග්‍යතාව සැළකිල්ලට ගනිමින් ලකුණු ප්‍රදානය කිරීමට සැළකිලිමත් වන්න.

### (ii). වර්තමාන ප්‍රංශ ව්‍යවස්ථාව යටතේ ජනාධිපතිවරයාගේ බලතල සහ කාර්යයන්

ප්‍රංශ ජනාධිපති ධූරය එම ආණ්ඩුක්‍රමය තුල ඇති ආණ්ඩු ආයතන අතුරින් අද්විතීය මෙන්ම බලවත් ආණ්ඩු ආයතනය ලෙසින් සලකනු ලැබේ. සැබැවින් ම එය ප්‍රජාතන්ත්‍රවාදී ලෝකය තුල ද ඇති වඩාත්ම බලගතු ආණ්ඩු ආයතනය ලෙෂ සැළකේ.

ප්‍රංශ ජනාධිපතිවරයා තෝරා පත්කර ගනු ලබන්නේ වසර පහක නිළ කාලයක් සඳහා ය. ජනාධිපතිවරයාට වාර දෙකකට වඩා එම ධූරයේ කටයුතු කල නොහැකි ය. ප්‍රංශ ජනාධිපතිවරයා විධායක, ව්‍යවස්ථාදායක, අධිකරණ, විදේශ කටයුතු, ජාතික ආරක්ෂාව යනාදී ක්ෂේත්‍රවල කැපී පෙනෙන බලතල හිමි කරගනී. ඔහු රාජ්‍යයේ මෙන්ම ආණ්ඩුවේ ද නායකයා ය. සැබැවින් ම අණ්ඩුවේ නායකත්වය දරන්නේ ඔහු විසිනි.

ජනාධිපතිවරයා අගමැතිවරයා පත් කරයි. අගමැතිවරයා සමග එක්ව ඔහු කැබිනට් මණ්ඩලයේ සියළු සාමාජිකයන් පත්කරයි ව්‍යවස්ථාවට අනුව යමින් අමාත්‍ය මණ්ඩලයේ මුලසුන ද හොබවයි. ජනාධිපතිවරයා සමග සසඳන විට එරට අගමැතිවරයා බොහෝ සෙයින් කළමනාකරුවෙකු ට සමාන ය.

ප්‍රංශ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් හදිසි අවස්ථා බලතල, ජනමතවිචාරණ කැඳවීමේ බලය, පාර්ලිමේන්තුව විසුරුවා හැරීමේ බලය, නව මැතිවරණයක් කැඳවීම වැනි බලතල පවරා තිබේ. ප්‍රංශය අරබයා ජාතික ප්‍රතිපත්ති න්‍යාය පත්‍රය සකස් කරන්නේ ද ජනාධිපතිවරයා ය. වරදකරුවන්ට සමාව ප්‍රදානය කරන්නේ ද ජනාධිපතිවරයා ය. අධිකරණය විසින් අපරාධනීය වැරදි සම්බන්ධයෙන් දෙනු ලබන දඩුවම් ලිහිල් කරන්නේ එම දඩුවම් අහෝසි කරන්නේ ද ජනාධිපති වරයා ය. ඉහළ අධිකරණ වලට විනිසුරුවන් පත් කිරීමේ බලය ද ඔහුට හිමි ය.

ප්‍රංශ ජනාධිපතිවරයා ජාත්‍යන්තර තලය තුල ප්‍රංශය නියෝජනය කරන අතර ජාත්‍යන්තර ගිවිසුම්වලට අත්සන් කිරීම ද උපාය මාර්ගික කටයුතුවලට සම්බන්ධ වීම ද සිදු කරයි. ප්‍රංශ සන්නද්ධ හමුදාවල නායකයා ලෙසින් ඔහුට අවශ්‍ය විටෙක විදේශ රටවලට හමුදා යැවීමට මෙන්ම න්‍යෂ්ටික බලතල භාවිතා කිරීම සම්බන්ධයෙන් නියෝග දීමට ද බලය තිබේ.

ප්‍රංශ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 16 වන වගන්තියෙන් ප්‍රංශ ජාතිය දැඩි තර්ජනයකට ලක්ව ඇති විටෙක සම්පූර්ණ විධායක බලය මෙහෙයවීම තම අතට ගැනීමට අවස්ථාව ජනාධිපතිවරයාට ප්‍රදානය කරයි.

ප්‍රංශය සිය සෙසු ප්‍රජාතන්ත්‍රවාදී සගයන් සමග සසඳන විට, එනම් ජර්මනිය, එක්සත් රාජධානිය පමණක් නොව ඇමෙරිකා එක්සත් ජනපදය වැනි සෙසු රාජ්‍යවල නායකයන් සමග සසඳන විට එම රටවල නායකයන්ට වඩා වැඩි බලතල ප්‍රංශ ජනාධිපතිවරයාට එරට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් ප්‍රදානය කර ඇත. ජනාධිපතිවරයාව සිය පස් අවුරුදු නිල කාලය තුල සිදු කරන කටයුතු සම්බන්ධයෙන් අපරාධනිය නඩු පැවරීමෙන් නිදහස් ය. ඇමෙරිකානු පන්නයේ දෝෂාභියෝග ක්‍රියාපටිපාටියක් තුලින් ප්‍රංශ ජනාධිපතිවරයා තුනතුරෙන් ඉවත් කිරීම දුෂ්කර ය.

**(iii) ඇමෙරිකානු මධ්‍යම ආණ්ඩුවේ බලතල**

ඇමෙරිකානු එක්සත් ජනපදයේ මධ්‍යම ආණ්ඩුවට එරට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් වර්ග තුනක බලතල පිරිනමා තිබේ.

1. මධ්‍යම ආණ්ඩුවේ ප්‍රකාශිත බලතල (expressed powers)

ව්‍යවස්ථා සම්පාදකයන් විසින් මෙම බලතල ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ පළමු වගන්ති තුන තුල සෘජුව දක්වා ඇත. උදාහරණ වශයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 1 වන වගන්තියේ 8 වන කොටසින් ආරක්ෂාව, මුදල්, තැපැල් යනාදි විශේෂ ක්ෂේත්‍රවලට අදාළව නීති සම්පාදනය කිරීමේ අයිතිය මධ්‍යම ආණ්ඩුවේ කොන්ග්‍රස් මණ්ඩලයට ලබා දී තිබේ.

2. මධ්‍යම ආණ්ඩුවේ ඇඟවුම් බලතල (implied powers)

එනම් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් පැහැදිලි ව දක්වා ඇති බලතල ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය බලතලයි. කොන්ග්‍රසයට නීති සම්පාදනය කලහැකි විශේෂිත ක්ෂේත්‍ර ලැයිස්තු ගත කර ඇති අතර, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 1 වන වගන්තියේ 8 වන කොටසෙහි සඳහන් කරන්නේ ප්‍රකාශිත බලතල ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය සහ යෝග්‍ය නීති සැකසීමට කොන්ග්‍රසයට අයිතිය ඇති බවයි.

3. මධ්‍යම ආණ්ඩුවට ආවේණික බලතල (inherent powers)


මේ යටතේ මධ්‍යම ආණ්ඩුවට ඇතැම් කාර්යයන් කිරීමට අයිතියක් තිබේ. කුමක් නිසාද යත් ඒවා ආණ්ඩුවක් ලෙස එහි භූමිකාවට අයත් වන බැවිනි. ඒවායන් වඩාත් වැදගත් වන්නේ විදේශ සම්බන්ධතා පවත්වා ගෙන යාමට ඇති බලය සහ සංක්‍රමණය පාලනය කිරීමට ඇති බලයයි.

### 3.3.16 ප්‍රශ්න අංක 8 සඳහා විශ්ලේෂණය

**ප්‍රස්තාරය 3.18**

ප්‍රශ්න අංක 8 සඳහා අපේක්ෂකයන් ලබාගත් ලකුණුවල ව්‍යාප්තිය

මෙම ප්‍රශ්නය සඳහා හිමි මුළු ලකුණු ප්‍රමාණය 20කි.




ඉන්;


ලකුණු 00– 05 ප්‍රාන්තරයේ 41.87%ක් ද,
ලකුණු 06– 10 ප්‍රාන්තරයේ 31.91%ක් ද,
ලකුණු 11 – 15 ප්‍රාන්තරයේ 19.51%ක් ද,
ලකුණු 16 – 20 ප්‍රාන්තරයේ 6.71%ක් ද,
වශයෙන් අපේක්ෂකයන් ලකුණු ලබා ඇත.

මෙම ප්‍රශ්නය පිළිතුරු සැපයීම සඳහා තෝරා ගත් අපේක්ෂකයන් අතුරෙන් 41.87%ක් ලකුණු 05ක් හෝ ඊට වඩා අඩුවෙන් ලබා ඇත.

**මූලාශ්‍රය :** RD/16/3/AL පත්‍රිකාවෙන් රැස්කළ පර්යේෂණ හා සංවර්ධන දත්ත, 2024, ශ්‍රී. ලං. වි. දෙ.

**ප්‍රස්තාරය 3.19**

ප්‍රශ්න අංක 8 සඳහා පහසුතා දර්ශකය




**මූලාශ්‍රය :** RD/16/4/AL පත්‍රිකාවෙන් රැස්කළ පර්යේෂණ හා සංවර්ධන දත්ත, 2024, ශ්‍රී. ලං. වි. දෙ.

මෙම ප්‍රශ්නය 13 ශ්‍රේණියේ ‘සමකාලීන ලෝකයේ පවත්නා විවිධ ආණ්ඩුක්‍රම මාදිලි පිළිබඳ තුලනාත්මක අවබෝධයකින් යුතු පුද්ගලයෙකු ලෙස ක්‍රියා කරයි’ යන 10 නිපුණතාව පිරික්සීම පදනම් කරගෙන සකස් කර ඇත. ඉන්දියාව, ප්‍රංශය, ඇමරිකා එක්සත් ජනපදය යන රටවල්වල ආණ්ඩුක්‍රම ආශ්‍රයෙන් සැකසුනු කොටස් තුනකින් සමන්විත ප්‍රශ්නයකි. අපේක්ෂකයන් තෝරා ගත් කොටස් දෙකක් සඳහා පමණක් පිළිතුරු සැපයිය යුතු ය. මෙම ප්‍රශ්නය පිළිතුරු සැපයීම සඳහා තෝරාගත් අපේක්ෂකයන් ප්‍රතිශතය 21%කි. තෝරාගැනීමේ ප්‍රතිශතය අඩු මට්ටමක පැවතීමට විවිධ ආණ්ඩුක්‍රම මාදිලි පිළිබඳ තුලනාත්මක අවබෝධය ප්‍රමාණාත්මක ලෙස අපේක්ෂකයන් සතුව නොතිබීම හේතු වන්නට ඇත. ලබා දී ඇති මාතෘකා තුන වෙන් වෙන් වශයෙන් සැලකීමේ දී සෑම මාතෘකාවක් සඳහාම පහසුතාව 45%කි.

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලියේ දී සංකල්ප රූප භාවිතය, ඉදිරිපත් කිරීම්, විවාද පැවැත්වීම, සංවාද මණ්ඩප, බුද්ධි කලම්බන සාකච්ඡා තුළින් ආණ්ඩුක්‍රම මාදිලි පිළිබඳ අවබෝධය යාවත්කාලීන කිරීම සිදුකළ හැක.

## 3.3.17 ප්‍රශ්න අංක 9 සහ අපේක්ෂිත පිළිතුර

**9. 2015 න් පසුව ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රතිපත්තියේ ප්‍රධාන ලක්ෂණ පැහැදිලි කරන්න.**

රටක විදේශ ප්‍රතිපත්තිය යනු එම රට බාහිර ලෝකය සමග ඇති සම්බන්ධතාවල ස්වභාවය ප්‍රකාශ කරන ප්‍රධාන අංගයකි. රටක පාලන තන්ත්‍රයේ ඇතිවන වෙනස්වීම් නිරන්තරයෙන් ම එහි විදේශ ප්‍රතිපත්තියේ ස්වභාවය කෙරෙහි බලපානු ලබයි. මේ ප්‍රශ්නයට පිළිතුරු දීමේ දී මෑත අවධිය තුල ශ්‍රී ලංකා විදේශ ප්‍රතිපත්තිය පිළිබඳ අපේක්ෂකයාගේ දැනුම සහ අවබෝධය ප්‍රදර්ශනය කිරීම අපේක්ෂා කෙරේ. විශේෂයෙන ම 2015 සිට 2019 දක්වා කාලය තුල ජාතික එක්සත් ආණ්ඩුවේ සහ 2019 සිට 2023 දක්වා කලය තුල ශ්‍රී ලංකා පොදු පෙරමුණු ආණ්ඩුවේ විදේශ ප්‍රතිපත්තිවල ඇතැම් පොදු සහ විශේෂිත ලක්ෂණ අපේක්ෂකයා හඳුනා ගෙන තිබීම අවශ්‍ය කෙරේ.

නිදහස් ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රතිපත්තිය පිළිබඳව සළකන විටල එය දිශානතිය සහ ප්‍රවේශයට අදාළව ඇතැම් කැපී පෙනෙන ලක්ෂණ ප්‍රදර්ශනය කර තිබේ.

බලයේ සිටි පාලන තන්ත්‍රයේ වර්ගය මත ඒවාට ආවේනික ගති ලක්ෂන එකනෙකට වෙනස් වුවද, සෙසු ලක්ෂන අතර මතවාදී (බටහිරට පක්ෂපාති, සමජවාදයට පක්ෂපාති නොබැඳි ප්‍රතිපතිපත්තිය) සහ භූගෝලීය (ආසියාතික) ලක්ෂණ ප්‍රමුඛ ය. උදාහරණ වශයෙන් එ.ජා.ප ආණ්ඩුව හඳුනාගනු ලැබුවේ බටහිරට ඇති පක්ෂපාතිත්වය සමග ය. මේ අතර ශ්‍රී.ල.නි.ප ය හඳුනාගන්නා ලද්දේ සමාජවාදී රටවලට ඇති පක්ෂපාතිත්වය සමග ය. එසේ වුවද මේ ආණ්ඩු නොබැඳි ප්‍රතිපත්තියට ඇති බැඳීම ප්‍රකට කලේ ය. මීට සමාන ලෙසින් මේ ආණ්ඩු දෙකම ඔවුන්ගේ විදේශ සම්බන්ධතා පවත්වා ගෙන යාමේ දී ආසියාතික අනන්‍යතාවය ප්‍රකට කලේ ය.

කෙසේ වුව ද, 2015 සිට 2023 දක්වා කාලය තුල ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රතිපත්තයට අදාලව පාලන තන්ත්‍රවල අරමුණු සහ ඒවායෙහි විදේශ ප්‍රතිපත්ති ප්‍රවේශ වල ඇතැම් පොදු සහ සුවිශේෂ ලක්ෂන දැකිය හැකිව තිබිණි. මහින්ද රාජපක්ෂ ආණ්ඩුවේ ආසියාතික කේන්ද්‍රීය සහ අලංකාරෝක්ති නොබැඳි ප්‍රතිපත්තිය මෙන් නොව එක්සත් ජාතික ආණ්ඩුව (2015-2019) මතවාදය සහ ආසියාතික අනන්‍යතාවය බැහැර කරමින් ඒ වෙනුවට එහි විදේශ ප්‍රතිපත්තිය මෙහෙයවීම ප්‍රයෝගිකත්වයට නැඹුරු කළේ ය. එනම් සියල්ලම සමග ම මිත්‍රව කටයුතු කලේ ය. ඒ අනුව, මහින්ද රාජපක්ෂ පාලන තන්ත්‍රය චීනය සහ ඉංදියාව සම්බන්ධයෙන් ගෙන ගිය අසමතුලිත ප්‍රතිපතිපත්ය හේතුවෙන් පළුදු වූ සම්බන්ධතා නැවත සමතුලිත කිරීමට එක්සත් ජාතික ආණ්ඩුව උත්සුක විය. උදාහරණ වශයෙන් හම්බන්තොට වරාය චීනයට බදු ක්‍රියාකල අතර ඉංදියාව සමග ETCA ගිවිසුම ඇතිකර ගැනීමට උත්සාහ කළේ ය.

එසේම ශ්‍රී ලංකාව ඉන්දියානු සාගරවෙළඳ, ව්‍යාපාර සහ සැපයුම් කේන්ද්‍රස්ථානයක් බවට පත් කිරීම සඳහා මහින්ද රාජපක්ෂ පාලන තන්ත්‍රය ගත් යැපුම් ප්‍රවේශයට වෙනස් ව එක්සත් ජාතික ආණ්ඩුව ආර්ථික රාජ්‍යතාන්ත්‍රික ප්‍රවේශයක් ඉදිරිපත් කළේ ය. මෙම නව ප්‍රවේහයේ ඉලක්කය වූයේ කලාපීය සහ ගෝලීය

බලවතුන් සමග නැවත සම්බන්ධ වීමත් මහින් රාජපක්ෂ පාලනය නොතකා හැර තිබූ ශ්‍රී ලංකාවේ සම්ප්‍රදායික සංවර්ධන හවුල්කරුවන් සමග ආර්තික වශයෙන් සම්බන්ධ වීම ය

පුළුල් පරාසයක ජත්‍යන්තර හවුල්කරුවන් සමග සම්බන්ධවීමේ කොටසක් ලෙෂ එක්සත් ජාතික ආණ්ඩු ආණ්ඩුව රටේ පශ්චාත් ගැටුම් වලට ගැටළු විසඳීම සඳහා අවශ්‍ය කැප කිරිම් කිරිමට කැමැත්තෙන් ම බාර ග්තතේ ය. උදාහරණ වශයෙන් යුරෝපා සංගමය සමග සමීප සම්බන්ධතාවයක් ඇති කරගත් අතර ජී.එස්. පී. පල්ස් කෝටා නැවත ලබා ගැනීමට ක්‍රියා කළේ ය. පෙර පැවැති මහින්ද පාලන තන්ත්‍රය මෙන් නොව එක්සත් ජාතික ආණ්ඩුව UNHRC ඇතුළුව එක්සත් ජාතින්ගේ සංවිධානය සමග වඩා සමීප සහ මිත්‍රශිලි සම්බන්ධතාවයක් පවත්වා ගැනීමට ක්‍රියා කලේ ය.

ගෝඨාභය රාජපක්ෂගේ ශ්‍රීලංකා පොදු ජන පෙරමුණේ පාලන තන්ත්‍රය

* චීනය සහ ඉන්දියාව සමග සම්බන්ධතාවලට විශේෂ ස්ථානයක් හිමි විය.

* ගොඨාභය පාලන තන්ත්‍රය චීනය සහ ඉන්දියාව සමග සම්බන්ධතා ශක්තිමත් කිරීමට වැඩි අවධාරණයක් දෙනු ලැබිණි. මේ පාලනය සමාන දුරස්ථ විදේශ ප්‍රතිපත්තියක් පවත්වා ගැනීමට උත්සාහ කිරිම මගින් ආසියානු බලාගාර දෙක අතර මධ්‍යස්ථව සිටීමට ක්‍රියා කලේ ය.

ආසියාතික රටවල් සමග ආර්තික සහ වෙළඳ සම්බන්ධතා තර කරගත් අතර SAARC සහ BIMSTEC රටවල් සමග ශක්තිමත් සම්බන්ධතා වර්ධනය කරගත්තේ ය. මේ අරමුණෙන් කලාපීය සහයෝගිතාව සඳහා වූ රාජ්‍ය අමාත්‍ය ධූරයක් ඇති කළේය.

බටහිර සහ බටහිර ආධිපත්‍යයෙන් යුත් බහුපාර්ශ්වීය බැඳීම් වලින් දුරස් විය.

ශ්‍රී ලංකාවේ බටහිර සහ ජපානයේ සම්ප්‍රදායික සංවර්ධන හවුල්කරුවන් සමග සීමිත සම්බන්ධතාවයක් පවත්වා ගත්තේ ය. උදාහරණ වශයෙන් LRT සහ ECT ව්‍යාපෘති අවලංගු කිරිම, UNHRC වැනි ලිබරල් අරමුණු වලින් ඉවත්වීම, ඇමෙරිකා එක්සත් ජනපදයේ MCC ණය වලින් ඉවත් වීම

කෙසේ වෙතත් එක් අවස්ථාවක දී චීනය සහ ඉංදියාව දෙසට වූ ශ්‍රී ලංකාවේ සමබර විදේශ ප්‍රතිපත්තිය පිරිහෙන්නට විය

උදාහරණ වශයෙන් 1. ඇමෙරිකානු ඩොලර් මිලියන 12ක් ප්‍රදානය කිරීමට කැබිනට් මණ්ඩලය තීන්දු කිරිම 2. 2021 දී චීනයට පුනර්ජනනීය බලශක්ති හවුල් ව්‍යාපෘතියක් ප්‍රදානය කිරීම, 3. 2021 දී චීනය සමග බිලියන 1.5 ක මුදල් හුවමාරු ගණුදෙනුව

මේ සියල්ල සිදුවූයේ චීන හම්බන්තොට වරයේ 99 වසරක බදු ගිවිසුම නැවත සළකා බලන බවට ආණ්ඩුවේ කලින් ස්ථාවරය තිබියදීත් ය.

ආර්ථික අර්බුදය ගෝඨාභය රාජපක්ෂ පාලන තන්ත්‍රයේ විදේශ ප්‍රතිපත්තිය චීනය දෙසට මාරුවීමෙන් ඉවතට හරවා ශ්‍රී ලංකාව ඉන්දියාවේ කක්ෂය දෙසට ගෙන ආවේ ය.

රනිල් වික්‍රමසිංහ ශ්‍රී ලංකා පොදු පෙරමුණු ආණ්ඩුව අතර කාලය

* රනිල් වික්‍රමසිංහගේ නායකත්වයෙන් යුත් පොදු පෙරමුණු ආණ්ඩුවේ විදේශ සම්බන්ධතා වලට කැපී පෙනෙන ආකාරයෙන් බලපෑම් ඇති වූයේ 2022 වසරේ ජාතික ආර්ථික අර්බුදයෙන් මිදීමේ උත්සාහයයි.

රනිල් වික්‍රමසිංහගේ පාලනතන්ත්‍රයේ ආර්ථික ප්‍රමුඛතාවය අනෙකුත් සියල්ලටම වඩා ඉහළින් ආර්ථිකයට නැඹුරු වූ විදේශ ප්‍රතිපත්තියක් අනුගමනය කිරීමට හේතු විය. අර්බුදය තුල ජාත්‍යන්තර සහාය උපරිම වශයෙන් ලබා ගනිමින් ආර්ථික අර්බුදයෙන් ගොඩ ඒම අරබයා මෙම පාලන තන්ත්‍රය බාහිර බලවතුන් සමග බහු පාර්ශ්වීය විදේශ ප්‍රතිපත්තියක් අනුගමනය කිරීමට උත්සාහ කළේ ය.

චීනය සහ ඉංදියාව සහ සෙසු රටවල් සමග නිදහස් වෙළඳ ගිවිසුම් සම්බන්ධයෙන් නැවත සාකච්ඡා ආරම්භ කිරීමට ශ්‍රී ලංකාව ක්‍රියා කළේ ය.

මීට අමතරව දේශගුණික විපර්යාවල බලපෑම් වලට එරෙහිව සටන් කිරීම වැනි ඇතැම් ගෝලීය අර්බුද ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රතිපත්තියේ ප්‍රධාන අංග බවට පත්ව තිබුණි.

අවසාන වශයෙන් 2015 න් පසු ශ්‍රී ලංකාවේ විදේශ පතිපත්තියේ ප්‍රධාන ලක්ෂණ අතර මතවාදී සහ භූගෝලීය අනන්‍යතාවය සහිත සම්ප්‍රදායික දිශානතිය මගහැරීම කැපී පෙනෙන ලක්ෂණයකි. තවත් ප්‍රධාන ලක්ෂණයක් වූයේ මේ කාලය තුල පැවැති පාලන තන්ත්‍රතුන යටතේ චීනය සහ ඉංදියාව සමග ශක්තිමත් මෙන්ම සමබර සම්බන්ධතා පවත්වා ගැනීමට ශ්‍රී ලංකාව උත්සාහ කිරීම ය.

ශ්‍රී ලංකාව මුහුණ දෙන ආර්ථික අවශ්‍යතානවයන් ජය ගැනීම සඳහා කලාපීය සහ ගෝලීය බලවතුන්ස මග සමග සම්බන්ධ වීමේ උපාය මාර්ගයක් ලෙස ආර්ථික රාජ්‍ය තාන්ත්‍රිකභාවය දෘඩ ලෙෂ යොදා ගන්නා ලදී.


සාරාංශයක් ලෙෂ, 2015 - 2023 අතර කාලය තුල කැපී පෙනෙන ලක්ෂණ ලෙස පෙන්නුම් කරන්නේ ශ්‍රී ලංකාවට ස්ථාවර විදේශ ප්‍රතිපත්තියක් නොමැති බවත් එය පාලන තන්ත්‍රයේ ආර්ථික අවශ්‍යතා සහ දේශපාලන මනාපයන් සහ පීඩනයන් මත වෙනස් වූ බවත් ය.

### 3.3.18 ප්‍රශ්න අංක 9 සඳහා විශ්ලේෂණය

**ප්‍රස්තාරය 3.20**

ප්‍රශ්න අංක 9 සඳහා අපේක්ෂකයන් ලබාගත් ලකුණුවල ව්‍යාප්තිය

මෙම ප්‍රශ්නය සඳහා හිමි මුළු ලකුණු ප්‍රමාණය 20කි.




ඉන්;

ලකුණු 00– 05ප්‍රාන්තරයේ 58.94%ක් ද,

ලකුණු 06– 10ප්‍රාන්තරයේ 22.08%ක් ද,

ලකුණු 11 – 15ප්‍රාන්තරයේ 11.92%ක් ද,

ලකුණු 16 – 20 ප්‍රාන්තරයේ 7.06%ක් ද,


වශයෙන් අපේක්ෂකයන් ලකුණු ලබා ඇත.

මෙම ප්‍රශ්නය පිළිතුරු සැපයීම සඳහා තෝරා ගත් අපේක්ෂකයන් අතුරෙන් 58.94%ක් ලකුණු 05ක් හෝ ඊට වඩා අඩුවෙන් ලබා ඇත. ප්‍රශ්නයට හිමි මුළු ලකුණු සංඛ්‍යාවෙන් අඩක් හෝ ඊට අඩුවෙන් ලබාගත් ප්‍රතිශතය 81.02%ක් වැනි ඉහළ ප්‍රමාණයකි.

**මූලාශ්‍රය :** RD/16/3/AL පත්‍රිකාවෙන් රැස්කළ පර්යේෂණ හා සංවර්ධන දත්ත, 2024, ශ්‍රී. ලං. වි. දෙ.

**ප්‍රස්තාරය** 3.21

ප්‍රශ්න අංක 9 සඳහා පහසුතා දර්ශකය




මූලාශ්‍රය : RD/16/4/AL පත්‍රිකාවෙන් රැස්කළ පර්යේෂණ හා සංවර්ධන දත්ත, 2024, ශ්‍රී. ලං. වි. දෙ.

මෙම ප්‍රශ්නය 13 ශ්‍රේණියේ 'බාහිර ලෝකය සමඟ ශ්‍රී ලංකාව පවත්වන සම්බන්ධතාවල ස්වභාවය සහ ඵල විපාක පිළිබඳ අවබෝධයෙන් අදහස් දක්වයි' යන 15 නිපුණතාව මත පදනම්ව සකසා ඇත. මෙම ප්‍රශ්නයෙන් 2015න් පසු ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රතිපත්තිවල ප්‍රධාන ලක්ෂණ පිළිබඳ අපේක්ෂකයන්ගේ දැනුම පරීක්ෂා කර ඇත. මෙම ප්‍රශ්නය පිළිතුරු සැපයීම සඳහා තෝරාගත් අපේක්ෂකයන් ප්‍රතිශතය 10%කි. තෝරාගැනීමේ ප්‍රතිශතය අඩු මට්ටමක පැවතීමට න්‍යායාත්මක කරුණුවලින් ඔබ්බට ගොස් ප්‍රායෝගික හා විචාරශීලී කරුණු විමසීම හේතු වී තිබිය හැකි ය. ප්‍රශ්නයෙහි පහසුතාව 32%කි. අපේක්ෂකයන් සතු ප්‍රායෝගික හා කාලීන දේශපාලන දැනුම අඩු මට්ටමක පැවතීම අඩු පහසුතාවට හේතු වී තිබිය හැකි ය. එසේම විෂය නිර්දේශයේ අවසාන නිපුණතාව කෙරෙහි අපේක්ෂකයන් දක්වන අඩු අවධානය ද තෝරාගැනීම හා පහසුතාව අඩු වීමට හේතු වී තිබිය හැකි ය.

කාලීන හා ප්‍රායෝගික දේශපාලන කරුණු තේමා කොට සම්මන්ත්‍රණ, වැඩමුළු, විවාද, සාකච්ඡා ආදිය සම්පත් පුද්ගලයන්ගේ සහාය ලබාගෙන සංවිධානය කිරීමෙන් ඉහත දුර්වලතා මඟහරවා ගෙන සිසුන්ගේ අවබෝධය හා දැනුම පුළුල් කළ හැකි ය.

## 3.3.19 ප්‍රශ්න අංක 10 සහ අපේක්ෂිත පිළිතුර

**10. පහත සඳහන් ඕනෑම මාතෘකා දෙකක් පිළිබඳව කෙටි සටහනක් ලියන්න**

**(i) රාජ්‍ය අභ්‍යන්තර ගැටුම්වලට හේතු**

**(ii) රාජ්‍ය ප්‍රතිපත්ති සහ නිලබලතන්ත්‍රය අතර සම්බන්ධතාව**

**(iii) ශ්‍රී ලංකාවේ දේශපාලන පක්ෂ ක්‍රමයේ වර්තමාන ප්‍රවණතා**

**(iv) ශ්‍රී ලංකාවේ සමානුපාතික නියෝජන ක්‍රමය පිළිබඳව ඇති විවේචන**

**(v) ජාත්‍යන්තර දේශපාලනය තුළ රාජ්‍ය නොවන ක්‍රියාධරයන්ගේ කාර්යභාරය**

**(i) රාජ්‍ය අභ්‍යන්තර ගැටුම්වලට හේතු**

ගැටුම් පිළිබඳ දේශපාලන වර්ගීකරණයට අනුව, අන්තර් රාජ්‍ය ගැටුම්, රාජ්‍ය අභ්‍යන්තර ගැටුම් සහ රාජ්‍ය නිර්මාණ ගැටුම් යන ආකාර තුනට ගැටුම් වර්ග කළ හැකි ය. රාජ්‍ය අභ්‍යන්තර ගැටුම් යනු රාජ්‍යයන් තුල සිදුවන ගැටුම් ය.

රාජ්‍ය අභ්‍යන්තර ගැටුම් පහත සඳහන් හේතු නිසා සිදුවේ.

1. ව්‍යූහාත්මක හේතු

අ. බහුවාර්ගික සමාජයක් තුල ජාතික එක්සත්කම සහ අනුකලනය අත්කර ගැනීමට රාජ්‍යයේ නොහැකියාව හෝ අසමත්කම

ආ. බහු-වාර්ගික, බහු ආගමික සහ සංස්කෘතික සමාජයන් තුල වාර්ගික හෝ සමාජ කණ්ඩායම්වල දුක්ගැනවිලි වලට ආමන්ත්‍රණය කිරීමේ අසමත්කම

11. සමාජ-ආර්ථික හේතු

අ. සමාජ කණ්ඩායම් සහ ප්‍රජාවන් අත්විඳින නිරන්තර සමාජ- ආර්ථික අසමානතා

ආ. සමාජ ආර්ථික ක්ෂේත්‍රය තුල සමාජ කණ්ඩායම් සහ ප්‍රජාවන් අඛණ්ඩ ලෙසින් වෙනස්කොට සැළකීම සහ ආන්තිකරණයට ලක්වීම

ඇ. වාර්ගික හෝ සමාජ කණ්ඩායම්වල දුක්ගැනිවිලි පිළිබඳ ආණ්ඩුවේ අඛණ්ඩ නොදනුවත්කම

111. දේශපාලන හේතු

අ. සමාජ කණ්ඩායම් සහ ප්‍රජාවන් බැහැර කරන හෝ කොන්කරන වෙනස් කොට සැළකීමේ රාජ්‍ය ආයතන පැවතීම

ආ. බහිස්කාරක දේශපාලන මතවාද

ඇ. එකිනෙකට වෙනස් සමාජ කණ්ඩායම් සහ වාර්ගික කණ්ඩායම් අතර තියුණු දේශපාලන තරගය සහ ප්‍රතිවිරෝධතා

ඈ. ආර්ථික, සමාජ සහ දේශපාලන අර්බුද අවස්ථාවල දී ගැටුම් තියුණු වන පරිදි ඒවා භාවිතා කරන ප්‍රභූ දේශපාලනය

1v. ආර්ථික හේතු

අ. බහු වාර්ගික සමාජවල සුළුතර වාර්ගික කණ්ඩායම්වල භාෂාමය, ආගමික, සංස්කෘතික හිමිකම් වලට හා අනන්‍යතාවලට පිළිගැනීමක් නොලැබීම

ආ. අන්‍යොන්‍ය ලෙසින් බහිස්කාරක වූ වාර්ගික මතවාද

කෙටියෙන් ප්‍රකාශ කරන්නේ නම් රාජ්‍ය අභ්‍යන්තර ගැටුම්වලට යටින් පවතින පොදු හේතුව වනුයේ දේශපාලන බලයයි.

**(ii) රාජ්‍ය ප්‍රතිපත්ති සහ නිලබලතන්ත්‍රය අතර සම්බන්ධතාව**

නිලබලතන්ත්‍රය යන පදයෙන් අදහස් වන්නේ නිලධාරීන් විසින් කරන පාලනය යන්නයි. එහි පලල් අර්ථයට අනුව නිළබලතන්ත්‍රය යනු ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීමේ කාර්ය පැවරී ඇති නිලධාරි පන්තියයි. නිලබලතන්ත්‍රය සමන්විත වන්නේ ආණ්ඩුවේ විධායක අංශයේ ස්ථිර කොටසෙනි.

එහි කැපීපෙනෙන ලක්ෂණය වන්නේ දේශපාලන අපක්ෂපාතිත්වය, ධූර කාලයේ ස්ථිරභාවය සහ වෘත්තීමය පුහුණුවයි. එය විසින් රාජ්‍යයේ පරිපාලනය ක්‍රියාවට නංවන්නේ දේශපාලන විධායකය විසින් තීරණය කරනු ලබන ප්‍රතිපත්ති සහ රෙගුලාසි වලට අනුවයි. එය ක්‍රියාත්මක වන්නේ දේශපාලන විධායකයේ නායකත්වය, මෙහෙයවීම සහ පාලනය යටතේ ය. නිළධරයන් ආණ්ඩුවේ ප්‍රතිපත්ති ක්‍රියාවට නගයි.

රාජ්‍ය ප්‍රතිපත්ති යනු ආණ්ඩුවේ ප්‍රකාශිත අරමුණු සාක්ෂාත් කරගැනීම අරබයා යොමු වූ ආණ්ඩුවේ ක්‍රියාකාරකම් ය. ප්‍රතිපත්ති ක්‍රියාවලියේ තීරණාත්මක අංගය වන්නේ ඒවා ක්‍රියාත්මක කිරීමයි. මේ නිසා නිලබලතන්ත්‍රය ඉතා තීරණාත්මක වේ. ආණ්ඩුවේ ප්‍රතිපත්තිමය ඉලක්ක ක්‍රියාවට නැංවීම සහතික කිරීම ඵලදායි නිළබලතන්ත්‍රයන්ගෙන් අපේක්ෂා කරයි. මැක්ස් වෙබර්ට අනුව නිලබලතන්ත්‍රය යනු සමාජය විසින් නිර්මාණය කරන ලද මානව සංවිධානයේ වඩාත් දියුණු ආකාරයයි. සාමූහික කාර්යයන් ඉටු කිරීම සඳහා වඩාත් එය වඩාත් තාර්කික මාධ්‍යයක් වෙයි. විශේෂයෙන් ඒ සඳහා මහා පරිමාණයේ සංවිධානයක් අවශ්‍ය වේ.

නිලබලතන්ත්‍රය රාජ්‍යයේ ස්ථිර අංශයකි. එයට රාජ්‍ය ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීම සඳහා විශේෂඥතාවය, පළපුරුද්ද සහ සුදුසුකම් සහිත නිළධාරීන් අවශ්‍ය වේ. නූතන ප්‍රජාතන්ත්‍රවාදී රටවල, නිලබලතන්ත්‍රය සාක්ෂි, තොරතුරු, සංඛ්‍යා ලේඛන, තාක්ෂණික සහාය යනාදී ලබා දීම මගින් ප්‍රතිපත්ති සම්පාදන ක්‍රියාවලිය තුල වැදගත් භූමිකාවක් ද ඉටු කරයි.

වෙබර් ප්‍රකාශ කළ පරිදි නිලබලතන්ත්‍රයට සිය නිළධාරීන්ගේ කටයුතු කරගෙන යාමේ දී පහත ගුණාංග තිබිය යුතුය.

* සංවිධානය තුල ශ්‍රම විභජනය
* වෘත්තිමය විශේෂීකරණය
* රීති සහ රෙගුලාසි සම්මත මෙහෙයුම් ක්‍රියා පටිපාටිය අනුගමනය කිරීම
* පවරන ලද කාර්යයන් සිදු කිරීමට අවශ්‍ය නිපුණතාව
* තීරණ ගැනීමේ දී සහ ඒවා ක්‍රියාත්මක කිරීමේ දී අපුද්ගලභාවය
* විධිමත් ලිඛිත වාර්තා තබා ගැනීම
* ඉහළ මට්ටමේ සිට පහළ මට්ටමේ නිලධාරීන් දක්වා බලය බෙදා හරින නිළ ධූරාවලියක් සංවිධානය කිරීම
* නිලබල පද්ධතිය දේශපාලන අධිකාරියට පක්ෂපාති වන අතරම දේශපාලනමය වශයෙන් මධ්‍යස්ථ වේ.

### (iii) ශ්‍රී ලංකා දේශපාලන පක්ෂ ක්‍රමයේ වර්තමාන ප්‍රවනතා

* ශ්‍රී ලංකා පක්ෂ ක්‍රමයේ දැකිය හැකි වැදගත්ම ප්‍රවනතාවය නම් සභාග ආකෘති දෙකක් මත පදනම් වූ පක්ෂ ක්‍රමය පරිහානියට පත්වීම ය. එනම් ප්‍රධාන සංධාන දෙක කැඩී යාම
* පක්ෂ ක්‍රමය අස්ථාවර වීම සහ වෙනස් වීම
* කුඩා පක්ෂ වැඩි වැඩියෙන් බිහිවීම
* සංධාන මගින් දේශපාලන පක්ෂ විස්ථාපනය කිරීම
* පක්ෂ ක්‍රමය තුල පක්ෂ ලැදියාවන් තීරණය කිරීමේ දී මතවාදී ස්ථාවරයන් තවදුරටත් බලගතු සාධකයක් නොවීම
* පක්ෂ වලට පෙළගැසීම් මූලික වශයෙන් දේශපාලන අවස්ථාවාදය විසින් මෙහෙයවනු ලැබීම
* පක්ෂ ලැදියාවන්ගේ බිඳ වැටීම බිම් මට්ටමේ මැතිවරණ දේශපාලනය දක්වා විනිවිද යාම
* වාර්ගික සහ ආගමික දේශපාලන පක්ෂවල මැතිවරණ ශක්තිය හීන වීම

### (iv) ශ්‍රී ලංකාවේ සමානුපාතික නියෝජන ක්‍රමය පිළිබඳව ඇති විවේචන

ඇතැම් හඳුනාගත් ප්‍රසංශා සමග ශ්‍රී ලංකාවේ සමානුපාතික නියෝජන ක්‍රමයට එරෙහිව විවේචන කිහිපයක් ද තිබේ. එම විවේචන වලින් කිහිපයක් පහත දැක්වේ.

* ජනගහනය මෙන් ම භූමිය අතින් ගත් විට ද මැතිවරණ දිස්ත්‍රික්ක ඉතා විශාල ය. එහි ප්‍රතිඵලයක් ලෙසින් ඡන්දදායකයා සහ නියෝජිතයා අතර සම්බන්ධතාවය දුරස් ය.
* අනෙකුත් කරුණු අතර මැතිවරණ දිස්ත්‍රික්ක විශාල වීම හේතුවෙන් මෙම ක්‍රමය සෑම ඡන්ද අපේක්ෂකයෙකු සඳහාම සම මට්ටමේ තරග බිමක් ඇති කරන්නේ නැත.
* අතුරු මැතිවරණ නොපැවැත් වීම හේතුවෙන් ජනතාවගෙන් ප්‍රතිපෝෂණය ලබා ගැනීමේ ඇති වැදගත්කම මෙම ක්‍රමයෙන් ගිලිහී ගොස් ඇත.
* ඡන්ද කොට්ඨාශයෙන් වැඩිම ඡන්ද ප්‍රමාණයක් ලබාගත් පක්ෂයට ප්‍රසාද ආසනයක් ලබා දීම හේතුවෙන් එම පක්ෂයේ ආසන්නතම ප්‍රතිවාදියාට එරෙහිව ප්‍රධාන පක්ෂය ශක්තිමත් කරයි. මෙය සුළු පක්ෂවලට ද අවාසි ඇති කරයි. සැබැවින්ම සමානුපාතතික මූලධර්මය උල්ලංඝණය කරයි.
* ජාතික ලැයිස්තු මන්ත්‍රී ධූරවලට 15% කට ආසන්න මන්ත්‍රී ධූර සංඛ්‍යාවක් වෙන් කෙරෙන අතර මහජනතාවගේ ඍජුව ඡන්ද නොලබන මෙතරම් ප්‍රතිශතයක් සිටීම ප්‍රශ්න කිරීමට හේතුවේ.
* මැතිවරණ ප්‍රචණ්ඩ ක්‍රියා සමානුපාතික නියෝජන ක්‍රමයේ ඍජු ප්‍රතිඵලයක් නොවූ වද එය ඉතා විශාල ප්‍රමාණයකට මනාප ක්‍රමය සමග සම්බන්ධ වේ.

**(v) ජාත්‍යන්තර දේශපාලනය තුළ රාජ්‍ය නොවන ක්‍රියාධරයන්ගේ කාර්යභාරය**

**සමකාලීන ජාත්‍යන්තර දේශපාලනය තුල රාජ්‍ය නොවන ක්‍රියාධරයන්**

1. තනි පුද්ගලයන් එනම් දේශපාලන සහ ආගමික නායකයන්, 2. අවිධිමත් කණ්ඩායම් එනම් සමාජ ව්‍යාපාර සහ තස්ත්‍රවාදී කණ්ඩායම් 3. සංවිධාන එනම් රාජ්‍ය නොවන සංවිධාන සහ බහු ජාතික සංවිධාන වැනි ක්‍රියාධරයන් ඉතා වේගයෙන් ප්‍රමුඛත්වයට පත් ව තිබේ. කුමක් නිසාද යත් ජාතික රාජ්‍යවල සීමාවෙන් ඔබ්බට ගොස් ආර්ථික, දේශපාලන සහ සමාජ ගතිකත්වයට බලපෑම් කිරීමට ඒවාට ඇති හැකියාව නිසයි.

**රාජ්‍ය නොවන ක්‍රියාධරයන්ගේ භූමිකාව**

**බලය සහ වෙනසේ ක්‍රියාධරයන්**

රාජ්‍ය නොවන ක්‍රියාධරයන් විසින් ගෝලීය ප්‍රතිපත්ති සහ මහජන මතය හැඩගස්වන්නේ හැඩගස්වන්නේ රාජ්‍යයන්ගේ විදේශ ප්‍රතිපත්ති වලට ප්‍රශංසා කිරිරීමෙන් හෝ ඒවාට අභියෝග කිරිම යන දෙකෙන් එකකිනි. උදාහරණ වශයෙන් Micosoft රාජ්‍යයන්ගේ ආර්ථික සහ තාක්ෂණික ප්‍රතිපත්ති වලට බලපෑම් කරයි.

එමෙන්ම බහුජාතික සංවිධාන සහ බහු ජාතික සමාගම් ආර්ථික ප්‍රතිපත්ති සහ නවොත්පාදන මෙහෙයවයි. එමගින් කැපී පෙනෙන ලෙසින් ගෝලීය වෙළඳපලට සහ රැකියා නැම්යාවන්ට බලපෑම් කරයි.

**ජාත්‍යන්තර සහයෝගය වැඩි දියුණු කරන්නා**

රාජ්‍ය නොවන සංවිධාන ජාත්‍යන්තර සහයෝගිතාවයේ ප්‍රධාන අනුපූරක කාර්යයක් ඉටු කරන අතර ජාත්‍යන්තර තස්ත්‍රවාදී කණ්ඩායම් වැනි ඇතැම් අවිධිමත් රාජ්‍ය නොවන ක්‍රියාධරයන් ගේ ක්‍රියාකාරකම් ආරක්ෂිත ලෝකයක් සඳහා සාමූහික ක්‍රියාකාරකම් වල නිරත වේ. උදාහරණ වශයෙන් 9/11 සිදුවීමෙන් පසු රාජ්‍යයන් අතර සහායෝගිතාව

**ගෝලීය පොදු භාණ්ඩ සපයන්නන්**

ඇතැම් රාජ්‍ය නොවන සංවිධාන පරිසරය ආරක්ෂා කිරීමට කැපවීම හේතුවෙන් ක්‍රියාකාරී සහ බලපෑම් සහගත වේ. උදාහරණ වශයෙන් Green Peace Movement දැක්විය හැකි ය.

**මානුෂික ආධාර සපයන්නන්**

රාජ්‍ය නොවන සංවිධාන මානව හිමිකම් සහ මානුෂික ක්ෂේත්‍රවල ක්‍රියාකාරී වෙයි. විශේෂයෙන් රාජ්‍ය නොවන සංවිධාන විශේෂඥ උපදෙස් ලබා දෙන අතර මහජන මතය බලමුළු ගන්වයි. මේ ආකාරයෙන් ඒවාට අන්තර් රාජ්‍ය තීරණ සම්බන්ධයෙන් අදහස් දැක්විය හැකිය. මෙම සංවිධාන මානව හිමිකම් ක්ෂේත්‍රය තුල සම්මතයන් සහ ප්‍රමිතීන් සැකසීම සඳහා දායක වේ. උදාහරණ වශයෙන් ජාත්‍යන්තර ක්ෂමා සංවිධානය දැක්විය හැකි ය.

**ගෝලීය පාලනය තුල සහභාගිවන්නන්**

රාජ්‍ය නොවන ක්‍රියාධරයන්ගේ ක්‍රියා සහ මුල පිරීම් ගෝලීය පාලනයට විශාල වශයෙන් බලපායි. මෙය තනි ක්‍රියාධරයෙකුගේ සිට බහු ක්‍රියාධරයෙකු දක්වා ගෝලීය පාලනයේ ගති ස්වභාවය වෙනස් කොට තිබේ.

**මැදිහත්කරුගේ භූමිකාව**


රාජ්‍ය නොවන ක්‍රියාධරයන් ඇතැම් විට ගැටුම් නිරාකරණයට පවා සම්බන්ධ වේ. උදාහරණ වශයෙන් ජිමී කාටර්, ඩෙස්මන්ඩ් ටුටු වැනි පුද්ගල දේශපාලන සහ ආගමික නායකයන් දැක්විය හැකි ය.

### 3.3.20 ප්‍රශ්න අංක 10 සඳහා විශ්ලේෂණය

**ප්‍රස්තාරය 3.22**

ප්‍රශ්න අංක 10 සඳහා අපේක්ෂකයන් ලබාගත් ලකුණුවල ව්‍යාප්තිය

මෙම ප්‍රශ්නය සඳහා හිමි මුළු ලකුණු ප්‍රමාණය 20කි.




ඉන්;

ලකුණු 00 – 05 ප්‍රාන්තරයේ 45.85% ද,

ලකුණු 06 – 10 ප්‍රාන්තරයේ 25.56% ද,

ලකුණු 11 – 15 ප්‍රාන්තරයේ 20.47% ද,


ලකුණු 16 – 20 ප්‍රාන්තරයේ 8.12%ක් ද,

වශයෙන් අපේක්ෂකයන් ලකුණු ලබා ඇත. අපේක්ෂකයන්ගෙන් 45.85%ක් ලකුණු 5 ක් හෝ ඊට අඩුවෙන් ලබා ඇත.

මූලාශ්‍රය : RD/16/3/AL පත්‍රිකාවෙන් රැස්කළ පර්යේෂණ හා සංවර්ධන දත්ත, 2024, ශ්‍රී. ලං. වි. දෙ

**ප්‍රස්තාරය 3.23**

ප්‍රශ්න අංක 10 සඳහා පහසුතා දර්ශකය




මූලාශ්‍රය : RD/16/4/AL පත්‍රිකාවෙන් රැස්කළ පර්යේෂණ හා සංවර්ධන දත්ත, 2024, ශ්‍රී. ලං. වි. දෙ.

මෙම ප්‍රශ්නය සමස්ත විෂය නිර්දේශයේ නිපුණතා 05ක් ආවරණය වන ලෙස කෙටි සටහන් ලිවිය යුතු කොටස් 5කින් සමන්විත වේ. අපේක්ෂකයන් තෝරා ගත් කොටස් දෙකක් සඳහා පමණක් පිළිතුරු සැපයීම අපේක්ෂා කර ඇත. මෙම ප්‍රශ්නය පිළිතුරු සැපයීම සඳහා තෝරාගත් අපේක්ෂකයන් ප්‍රතිශතය 72%කි. තෝරාගැනීමේ ප්‍රතිශතය වැඩි මට්ටමක පැවතීමට කාල කළමනාකරණය පහසු වීම සහ කෙටි පිළිතුරු ලිවීමට හැකි වීම හේතු විය හැකි ය.

අනුකොටස් පහ සැලකීමේ දී ජාත්‍යන්තර දේශපාලනය තුළ රාජ්‍ය නොවන ක්‍රියාධරයන්ගේ කාර්යභාරය යන ප්‍රශ්නය සඳහා පහසුතාව වැඩිම අතර එහි පහසුතාව 55%කි. ශ්‍රී ලංකාවේ දේශපාලන පක්ෂ ක්‍රමයේ වර්තමාන ප්‍රවණතා යන මාතෘකාව සඳහා පහසුතාව අඩුම අතර එහි පහසුතාව 33%කි. ඇතැම් අපේක්ෂකයන් වර්තමාන ප්‍රවණතා පිළිබඳ අවධානය යොමු නොකොට සාම්ප්‍රදායික පක්ෂ ක්‍රමය පමණක් පැහැදිලි කර ඇත. කෙටි සටහන් සඳහා අඩු කාලයකින් වඩාත් කෙටි පිළිතුරක් ලිවීමත්, අපේක්ෂිත කරුණු සාරාංශ කර ඉදිරිපත් කිරීමට නොහැකි වීමත් අඩු සාධනයට හේතු වී තිබිය හැකි ය.

ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය තුළ කෙටි සටහන් සඳහා පිළිතුරු ලිවිය යුතු ආකාරය පිළිබඳව සිසුන්ට ප්‍රායෝගිකව අවබෝධයක් ලබා දිය යුතු ය. ඒ සඳහා මාසික හා වාර පරීක්ෂණවලදී පිළිතුරු සැපයීම සඳහා කෙටි සටහන් සහිත ප්‍රශ්න ලබා දීමට කටයුතු කළ යුතු ය. එසේම ආදර්ශ පිළිතුරු ලබා දී එවැනි පිළිතුරක ප්‍රාමාණික හා ගුණාත්මක බව තක්සේරු කිරීම තුළින් ඉගෙනුම් ඉගැන්වීම් ක්‍රියාවලිය සංවර්ධනය කර ගත හැකි ය.